©

මෙම කෘතිය කතුවරයාගේ පූර්ණ අනුමැති සහිතව
sinhalaebooks.com වෙබ් අඩවිය විසින්
පාඨකයන්ගේ කියවීම උදෙසා නොමිලේ බෙදාහරින ලද කෘතියකි.

Published with Author Consent.

# 01.

අනුජ් පාසල නිමවී නිවසට ආවේ වෙනදා මෙන් සැහැල්ලුවෙන් නොවේ. පුරුදු පරිදිම සරසි ඔහු එන තුරු ආලින්දයේ මඟ බලා උන්නාය. වෙනදා සරසිව දකිද්දී ඔහු පාන සිනහව අද නැත.

"තාත්තා..."

අනුජ්ගේ හඬින් සරසි තිගැස්සුණාය. ඔහු තමාව නොදුටු ලෙසින් තාත්තාව සොයන්නේ ඇයි?

"පුතා... ඇයි මේ?"

"තාත්තා..."

සරසිගේ වදන් නෑසුණාසේ තවත් හඬින් ඔහු තාත්තාව අමතමින් ගෙතුළට පා තැබුවේය.

"තාත්තා නිදි පුතා.."

"කමක් නෑ... නිදි නම් මං ඇහැරව ගන්නම්." කියා ඔහු යන්නට ගියේය.

තමාට පිටුපා යන අනුජ් දෙස සරසි බලා උන්නේ පුදුමයෙනි. පහුගිය අවුරුදු දහනමයට ම නොවූ දෙයක් අද සිදුවන්නට යන බවක් ඇයට ඉවෙන් මෙන් දැනුනේය.

මදක් බලා සිටි ඇය අනුජ් පසුපසින්ම ගෙතුළට ගියේ සිදුවන්නේ කුමක් දැයි සිතා ගත නොහැකිවය.

“තාත්තා...” කියාගෙන අනුජ් කාමරයට යද්දී විවේකි නින්දකට වැටී සිටි ආකාශ් තිගැස්සී දැස් හැර බැලුවේය.

“මොකද ළමයෝ මේ කෑගහන්නේ?”

ආකාශ් ඇසුවේ මෘදු හඩිනි. ආකාශ් විජේතුංග තම එකම දරුවා වූ අනුජ්ට පනටත් වැඩිය ආදරය කළේය. කවුරුන් හෝ වචනයකින්වත් ඔහුව රිදවනවාට ආකාශ් කැමති නැත. ඇතැම් විටක තාත්තාත් පුතාත් දෙදෙනාම සරසිගෙන් බැනුම් අසන්නේ මේ හුරතලය නිසාය.

“මගේ අම්මට මොකද වුණේ?”

“අම්මාට මොනවා වෙන්නද ළමයෝ... ඔය ඉන්නේ...”

ආකාශ් සිනහවක් පා කිව්වේ කාමරයේ දොර අසල සිටින සරසි දෙස බලමිනි. ඔහු සිනාසුනද සරසිගේ මුහුණේ වූයේ බියපත් බවකි.

"මං අහන්නේ මගේ අම්මා ගැන තාත්තේ... එයාට මොකද වුණේ?"

"ඉතිං දරුවෝ මේ ඉන්නේ අම්මා යස අගේට..."

ආකාශ් කතා කළේ වෙනසක් නොපෙන්වීමට හැකි තරම් උත්සාහ දරමිනි. අනුජ් දැන් අත දරුවෙක් නොවේ. ඔහු සිටින්නේ දැනුම් තේරුම් ඇති වයසේය.ඇත්ත වැඩි කාලයක් සඟවන්නට බැරි බව ආකාශ්ද දැන උන්නේය.

"තාත්තේ... මං කතා කරන්නේ සරසි නිම්නාදි බස්නායක ගැන නෙමෙයි." අනුජ් කීවේ කෝපයෙනි.

"අනුජ්! ඔහොමද අම්මට කතා කරන්නේ?"

ආකාශ් කේන්තියෙන් කෑ ගැසුවේ අනුජ්ගෙන් මෙවැනි කතාවක් බලාපොරොත්තු නොවූ නිසාය.

"මෙයා කොහොමද මගේ අම්මා වෙන්නේ? මෙයා මගේ අම්මා නෙමෙයි තාත්තේ... මෙයා මගේ අම්මා නෙමෙයි. මේ ගෑණි තමයි මගේ අම්මාගේ මිනීමරුවා.."

"කටවහනවා අනුජ්..." ආකාශ් කෝපයෙන් අත එසවූයේ අනුජ්ට ගහන්නටය. නමුත් සරසි ඉදිරියට පැන ආකාශ්ගේ අතේ එල්ලුනාය.

"අනේ එපා... පුතාට ගහන්න එපා මහත්තයෝ.."

"මේ බලනවා... හොඳට බලනවා. උඹට නිය පිටින පාරක් ගහන්නේ නැතුව පරිස්සම් කරන කෙනාට උඹ කොහොමද කටක් ඇරලා මිනීමරුවා කියලා කිව්වේ.."

අනුජ් සරසි දෙස බැලුවේ කෝපයෙන් දැවෙන දෑසින්ය. මෙහෙම දවසක් එන බව සරසි මුල සිටම දැන උන්නද මේ මොහොත සරසිගේ සිතේ ඇති කළේ තිගැස්මකි. වසර දහනමයක් තිස්සේ ආදරෙන් රැක ගත් දරුවා තමාට මිනීමරුවා යැයි චෝදනා කරද්දී ඇයට දැනුණේ දැඩි වේදනාවකි.

"බලන්න දෙයක් නෑ තාත්තා. ඔයා මෙයාගේ බොරු රඟපෑම් වලට අහු වුණාට මං ඒවට රැවටෙන්නේ නෑ."

"මොනවද අනුජ් මේ කියන්නේ?"

සරසි ඇසුවේ හැඬුම් මැදිනි.

"ඇයි දන්නෙම නැද්ද? ඔයා බබා... මගේ අම්මාව මරා ගත්තේ ඔයා. අන්තිමට තාත්තාට හිරේ යන්න වුණා."

"අනුජ්..."

"එපා මහත්තයා. එයාට කියන්න දෙන්න."

"මං කොහොමත් අද මේ සේරම කතා කරනවා තාත්තා. මෙයා අවුරුදු දහයක් තිස්සේ මට කිව්වේ රට කියලා. අද වෙනකම් මං හිතන් හිටියේ ඒ විදිහට. ඒ වුණාට මං දැන් දන්නවා. ඒ අවුරුදු දහයෙම තාත්තා හිටියේ හිරේ... පුදුම ආදරයක් පෙන්නුවේ මෙයා මාව රවට්ට ගන්න. හිතන්න ඇති ඇත්ත එළිවුණ දවසකත් මං ආදරෙන් පිළිගනියි කියලා. ඒවා හීන. මං තමුන් එක්ක තවත් එක ගෙදරක ජීවත් වෙන්නවත් කැමති නෑ..."

සරසි සියල්ල නිහඬව අසා උන්නාය. අනුජ් ඉන්නේ බොහෝ කලබලයට පත්ව බව ඇය දනී.

"පුතා දැන් මට මොකද කරන්න කියන්නේ?"

"සාරා... පිස්සු හැදිලාද ඔයාට? මොනවද කරන්න හදන්නේ?"

ආකාශ් ඇයගේ උරහිසින් අල්ලා සොලවමින් ඇසුවේය.

"මං මේක වෙන බව එදා ඉඳලම දැනන් හිටියා. පුතා මට කියන්න දැන් මොකක්ද ඔයා මට කරන්න කියන්නේ?"

"සරලවම කියනවනම් මට බෑ තමුන් එක්ක තවත් මේ ගෙදර ඉන්න. එක්කෝ මං මෙහෙන් යනවා.නැත්තං ඔයා මෙහෙන් යන්න. මට ආයෙත් ඔයාගේ මූණවත් බලන්න ඕන නෑ."

"අනුජ්! තමුන්ට එච්චර දෙයක් කරන්න කොහෙන් ආපු හයියක්ද? තමුන් කොහොමද අම්මාව මේ

sinhalaebooks.com

ගෙදරින් එළියට දාන්නේ? මේ ගෙදර මගේ. මේ ගෙදර තීරණ ගන්නෙත් මම.”

“හොඳයි තාත්තේ. එහෙනම් මං මේ ගෙදරින් යනවා.”

“නැහැ. පුතා කොහෙවත් යන්නේ නෑ. මං යන්නම්. පුතාට මාව ඒ තරම් පිළිකුල් නම් මං තවත් පුතාට පේන්න ඉන්නේ නෑ.”

“තාත්තේ මං යනවා තනුකලාගේ ගෙදර. මෙයා මෙහෙන් ගියපු දවසක මං ගෙදර එන්නම්.” කියා අනුජ් පඩිපෙළ නැග්ගේ කාමරයේ වූ ඇඳුමක් ගන්නටය.

************************

ආකාශ් කාමරයට යන විට සරසි උන්නේ අල්මාරියේ වූ ඇඳුම් පිටතට ගෙන බෑගයක අසුරමිනි. සුසුමක් හෙළා ඇය වෙතට ආ ඔහු ඇයව තමා වෙතට හරවා ගත්තේය.

“සාරා...”

"මං යන්නම්.."

"එපා දෙයියනේ. එපා... හැමදාමත් වගේ අදත් ඔයා මේ වන්දි ගෙවන්න යන්නේ මගේ වැරැද්දකට සාරා..."

ආකාශ් ඇදෙහි වාඩි වී දෑතින්ම තම හිසකෙස් ඇද ගත්තේ තමන් ගැනම උපන් කේන්තියෙනි. සරසි නමමින් සිටි ඇඳුම පසෙක තබා ඔහුට ළං වූවාය.

"ආකාශ් අයියේ... ඇයි මේ? එදා ඉඳලම අපිට එකට ඉන්න වාසනාවක් තිබ්බේ නෑ. ගිය ආත්මෙක අපි දෙන්නා එකතු වෙලා ලොකු පවක් කරන්න ඇති."

"මං අනුජ්ට කියන්නම් සාරා..."

"මොනවද?"

"ඇත්ත. තාරුකාගේ මරණෙට ඔයා සම්බන්ධ නෑ කියලා. තාරුකා මැරුණේ මගේ වරදින් කියලා."

"ඒක කරන්න හිතන්නවත් එපා. පොඩිකාලේ ඉඳලා ඔයාගේ ආදරේ එයාට ලැබුනේ නෑ. ඒත් එයා ඔයාට හරි ආදරෙයි. දැන් එයා මාව අයින් කරලා ඉවරයි. එයාට ඉතුරු ඔයා. ඔයා ගැන එහෙම දෙයක් දරුවට දරා ගන්න බෑ. ඒ නිසා එපා. අපි හැමදාම කලා වගේ කාලයට ඉඩ දෙමු. මං අපේ දරුවට වෛර කරන්නේ නෑ..."

"ඒ වුණාට සාරා..."

"හරි හරි. දැන් ඇති. අපි නිදා ගමු. මං මේ ටික හෙට උදේම අස්කර ගන්නම්."

කියූ සරසි අතට හසු වූ ඇඳුම් කීපයක් බෑගයට දමා පසෙකින් තැබුවාය. පසුව ඇදෙහි ආකාශ් අසලින්ම හාන්සි වූවාය.

"සාරා..."

"ම්...."

"මට මේක කරන්න බෑ සාරා. මට ආයෙත් ඔයාව නැති කර ගන්න. තවත් විඳවන්න මට බෑ."

"මහත්තයෝ, දැන් අපි පොඩි ළමයි නෙමෙයි. මට මේ ගෙදරින් ගිහින් තනියම ජීවත් වෙන්න මට රස්සාවක් හරි තියෙනවා. ඒත් මේ තත්ත්වෙත් එක්ක පුතා මේ ගෙදරින් ගියොත් මොකද වෙන්නේ? ඒ දරුවාට එහෙම අසරණ වෙන්න ඉඩ තියන්න එපා."

"සාරා... මට මගේ ජීවිතේ ඔයාලා දෙන්නම ඕන. ඔයාලා දෙන්නම නැතුව මගේ ජීවිතේ සම්පූර්ණ නෑ."

"ආකාශ් අයියේ.."

"හරි... දැන් ඔයා නිදා ගන්න. මං හෙට පුතාට කතා කරලා මේ ප්‍රශ්නේ විසඳනවා."

කියූ ආකාශ් සරසිගේ හිස අතගාමින් කල්පනා කරන්නට වූවේය. සරසිට ද නින්දක් නම් නොවීය.

අවුරුදු ගානක් තිස්සේ ආදරේ නාමයෙන් එන්නේම ගින්දරය. එක ගින්නක් නිවී යන විට තවත් ගින්නක් ඇවිලෙන්නේ කුමන පවකට දැයි කියන්නට සරසිවත් ආකාශ්වත් දැන උන්නේ නැත. හැමදාමත් සිදු වූයේ දෙදෙනා දෙපසට වී විඳවන්නට සිදුවීම ය.

# 02.

උසස්පෙළ විභාගය අවසන් කර අනුජ් නිවසට ආවේ සැහැල්ලුවෙනි. ආලින්දයේ පුවත්පත බලමින් සිටි ආකාශ් ඈත තියාම ඔහුව දුටුවද නොදුටුව ලෙස පුටුවෙන් නැඟිට්ටේ ගෙතුළට යන්නටය.

“තාත්තේ...” ආකාශ් නතර වූවද හැරි නොබැලුවේය.

“තාත්තේ අදින් මගේ විභාගේ ඉවරයි.”

“හොඳයි.” කියූ ආකාශ් ගෙතුළට ගියේ අනුජ්ගේ මුහුණවත් නොබලාය.

අනුජ්ගේ සිත කෝපයෙන් පිරී යන්නට වැඩි වෙලාවක් ගියේ නැත. ‘ මිනීමරු ගෑණි. තාත්තාට මොන වශියක් කරලද මන්දා... තාත්තාට ඇයි ඔය තරම්ම ඒ ගෑණිව හිතෙන් අයින් කරන්න බැරි... බලමු. තාත්තාත් කවදා

වෙනකම් ඔහොම මාත් එක්ක තරහා වෙලා ඉන්නද..' තනිවම මුමුණාගනිමින් ඔහු කාමරයට ගියේය.

ආකාශ් කාමරයට ගොස් ඇද මතින් වාඩි වූයේ බර වූ හදවතිනි. ඇඳ අසල තබා තිබූ ඡායාරූපයට ඔහුගේ අත ගියේ ඉබේටමම ය. එය අනුජ් කුඩා කාලයේ සරසි ඔහුව තුරුළු කරගෙන ගත් ඡායාරූපයකි.

"ඔයා පුතාට කොයි තරම් ආදරෙන්ද හිටියේ... සාරා... ඔයාගේ පුතා ඔයාට එහෙම කළේ කොහොමද සාරා? අපේ දරුවෙක්ට ඒ වගේ නපුරු වෙන්න පුළුවන්ද?"

ඔව්. මීට මාසයකට පමණ පෙර ඒ දිනයේ රාත්‍රියේ ආකාශ් නින්දකට වැටී සිටිද්දී සරසි රත්නපුර නිවසින් පිටත් වූවාය. කෙතරම් සෙව්වද ආකාශ්ට ඇය ගැන තොරතුරක් සොයා ගැනීමට නොහැකිවිය.

මේ සුවිසල් නිවස පාළු සොහොන් පිටියක් බවට පත්වූයේ එදා සිටය. නිවස පුරාම නිහඬ බව රජ කළේය. ආකාශ් මේ වනතෙක්ම අනුජ් හා කතා කලේ වචන කිහිපයකි. ඒ ද අත්‍යාවශ්‍යම කාරණයකට පමණි. අනුජ් කෙතරම් උත්සහ කළද ආකාශ්ගෙන් පෙර සිටි ආදරණීය පියාව දකින්නට ඔහුට

බැරි විය. ඒ බැව් දැනෙද්දී ඔහු තව තවත් සරසිට වෛර කරන්නට වූවේය.

************************

නිවසේ සීනුව නාදවන විට අනුජ් සිටියේ සාලයේ රූපවාහිනිය නරඹමිනි. ඔහු දොරෙන් එබුණේ කුතුහලයෙනි. මන්ද මේ නිවසට අමුත්තන් පැමිනෙන්නේ ඉතාමත් අඩුවෙනි.

"ලොකු අප්පච්චී..." අනුජ් කීවේ සතුටිනි.

"කෝ පුතා.. කට්ටිය නැද්ද?"

"ඉන්නවා ඉන්නවා ලොකු අම්මේ... එන්නකෝ ඇතුළට.."

කව්රුන් හෝ කතා කරනු ඇසී ආකාශ්ද සාලයට ආවේ වැරදිලාවත් සරසි නැවත පැමිණ ඇත්දැයි සිතමිනි.

"අයියේ... කාලෙකින් මේ පැත්ත මතක් වෙලා තියෙන්නේ..."

"කොහොමද මල්ලී ඉතිං?"

"ඉන්නවා අක්කේ. කෝ දෝණිලා ආවේ නැද්ද?"

"දෙන්නම ඔන්න කැම්පස් එකේ වැඩකට කියලා ගියේ. පොඩි දුවත් ඉතිං අක්කා යනවනම් ඕන දිහාක යයි."

"අනුජ්, සේනට කියන්න බොන්න දෙයක් ලෑස්ති කරන්න කියලා."

ආකාශ්ගේ බහට හිස වැනූ අනුජ් කුස්සිය දෙසට යනතුරු සිටි ආකාශ්ද තම සහෝදරයා ඉදිරියේ වාඩි වූවේය.

"ඉතිං අයියේ... අද නිවාඩුද?"

"එක දිගටම වැඩනේ බං. පොඩි නිවාඩුවක් දැම්මා..."

"කෝ මල්ලි සාරා..?" ඉන්දු ඇසුවේ ඇය පෙනෙන්නට නැති නිසාය.

"සාරා... අක්කේ..."

"ඇයි මල්ලී? ආ... මට අමතක වුණා අද වැඩ නේද එයාට?"

"නෑ ලොකු අම්මේ. එයා දැන් මෙහේ නෑ..." අනුජ් ආවේ එසේ කියාගෙනය. එය කියද්දී ආකාශ්ගේ සොයුරා අසුනින් නැඟිට්ටේ පුදුමයෙනි.

"මොකක්?"

"ඔව් ලොකු අප්පච්චී... දැන් එහෙම කෙනෙක් මෙහෙ නෑ..."

අනුජ් මේ කතා කරන විලාසය ඉන්දුට නම් අදහන්නට බැරිය. අනුජ් කවදාවත් සරසිව එයා මෙයා කියා ඇමතුවේ නැත. ඔහු හැමදාමත් ඇයට කතා කලේ ආදරයෙනි.

"ආකාශ් මොනවද මල්ලී මේ පුතා කියන්නේ?"

"මං මොනවා කියන්නද අක්කේ... මෙයාගෙන්ම අහගන්න කරපු හපන්කම්" කී ආකාශ් කාමරයට ගියේය.

"අනුජ්, මට ඇත්ත කියනවා. මොනවද වුණේ?"

"මං එයාට මෙහෙන් යන්න කිව්වා"

"මොකක්!"

"ඔව්. මං යන්න කිව්වා. ඒ මගේ අම්මා නෙමෙයි. අම්මාගේ මිනී මරුවා. මට මගේ අම්මව නැති කළා. මගේ තාත්තා හිරේට ගියා. හැමෝම මාව රැවැට්ටුවා..."

"කවුද දැන් උඹට මේවා කිව්වේ?"

"කිව්ව කෙනාගෙන් වැඩක් නෑ ලොකු අප්පච්චී. කතාව ඇත්තනේ..."

"හරි. ඒ උඹව වදාපු අම්මා නෙමෙයි තමයි. අනේ ගොනෝ... ඒ ගෑණි නේද උඹව හදා ගත්තේ? උඹට ඉගැන්නුවේ? මේ කොහේවත් යන එකෙක් ඇවිල්ලා ඔහොම කතාවක් කියපු පලියට උඹ ඒකිව මිනීමරුවා කියලා ගෙදරින් එළවා ගත්තද?" ඔහු ඇසුවේ කේන්තියෙනි.

"ලොකු අප්පච්චී, ඇයි ඔයාලා ඔහොම කියන්නේ? අවුරුදු දහනමයක් තිස්සේ මං ජීවත් වෙලා තියෙන්නේ ලොකු බොරුවක් ඇතුලේ... හැමෝම මාව රවට්ටලා. මං ඇත්ත දැනගත්තටත් පස්සේ මට තවත් සැනසීමක් නෑ... එදා ඉඳලා තාත්තා අදටත් මාත් එක්ක කතා කරන්නේ නෑ..." අනුජ් කීවේ වේදනාවෙනි.

"උඹෙත් වැරැද්ද පුතේ... උඹව වැදුවේ නැති වුණාට ඒ ගෑණි උඹට අම්මෙක් නැති අඩුව දැනෙන්න දුන්නද? උඹට වෙනසක් කළද? තාත්තාත් නැතුව අවුරුදු දහයක් තනියම උඹව හදාගන්න ඒකී වින්ද දුක ඔයා දන්නේ නෑ."

"ඔය මොනවා කිව්වත් ලොකු අම්මේ..."

ආකාශ්ගේ සොයුරා අත දිගු කර අනුජ්ව නතර කළේය.

"මොනවා කිව්වත් මට කියන්න තියෙන්නේ මෙච්චරයි ... උඹට පින නෑ ඒ වගේ අම්මෙක් ලබන්න.." කියූ

ඔහු ආකාශ්ගේ කාමරය දෙසට ගියේ අනුජ්වත් ඉන්දුවත් සාලයේ තනි කරමිනි.

"ඔයා දන්නේ නැති වුණාට පුතේ ඔයා ඒ මිනීමරුවා කියලා හංවඩු ගහපු ගෑණිටත් ඒ කාලේ හරි ලස්සන ජීවිතයක් තිබ්බා. ඔයාගේ අම්මාව කවුරුවත් මැරුවේ නෑ. ඔයාව ලැබෙන්න ගිහින් එයා නැති වුණේ. එදායින් පස්සේ සාරා එයාගේ ලස්සනට හදාගත්ත ජීවිතේ අත ඇරියා. සේරම අත ඇරලා ඔයා වෙනුවෙන් ආවේ. එයා ගැන නරක විදිහට හිතන්නවත් එපා පුතේ. ඔයාට පව්." කියා ඇයද ගෙතුළට ගියේය.

නමුත් එදා සරසි ගැන අසන්නට ලැබුණ දේවල් එහෙම ලේසියෙන් සිතෙන් මකා දමන්නට අනුජ්ට බැරිය. ඒ දේවල් තවමත් ඔහුගේ සවන් තුළ දෝංකාර දෙයි.

"උඹේ අම්මා හරි අහිංසකයි... සරසි උඹේ අම්මාව මරාගත්තා..."

අයියා කාමරයට එන විටත් ආකාශ් උන්නේ සරසිගේ පින්තූරයක් දෙස බලාගෙන කල්පනා කරමිනි.

"ඇයි බං සාරාව නැවැත්තුවේ නැත්තේ?"

"සාරා ගියේ මටත් හොරෙන් අයියේ... මං එයාව හොයන්න නොගියපු තැනක් නෑ.. අන්තිමට මං බලංගොඩටත් ගියා. එහෙත් එයා නෑ..."

"දැන් මොකක්ද කරන්න ඉන්නේ?"

"මං දන්නේ නෑ අක්කේ. මේ ළමයා කියන දෙයක් තේරුම් ගන්නේ නෑ නේ."

"කොල්ලා තරහින් ඉන්නේ."

"මාත් ඉන්නේ තරහින් අක්කේ... සාරා මං වෙනුවෙන්, අනුජ් වෙනුවෙන් මොනවද නොකළේ? ඒ සේරම කරලත් මොනවද අන්තිමට ලැබුණේ? මිනීමරු නාමෙකුත් ගාගෙන යන්න ගියා. ඒකිටයි මගේ පව් ගෙවන්න වුනේ."

ආකාශ් අත මිට මොළවා බිත්තියට ගැසුවේ ආවේගයෙනි.

"කලබල වෙලා කිසිම දෙයක් කරන්න බෑ බං. අපි කොල්ලාට හිමීට කතා කරමු."

"මං සාරා සම්බන්ධව කියන කිසිම දෙයක් අහන්න එයා ලෑස්ති නෑ."

සොයුරන් දෙදෙනාට කතා කරගන්නට ඉඩ තබා ඉන්දු කාමරයෙන් එළියට ආවේ බර වූ හදවතිනි. සරසි නැතිව මේ ගෙදර කොතරම් පාළුවට ගොසින්ද? ඇය එදා සිටම ආකාශ්ට හා අනුජ්ට පමණක් නොව මේ සියලුම දෙනාට ආදරය කළාය. තම දියණියන් දෙදෙනා මේ ගැන දැනගත් පසු කොතරම් දුක්වේවි දැයි ඇය කල්පනා කළාය.

අනුජ් උන්නේ ඉහළ මාලයේ බැල්කනියට වී කල්පනා කරමිනි. ඉන්දු ගියේ ඔහු සොයාගෙනය.

"මොකක්ද පුතා මේකේ තේරුම? තාත්තා කොයි තරම් දුකෙන්ද ඉන්නේ කියලා ?"

"එහෙම කියලා ලොකු අම්මා කියන්නේ මගේ අම්මාගේ මිනීමරුවා මේ ගෙදර තියාගෙන අම්මා අම්මා කියන්න කියලද?"

"අනුජ් පුතා... හරි ඔයා මෙහෙම කරන්න. අපි කියනවට විශ්වාස කරන්න එපා. ඔයාම හොයලා බලන්න."

"ඇයි මං හොයලා බලන්නේ? මට විශ්වාසයි මේක කියපු කෙනාව."

"ඒත් පුතේ මට විශ්වාස නෑ. මං කියනවට පුතා යාළුවෝ එක්ක හරි බලංගොඩ ගිහින් හොයලා බලන්න."

"බලංගොඩ?"

අනුජ් ඇසුවේ පුදුමයෙනි. බලංගොඩ යන්නට කියන්නේ ඇයි දැයි ඔහු දැන උන්නේ නැත.

"බලන්නකෝ ඉතිං ඔයා මොනවද දන්නේ?"

"ඇයි ලොකු අම්මේ බලංගොඩ යන්නේ?"

" මොකද සාරාගේ ගම බලංගොඩ. ඔයා ඔය කියන කිසිම දෙයක් වුණේ මෙහෙදි නෙමෙයි. බලංගොඩදී."

"ඇයි ලොකු අම්මේ... මං මොනවද එහේ ගිහිං හොයන්නේ?"

"ගියාම ඔයාට දැනගන්න පුළුවන් වෙයි." කියා ඇය යන්නට ගියාය.

# 03.

"බලංගොඩ?"

තනුක පුදුමයෙන් අනුජ් වෙතට හැරෙමින් ඇසුවේය.

"ඔව් බං."

"උඹ දැන් එහේ යන්නද හදන්නේ?"

තනුක උනන්දුවෙන් ඇසුවද අනුජ්ට නම් එවැනි අදහසක් නොවීය. කවුරුන් කුමක් කීවත් ඔහුට සරසි ගැන ඇත්තේ තරහකි. තනුක ඇතුළු මිතුරන් කෙතරම් උත්සහ කළත් ඔහුගේ සිත වෙනස් කරන්නට බැරි විය.

නමුත් එදා ඉන්දු ලොකු අම්මා කී කතාව ඉවත දමන්නටද ඔහුට සිත දුන්නේ නැත.

"මට යන්න උවමනාවක් නෑ බං."

"ඒත් ඉන්දු ආන්ටි එහෙම කියන්න ඇත්තේ මොකක් හරි හේතුවක් නිසා. අපිට ඒක එහෙම අහක දාන්න පුළුවන්ද?"

දර්ශි කීවේ මදක් කල්පනා කරමින් සිට අනතුරුවය. තනුක, දර්ශි, නිම්නා සහ අනුජ් කුඩා කාලයේ සිටම හොඳම මිතුරන්ය. අනුජ්ගේ මේ ගැටලුව ගැන අනෙක් තිදෙනාම උන්නේ සිත් වේදනාවෙනි.

එක් අතකින් හොඳම මිතුරා අනුජ්... අනික් අතින් කුඩා කාලයේ සිටම අනුජ්ට මෙන්ම ඔවුන්ට ද ආදරයෙන් සැලකූ සරසිව ඉවතලන්නට ද ඔවුන්ට සිතක් නැත.

“අපි යමු බලංගොඩ.”

“නිම්නා!” අනුජ් පුදුමයෙන් ඇය දෙසට හැරුණේය.

“ඔහොම බලන්නේ ඇයි? මං කිව්වේ අපිට මේ වෙලාවේ කරන්න තියෙන දේ..”

“පිස්සුද බං... මට එයා ගැන හොයන්න වුවමනාවක් නෑ...”

“ඒ වුණාට අනුජ් උඹ ඔහොම කතා කරන එක වැරදියි.”

"ඇයි මං වැරදි? කියපං තනුක.... ඇයි මං වැරදි?"

නිම්නා පුටුවෙන් නැඟිට අනුජ් වෙත පැමිණ ඔහුගේ උරහිස් මතින් දෑත් තබා ඔහුගේ මුහුණට එබුණාය.

"ඔහොම තරහා ගන්න එපා අනුජ්... අපි කියන දේ පොඩ්ඩක් හිතලා බලන්න... එයාගේ වැරදි ඇති. ඒත් අම්මා නැතිවුණ දවසේ ඉඳලා මේ වෙනකම් එයා ඔයාව කිසි අඩුවක් නොකර බලා ගත්තා අනුජ්... දැනුම් තේරුම් තියෙන කාලෙක ඉඳලා අපිත් ඒක දැක්කානේ..."

"නිම්නා... මං ඒ තත්ත්වෙට වැටුණේ, මට එයා ළඟ හැදෙන්න වුණේ... සේරම සිද්ධ වුණේ මට මගේ අම්මා නැති වුණ නිසා... ඒක වුණේ ඒ ගෑණි නිසා."

"හරි හරි. දැන් ඇති. අපි මෙතන කියව ගත්තා කියලා කිසි දෙයක් වෙනස් වෙන්නේ නෑ. මං කියන්නේ අපිත් මේ දවස්වල නිකම්ම ඉන්න එකේ බලංගොඩ ගිහින් පොඩි විසිට් එකක් දාලා බලමු..."

දර්ශී එසේ කීවද අනුජ්ගේ ප්‍රතිචාරය නම් එතරම් හොඳ එකක් නොවීය.

"ගියයි කියලා අපි ඔය පරණ කතා කොහොම හොයන්නද?"

"ඒ ගැන ඔයා වද වෙන්න එපා. අපේ දුරින් නෑදෑ වෙන පුංචි කෙනෙක් ඉන්නවා බලංගොඩ. අපි නිවාඩුවකටත් එක්ක ඉස්සෙල්ලාම එහෙට යමුකෝ."

"හරි එහෙනම්. අපි යමු." තනුක කීවේ අනුජ් දෙස මොහොතක් බලා හිඳය.

"බලමු."

අනුජ් කීවේ එපමණකි.

ආකාශ් උන්නේ කාර්යාල කාමරයට වී ලිපිගොනුවක් පිරික්සමිනි. අනුජ් කාමරයට එබී බලනු දුටුවද ඔහු එය නොදුටු ලෙසින් තම වැඩය කරන්නට විය.

“තාත්තේ..”

“ම්..”

“අපි ට්‍රිප් එකක් යනවා.”

“කොහෙද?”

“ම් මේ... අනුරාධපුර.”

“කවුද වෙන යන්නේ?”

“අපි හතර දෙනා. තනුකයි.නිම්නයි. දර්ශියි මමයි.”

“ඒ ගෑණු ළමයින්ව එහෙම ගමන් යන්න ගෙවල් වලින් එවනවද?”

“ඔව් තාත්තේ. දර්ශිගේ පුංචිගේ ගෙදර අපි යන්නේ. එයාගේ වාහනේම යං කියලා කතා වුණේ.”

"කවද්ද?"

"අනිද්දා"

"ගිහින් එන්න. මං හෙට සල්ලි දෙන්නම්."

"තාත්තා මං ගියාම තනියම නේද?"

අනුජ් මදක් පැකිලෙමින් කීවේය.

"මගේ තනියට ඔය සේන ඉන්නේ. අනිත් එක ඉතිං මගේ පුතා තීරණ ගන්නේ තාත්තා ගැන හිතලා බලලා නෙමෙයි නේ..." ආකාශ් කීවේ ඉවත බලාගෙනය.

"තාත්තා මාත් එක්ක තරහින් ඉන්නේ..."

"නෑ... මේ වුණ දේවල් ගැන මට පුදුම වේදනාවක් තියෙන්නේ."

"ඇයි තාත්තේ එහෙම කතා කරන්නේ? තාත්තාට අර අකාලේ මැරිලා ගිය මගේ අම්මා ගැන නැති දුකක් නේ එයා ගැන තියෙන්නේ..."

"අනුජ්... කටවහනවා."

ආකාශ් පුටුවෙන් නැඟිට්ටේ කේන්තියෙනි. අනුජ් අසලටම පැමිණ ඔහු කතා කරන්නට වූයේ මදක්වත් පහව නොගිය කේන්තියෙනි.

"මේක හොඳට මතක තියාගන්නවා. උඹව වැදුවේ සාරා නෙමෙයි. උඹේ අම්මා මැරුණා.. ඒකත් හරි. හැබැයි උඹ ඒ අම්මාගේ බඩේ හිටපු මාස දහය විතරයි. උපන් මොහොතේ ඉඳලා අද වෙනකම් උඹේ අම්මා සාරා. ඒකේ වෙනසක් නෑ. එදත් උඹේ අම්මා සාරා. අදත් උඹේ අම්මා සාරා... ඒ වගේම හෙටත් ඒක එහෙම්ම ම තමයි."

කියූ ආකාශ් අතවූ ලිපිගොනුව වේගයෙන් මේසය මතට අතහැර කාමරයෙන් පිටතට ගියේය.

*********************

සරසි මධූගේ නිවසට පැමිණියේ දවස් දෙකකට පෙරය. මධූ කුඩා කාලයේ සිටම සරසිගේ හොඳම මිතුරියයි.

"සාරා... උඹ මොකක්ද දැන් කරන්න හිතන් ඉන්නේ...?"

"මං දන්නේ නෑ මධූ. මං එහෙට ට්‍රාන්සර් එක හදා ගන්න හිතුවේ."

"දැන් සදහටම එහෙට වෙලා ඉන්නද හදන්නේ එතකොට?"

"ඔව් මධූ. අපි දැන් වයසට ගිහින්. මං ගාවින් හිටි හැමෝටම මං මට පුළු පුළුවන් විදිහට මගේ යුතුකම් ඉෂ්ඨ කළා. අනුජ් වුණත් දැන් ලොකුයි. මට කවදා හරි මැරෙන්න කළින් මගේ දරුවො දෙන්නව දකින්න තිබුණොත් ඇති."

"සාරා... මං නම් කියන්නේ ඔයා මේ ගැන ආකාශ් අයියා එක්ක කතා කරන්න ඕන. ඒ කාලේ මොනවා වුණත් දැන් එයා ඔයාගේ මහත්තයා." මධූ සරසි අසලින්ම වාඩි වෙමින් කීවාය.

"බෑ මධූ. එයා තාමත් පොඩි එකෙක් වගේ. මං එයාට කතා කළොත් මෙතන තවත් ප්‍රශ්නයක් වෙන්න පුළුවන්."

"ඒත් සාරා... එහෙම එයාව මේ ප්‍රශ්නෙන් නිදහස් කරන්න බෑ... මේ හැමදේටම මුල එයා. එයාට වගකීමක් තියෙනවා පුතාට මේවා තේරුම් කරලා දෙන්න."

"එයා කියන දෙයක් අහන්න පුතා ලෑස්ති නෑ. මං දන්නේ නෑ මේ දරුවා හොඳටම මුරණ්ඩු වෙලා. ඔයා දන්නවානේ ඔය වයසට දරුවෝ කරන හිතුවක්කාර වැඩ. මං නැති වුණාම එයා ටිකක් සන්සුන් වෙයි. ඉන්දු අක්කාට මං ටික දවසකින් කතා කරලා කියනවා එයාව බලන්න කියලා."

"මේ හදිස්සියේ ඒ ළමයා මේවා දැනගත්තේ කොහොමද සාරා?" මධූ ඇසුවේ මුල සිටම අහන්නට සිටි පැනයකි.

"මං ඒ ගැනත් හොයලා බැලුවා. එයාට මේක කියලා තියෙන්නේ වෙන කවුරුත් නෙමෙයි යොමාල්.."

"යොමාල්?"

"ඔව් මධූ... දෙන්නාම එකම ඉස්කෝලේ. මාත් ළඟදි දැන ගත්තේ."

"ඒත් එයා සේරම ඇත්ත දන්නවා නම්?"

"නෑ... එයා සේරම දන්නේ නැතුව ඇති මධූ. ඒත් මට එක දෙයක් විශ්වාසයි, එයාට මං ගැන ගොඩක් නරක දේවල් කියලා ඇත්තේ."

"ඒක නම් මටත් හිතා ගන්න පුළුවන්. දැන හිතන් ඇති එයා දිනුවා කියලා."

"දිනන්න මට තරඟයක් තිබ්බේ නෑ මධූ. මගේ අතිනුත් වැරදි අඩුපාඩු වුණා. මං දන්නවා. මට තාමත් ඒ දේවල් හීනයක් වගේ..."

සරසි කීවේ දෑසට උනන කඳුළු පිටි අත්ලෙන් පිසලමිනි.

මේ කටුක අතීතය වල දමන්නට කෙතරම් උත්සහ කළද එය විටින් විට යළිත් උඩට එන බව මධූ දැන

උන්නාය. මේ මොහොතේ ඇය සූදානම් වූයේ සරසිව තමාත් සමඟ නවතා ගන්නට ය. නමුත් සරසි අද ආපසු යන්නට තීරණය කරගෙන උන්නාය.

"අදත් ඉදලා යන්න සාරා..."

"එහෙම ඉදලා බෑ මධූ. මං නිවාඩුවක් ලැබුණ ගමන් ඇවිත් යන්නම්."

"මට ඔයාව මෙහෙම යවන්න හිත දෙන්නේ නෑ සාරා... ඔයා මෙහෙම තනි වෙන්න ඕන කෙනෙක් නෙමෙයි."

මධූ කීවේ දෑසට කඳුළු පුරවාගෙනය.

"අනේ මධූ... මං ආයේ දවසක එනවා."

"පොඩි කාලේ ඉඳලා ඔයා අපි හැමෝම ගැන හිතුවා. මං ගැන, ආකාශ් අයියා ගැන... ඔයා කියපු දේවල් ඒ කාලේ ඇහුවා නම් මාත් අද මීට වඩා ගොඩක් වෙනස් තැනක ඉන්න තිබ්බා. මගේ කරුමෙට මට ඒවා තේරුම් ගන්න බැරි වුණා."

"දැන් ඒවා ඉවරයි මධූ.."

"හැමෝගෙම සතුට ගැන හිතපු ඔයා අද ඉන්නේ ගොඩක් දුකින්."

"දැන් ඔය ඇති මධූ... මං ගිහින් ඉක්මනින් එන්නම්."

"පරිස්සමින් සාරා."

"මං වෙනුවෙන් එක දෙයක් කරන්න මධූ... මං මෙහෙම ආපු බව කාටවත් කියන්න එපා."

"නෑ සාරා. කවදාවත්ම නෑ.."

"මං බලංගොඩට ආවේ අවුරුදු දහ නමයකට පස්සේ. ඒත් ඒ අවුරුදු විස්සකට කලින් සිද්ධ වුණ දේවල් මුළු බලංගොඩටම තාම මතකයි මධූ..."

"නෑ සාරා... මුළු බලංගොඩටම නෙමෙයි. කීප දෙනෙක්ට මතක ඇති. ඒත් කවදාවත් එළිනොවුණ සමහර රහස් තාමත් මේ කඳු අස්සේ හැංගිලා තියෙනවා..."

"මං දන්නවා මධූ... මං එහෙනම් ගිහින් එන්නම්."

කියූ සරසි තම බෑගයත් රැගෙන මධූගේ නිවසින් පිටත් වූවාය.

# 04.

දර්ශිගේ පුංචි වෘත්තියෙන් ගුරුවරියක් වූවාය. ඇය බලංගොඩ නිවසේ ජීවත් වූයේ තනිවමය. තවමත් වියැකී නොගිය සුන්දර රූ සපුවක් හිමි ඇය මේ තරම් කාලයක් අවිවාහකව ජීවත් වන්නේ ඇයි දැයි දර්ශි පවා නොදැන උන්නාය.

අනුජ් ඇතුළු පිරිස ඇයගේ නිවසට පැමිණෙන විට දවල් වී තිබුණි. තනුක වාහනය නතර කළේ එහා අසුනේ සිටි අනුජ් වෙත නෙත් යොමමිනි.

"යමු යමු..." කියමින් දර්ශි ඉස්සර වූවාය.

"පුංචෝ..." ඇය දුවගෙන ගොස් පුංචිව වැළඳ ගත්තාය.

"මගේ කෙල්ල... දැක්ක කල්..." කියමින් ඇය දර්ශීගේ මිතුරන් වෙතට හැරුණාය.

"එන්න පුතේ ඇතුළට..."

"මං ඉතිං මෙහේ තනියම ඉන්නේ.." ඇය ඉස්සර වෙමින් කීවාය.

"දැන් ඉතිං පුංචිට තනියක් නෑ... අපි ඉන්නවා නේ..." නිම්නා ඇයගේ කර වටා අතක් දමාගෙන කීවාය.

සන්ධ්‍යාවේ කෙටි නින්දකින් පසු මිතුරන් සිව් දෙනා මිදුලේ පුටු තබාගෙන කතා කරමින් සිටියෝය. දර්ශිගේ පුංචිද පුටුවක් රැගෙන ඔවුන් වෙත ආවාය.

"ඉතිං ඉතිං... මොකක්ද කතාව..."

"අපි පුංචෝ මේ කෙනෙක් ගැන විස්තර හොයනවා..."

" විස්තර හොයනවා..?"

“ඔව් පුංචි... අපි මේ හදිස්සියේම බලංගොඩ එන්න තීරණය කළෙත් ඒකයි...”

“ආ... ඒක තමයි එහෙනම්. නැතුව මේ අපේ කෙල්ලට මාව මතක් වෙලා ආපු ගමනක් නෙමෙයි...”

“අනේ පුංචෝ... මෙහෙම හරි ආව එකට සතුටු නැද්ද ඔයාට? නැත්තං මට එන්න වෙන්නේ කවදා හරි අම්මිලා එන දවසක තමයි.”

“ මං දන්නවා ළමයෝ... විහිළුවට එහෙම කිව්වේ...”

“දැන් කියන්නකෝ මට ඔයාලා කවුරු ගැනද හොයන්නේ?”

ඒ පැනයත් සමඟ මිතුරන් තිදෙනාම එකවරම අනුජ් දෙස බැලුවෝය. මිතුරන් බලා ඉන්නේ තමාම එය කියන තුරු බව අනුජ් දනී.

“මං ඒ නමවත් කියන්න කැමති නෑ බං.” කියමින් ඔහු ඉවත බලා ගත්තේය.

"හරි හරී... මං කියන්නම්..." නිම්නා කැමැත්තෙන්ම ඉදිරිපත් වූවාය.

"පුංචි, එයාගේ නම සරසි. සරසි නිම්නාදි බස්නායක."

"සාරා...!" පුංචි ඇසුවේ දෑස් විසල් කරගෙනය.

"ඔව් පුංචි... හැමෝම එයාට කතා කරන්නේ සාරා කියලා..."

"ඇයි පුතේ ඔයාලා සාරා ගැන හොයන්නේ?"

"පුංචි එයාව දන්නවද?" තනුක ඇසුවේ මදක් සතුටිනි. බැලූ බැල්මටම පුංචි ඇය ගැන යමක් දන්නවා විය යුතුය. එසේ නම් මේ ගැටලුව ලිහා ගැනීමට අපහසු වන්නේ නැත.

"ඊට කලින් මට මේක කියන්න. ඇයි ඔයාලා සරසි ගැන හොයන්නේ?"

"මේකයි පුංචි... එයා අපේ අනුජ්ගේ..."

නිම්නා ඉතිරිය කියන්නටත් පෙර අනුජ් පුටුවෙන් නැඟිට්ටේ අමනාපයෙනි.

"ඒ ගෑණි මගේ කවුරුවත් නෙමෙයි නිම්නා.."

කියා කෑ ගැසූ ඔහු ගෙතුළට ගියේ දර්ශිගේ පුංචි පුදුමයෙන් බලා සිටිද්දීය. ඇය ප්‍රශ්නාර්ථයක් රැඳි මුහුණින් දර්ශි දෙස බැලුවාය.

"එයා තමයි පුංචි අනුජ්ගේ අම්මා.."

දර්ශි කියද්දී ඇයට සුසුමක් හෙළුනේ ඉබේටමය. 'එහෙනම් මං හිතුවා හරි. මේ ඉන්නේ ආකාශ් අයියාගේ පුතා තමයි. ඒත් මේ දරුවා සාරා එක්ක මේ තරම් තරහින්ද?'

"නෑ... ඒ එයාගේ අම්මා නෙමෙයි." ඇයට කියවුණේ ඉබේටමය.

"පුංචී..!"

"පුංචි එහෙනම් ඒ ගැන දන්නවා..."

"මං පුතේ…"

"අනේ පුංචි… දන්න දේවල් අපිට කියන්න.." නිම්නා කීවේ බැගෑපත් හඬිනි.

"ඒක ගොඩක් දිග කතාවක් දුව.."

"කොච්චර දිග කතාවක් වුණත් අපි ලෑස්තියි අහන් ඉන්න. පුංචිට අමතක වෙලා නැත්තම්…"

ඇයට සිනහවක් නැඟුණේ ඉබේටමය. ඒ කතාව කෙසේ නම් අමතක වෙන්නද? තමාත් ඒ කතාවේ ප්‍රධානම චරිතයක් වී තිබියදී කෙසේ නම් අමතක වෙන්නද?

"ඇයි පුංචි?"

"ඒ දේවල් වෙලා අවුරුදු විස්සක්… අවුරුද් පනහක් ගියත් කවදා හරිම මං මැරිලා යනකම් මට ඒ දේවල් අමතක වෙන එකක් නෑ දරුවෝ… ඔයාලා නොදන්නවට මං තමයි පුංචි කාලේ ඉඳලා සාරාගේ හොඳම යාළුවා."

"හොඳම යාළුවා!" තිදෙනාමට එකවරම කියවුණි.

"ඔව්"

"එහෙනම් දර්ශි අපිව එක්කන් ඇවිල්ලා තියෙන්නේ හරිම කෙනා ළඟට."

"ඔව්... මං හැම දෙයක්ම දන්නවා. දැන් සරසි අනුජ්ලාගේ ගෙදර නැති බවත් මං දන්නවා."

"පුංචී... සාරා ඇන්ටි ඉන්න තැනක් දන්නවද?"

"ඉන්න තැනක් නම් මං දන්නේ නෑ.. ඒත් මං අනිත් හැමදේම දන්නවා. මං සාරාට පොරොන්දුවක් වෙලා ඉන්නේ මේ පරණ දේවල් ආයෙත් කතා නොකර ඉන්න..."

"ඒත් පුංචි..."

"ඔව්. මං දන්නවා. මේ වෙලාවේ ඔයාලාට ඕන ඇත්ත දැනගන්න."

"ඔව් පුංචි. පේනවානේ අනුජ් හැසිරෙන විදිහ. එයා මේ විදිහට හැසිරෙනවා අපිට බලන් ඉන්න බෑ. අනික මෙතනදි ඇත්තටම වුණේ මොකක්ද කියලා අපිටත් දැනගන්න ඕන.."

"පුංචෝ... අපිට වුණත් සාරා ඇන්ටිව එහෙම වැරදිකාරයෙක් කරන්න හිත දෙන්නේ නෑ... ඒකයි අපිත් බලෙන්ම අනුජ්ව මේ ගමන එක්කන් ආවේ.."

"අනිත් එක අනුජ් ඇත්ත දැන ගන්න එකෙන් ආකාශ් අංකල්ට වුණත් සැනසීමක් දැනෙයි. මේ දෙන්නා දැන් ගෙදර ඉන්නේ අමුත්තෝ ගානට."

"මට තේරෙනවා පුතා ඔයාලා කියන දේ... මෙතනදි මාත් ඉන්නේ ඔයාලාගේ පැත්තේ. මොකද අනුජ් මේ සාරාට චෝදනා කරන්නේ කිසි දෙයක් නොදැන. මට විශ්වාසයි ඇත්ත දැනගත්තම එයා ගොඩක් පසුතැවෙයි. සාරාට කිව්ව වචනයක් ගානේ එයා පසුතැවෙයි. අනුජ් ඔයාලාගේ යාළුවා වගේම සාරා මගේ යාළුවා ඉතිං මාත් කැමතියි මගේ යාළුවට හොඳක් කරන්න..."

"ඒ කියන්නේ පුංචි අපිට ඒ කතාව කියනවද?"

නිම්නා සතුටින් ඇසුවාය.

"ඔව්. මං කියන්නම්. හැබැයි ටික ටික. මොකද ඒ වළදාපු අතීතේ සාරාට වගේම මටත් ඒ තරම් සුන්දර එකක් නෙමෙයි."

"පුංචි... අපිට ඔයාට බල කරන්න බෑ..." දර්ශී කීවේ දුක්බරව සිටින පුංචිගේ අතක් මත සුරත තබමිනි.

"නෑ දරුවෝ... මං මේක කරන්නම ඕන. මගේ යාළුවා වෙනුවෙන්..."

"අනේ ඔයාට පිං පුංචි..."

"හරි හරි දරුවෝ... අනුජ්ටත් හිමීට කතා කරන් එන්න. රෑ කෑම කාලා අපි කතා කරමු."

******************

"සාරා... පුංචි කාලේ ඉදලම ඉගෙන ගන්න හරි දක්ෂයි. ඒ වගේම එයාලාගේ පවුලත් ගමේ හොඳ වැදගත්

පවුලක්. සාරා වුණත් හැමෝගෙම හොඳ හිත දිනාගෙන තමන්ගේ තත්ත්වේ තියාගෙන හිටියා...

ඒත් ආකාශ් අයියා... එයා ඊට හාත්පසින්ම වෙනස් කෙනෙක්. නිකම් ගමේ ඇවිද ඇවිද හිටියේ ඒ කාලේ. සාරාට වැඩියෙන් අවුරුදු ගාණක් වැඩිමල්. හිටියේ සාරාගේ ගෙදරට ගෙවල් දෙක තුනකට එහා. මොනවා වුණත් එයාලාගේ පවුල් දෙක හරි එකතුයි.

කාලයක් යනකොට ගොඩක් දේවල් වෙනස් වෙන්න පටන් ගත්තා. මතක හැටියට මේ දේවල් මුලින්ම පටන් ගත්තේ අපි සාමාන්‍ය පෙළ පන්තියේ ඉද්දී...”

******* වසර ගණනාවකට පෙර...*******

# 05.

"සාරා... ඔය හැදීගෙන එන ලෙඩේ නම් ඒ තරම් හොඳ නෑ... ඉක්මනටම බෙහෙතක් ගන්න වෙනවා..."

මධූ කියද්දී සරසි සිනාසුණාය.

"අනේ පලයං බං.."

"පලයං තමයි... ඇත්තටම උඹට පිස්සු හැදීගෙනවත් එනවද කියපං මට... අර කොහෙවත් යන පිස්සෙක් ගැන හීන බලන්න පටන් ගත්තේ.."

මධූ දිගටම බනින්නට වූවාය. සරසිගේ සිතේ ආකාශ් ගැන හැඟීමක් ඇති බව ඇයට දැනී තිබුණද ඒ බැව් ඇය හරියටම දැන ගත්තේ එදිනයි.

"අයියෝ... කෑ ගහන්න එපා බං. අම්මිට ඇහෙයි. ඊට පස්සේ ඉතිං මෙතන ලෝක විනාසේ පටන් ගනියි..."

"ඇහෙන්න තමයි තියෙන්නේ.."

"හරි හරි... උඹ මෙතන වැලපෙන්නේ නැතුව ඉදපංකෝ... මං එයා එක්ක යාළු වුණේ නැනේ... අනික එයා මගෙන් එහෙම දෙයක් ගැන ඇහුවෙත් නෑ..." සරසි සිනාසෙමින් කීවාය.

"උඹ හිනාවෙයං... ඔය තාම වෙලා නැති ඒවා ඉස්සරහට වුණාට පස්සේ උඹට තව සතුටු හිතෙයි." මධූ කීවේ අමනාපයෙනි.

වෙසක් පොහොය දින සරසිගේ නිවසේ සියල්ලන් සූදානම් වූයේ මිහින්තලය වදින්නට යාමටය.

"සාරා... ඉන්දු අක්කලාටත් ගිහින් කියන්න පාන්දරින්ම ලෑස්ති වෙන්න කියලා..." සරසිගේ අම්මා පෙරදා හැන්දෑවේම කීවාය.

ඉන්දු ආකාශ්ගේ සොයුරා සමඟ විවාහවී වැඩි කලක් නොවුණද සරසි ඇයත් සමඟ ඉක්මනින්ම මිතුරු වී සිටියාය.

උදෑසන සියලු දෙනා වාහනයට නැඟුණද සරසි තවමත් නොමැති නිසා සරසිගේ පියා වාහනයෙන් බැස කෑ ගැසුවේය.

"දෝණී..."

"විනාඩියක් දෙන්න තාත්ති.. කොණ්ඩේ පීරනවා මං..."

"ඔය කොණ්ඩේ යන ගමන් පීරනවා අක්කේ... පරක්කුයි නේ..." මේ කෑ ගසන්නේ සරසිගේ මල්ලි හිමරු ය. ඇය සරසිට වඩා වසර තුනකින් බාල වූවේය.

"අනේ මේ... තමුසේ නටන්නේ නැතුව ඉන්නවා..." මල්ලිට බනිමින් සරසි දොරත් වසාගෙනම එළියට ආවාය.

තවමත් පරිසරයේ ඇත්තේ දැඩි අඳුරකි. එක දවසේ ගමන නිසා මේ ගමන මහා පාන්දර පිටත් වෙන්නට ඔවුන්ට සිදුවිය.

"නගින්න සාරා..." ආකාශ්ගේ සොයුරා කීවේ වෑන් රථයෙන් බැස සරසිට ඉඩ දෙමිනි.

ඉඩක් තිබුණේ එතැන පමණය. පසුපස අසුන්වල අම්මලාත් ආච්චි අම්මලාත් ඉන්දු අක්කාත් වාඩි වී අවසන් ය. මල්ලී තාත්තාත් සමඟ ඉදිරියේය. ඉඩ ඇත්තේ පළමු අසුනේ ආකාශ්ටත් සංජීවටත් මැදිවය. සංජීව ඇයට මැද අසුන දුන්නේ ඇයට දොර අසල යාමට අපහසු බව දන්නා නිසාමය.

"මං දැන් යන්න ඕන මේ දෙන්නාගේ මැද්දේද?"

"පරක්කු වෙලා ආවානම් ඉඩ තියෙන තැනකින් ඉඳගන්න අක්කේ වද නොදී.." හිමරු කියද්දී සරසි ඔහුට විරිත්තා වාහනයට නැඟුණාය.

ඇත්තටම මේ ලෙසින් ආකාශ් අසලින් වාඩි වී යන්නට ඇය ආසා කළාය. ඉඩ තිබෙන්නේ එතැන බව දකිද්දී සතුටක් දැනුනද ඇය ඒ බවක් නොපෙන්වූවාය. සංජීව සිනාසෙමින්ම දොර වසාගෙන වාඩි වූවාය.

"නංගි... ඔතන ඉන්න බැරි නම් මෙතනට එන්න. මං බබා එක්ක ඔතනට එන්නම්..." ඉන්දු පසුපස අසුනේ සිට එබී බලා කීවාය.

"අපෝ... ඔයාටත් පුදුම ඊර්ෂ්‍යාවක් නේද තියෙන්නේ?"

"මොකක්? මොකටද ඊර්ෂ්‍යා?" ඉන්දු ඇසුවේ පුදුමයෙනි.

"මං ඔයාගේ මහත්තයා ළඟ වාඩි වෙලා යන එකට..."

"අපෝ ඔව්... මට වැඩේමයි."

ආකාශ් මේ කතාවලට සම්බන්ධ නොවී කවුළුවෙන් පිටතට නෙත් යොමාගෙනම උන්නේය. සරසි වරක් දෙවරක් ඔහු දෙස බැලුවද ඔහුට වගක් නැත. 'පුහ්... මේකාගේ ආඩම්බර...' තමාටම මුමුණාගත් ඇය බෑගයේ තිබූ දුරකතනය අතට ගෙන එයට හිස ඔබා ගත්තාය.

"සාරා... දැන් විභාගෙටත් ළඟයි නේද?"

"ඔව් ලොකු අයියේ... ක්ලාස් ඉවරයක් නෑ... දැන් අද ගිහින් ඇවිත් හෙට ආයේ යන්න ඕන..."

"ඒවා ඉතිං කර ගන්න එපැයි.. අපේ සාරා ඉතිං කොහොමත් කැම්පස් ගිහින්ම තමයිනේ නවතින්නේ..." ඔහු කීවේ තම නැඟණියක මෙන් සෙනෙහසින් ඇයගේ හිස අතගාමිනි.

"ඒක නෙමෙයි සාරා... ආරංචිද අළුත්ම ඇක්ෂන් මූවි එක ගැන?"

"ඇක්ෂන් මූවි එක? ඒ මොකක්ද?"

"ඇයි අර ෆේස් බුක් එකේ ගිය වීඩියෝ එක දැක්කේ නැද්ද... අර හන්දියේ කඩේ ළඟ සීන් එක..."

"ආපෝ... මං දැක්කා... මිනිස්සුන්ට එහෙමත් ගහගන්න පුළුවන්ද අප්පා... ෂික් මූණු ටික පැහැදිලි නෑනේ ඒකේ. නැත්තං බලා ගන්න තිබ්බා ඔය මහ ලොකු චණ්ඩි ටික කවුද කියලා..."

"ආයේ මොනවා බලන්නද... ඔය එහා පැත්තේ ඉන්නේ මහ චණ්ඩියා..."

සංජීව එසේ කියද්දී සරසි ආකාශ් දෙස බැලුවේත් ආකාශ් සරසි දෙස බැලුවේත් එකවරමය.

"ඔයා..." සරසි තොල් සෙලවූවා පමණි.

“මටත් ආරංචියි කතන්දරේ... ආකාශ්ට තුවාලත් වෙලා තිබ්බා නේද? අනේ මන්දා මේ ළමයි.” සරසිගේ තාත්තා වාහනය පදවන අතරේම කීවේය.

“බොරුකාරයා...” සරසි කීවේ ආකාශ්ට පමණක් ඇසෙන්නට ය.

“ඇයි එහෙම කියන්නේ?”

“ඇයි තමයි... ඔය කකුලේ තුවාලේ මොකක්ද ඇහුවම බයික් එකෙන් වැටුණා කිව්වා නේද? මැරයා...”

කුටු කුටු ගාමින් ආකාශ්ට බැණ වැදුන ඇය ඉවත බලා ගත්තාය.

සැහෙන දුරක් ගිය පසු තාත්තා වාහනය නතර කළේ කඩල දන්සැලක් අසලය. තාත්තාත් සමඟ සංජීවත් ආකාශුත් දන්සල වෙත යද්දී සරසි අසුනේ ආකාශ් සිටි කොනට වූවාය.

කඩල ගොටු කීපයක් රැගෙන ආ ආකාශ් කිසිවක් නොකියා මැද අසුනේ වාඩි වී පසුපස සිටි අයට ඒවා දුන්නේ

එකක් තමා අත ඉතිරි කර ගනිමිනි. ඔහු එය සරසි වෙත පෑවද ඇය උන්නේ ඉවත බලාගෙනය.

"සාරා... ආ... කන්න."

සරසි ඔහු දෙස බැලුවේ තවමත් පහව නොගිය අමනාපයෙනි.

"මට එපා..."

"අනේ කන්න ළමයෝ..."

"එපා... මං කිව්වානේ මට එපා කියලා..." කියා ඇය නැවතත් ඉවත බලා ගත්තාය.

"අපේ එක්කෙනා ඕවා කන්නේ නෑ ආකාශ්.."

සරසිගේ අම්මා කීවේ සිනාසෙමිනි.

"අපෝ ඔව්... එයා ඉතිං කොළඹ නෝනා නේ... ඔයාට කන්න බැරි නම් ඔය ටිකත් මට දෙන්න ආකාශ් අයියේ.."

හිමරු කීවේ සරසිව තවත් කේන්ති කරන්නට සිතාගෙනය.

වාහනය මිහින්තලය වෙත ළඟා වද්දී මදක් දවල් වී තිබුණි. සරසි ඉක්මනින් වාහනයෙන් බැස වටපිටාව බලන්නට වූවාය.

"නංගි... දෝණිව ටිකකට ගන්නවද?"

ඉන්දු කිවේ මේ තරම් දුරක් එකම ඉරියව්වෙන් දරුවාත් තබාගෙන ආ නිසා මදක් අපහසුවෙනි.

සරසි ඉක්මනින් දියණියව වඩා ගත්තේ ආදරයෙනි. උපන්දා සිටම සරසි හැම විටම දියණිය අසලම රැඳුණ නිසා ඇයටත් සරසි ඉන්නවා නම් අම්මා මතකත් නැත.

"තාත්තී... අයිස් එකක්."

"එද්දී අරන් දෙන්නම් හිමරු. තාම මේ ආවා විතරයි. ඔයා දැන් ආයේ එද්දිත් නැත්තං අයිස් ඉල්ලනවා..."

"හොඳ වැඩේ නේද දෝණී?" කියමින් දරුවාත් සමඟ සිනාසෙමින් සරසි අරලිය ගස් පෙළට මැදි වූ ගල්

පඩිපෙළ නඟින්නට වූවාය. එහෙත් වැඩි දුරක් යන්නට වූයේ නැත.

"සාරා..."

ගල් පඩියක හැපී වැටෙන්නට ගිය සරසිව සංජීව ඉක්මනින් ඉදිරියට පැන අල්ලා ගත්තේය.

"කෝ මෙහෙට දෙන්න දෝණිව..." කී ආකාශ් ඉක්මනට දෝණිව අතට ගෙන පඩිපෙළ නඟින්නට වූවේය.

සරසි සිටින්නේ තමා සමඟ අමනාප වී බව ඔහු දනී. ඔහු ඇයට මදක් පසුපසින් ආවේ ඒ නිසාය. දරුවා අතට ගෙන ඇයට කෙසේදැයි කියාවත් නොබලා ඔහු පඩිපෙළ නැඟගෙන ගියේය.

ටික දුරක් යද්දී සරසි "ආව්..." කියමින් කකුලත් අල්ලාගෙන නතර වූවාය.

"ඇයි දෝණී..?"

"කකුල තුවාල වෙලා අම්මී... රිදෙනවා.."

"කෝ බලන්න.."

කියා සරසිගේ කකුල බැලූ තාත්තා නියපොත්තක් කැඩී ලේ ගලමින් තිබූ ඇඟිල්ල ලේන්සුවකින් බැන්දේ පහලට ගොස් බෙහෙත් දමන තුරුය.

ඇය පඩිපෙළේ ඉතිරි ටික නැග්ගේ තාත්තාගේ උදව්වෙනි. චෛත්‍ය අසලටම පැමිණි පසු ඇය තාත්තාගේ අත අතහැර තනිවම ඇවිද ගියාය.

අනික් සියලු දෙනාටම පෙර චෛත්‍ය වැඳ අවසන් වූ සරසි තනිවම චෛත්‍ය අසල පඩිපෙළ බැස පහළ වැලි මළුවේ ගලක් මතින් වාඩි වූවාය.

ටික වෙලාවකින් ඉන්දු දරුවාත් වඩාගෙනම ඇය වෙත ආවේ අනිත් අය ආරාධනා ගලට නඟිද්දීය. ඇයත් සරසි අසලින්ම වාඩි වූවාය.

“මොකද මෙතන?”

“නිකං...”

“ආරාධනා ගලට නඟින්න ඕන කිය කිය නේද ආවේ? අන්න අර කට්ටිය ගියා.”

"මට බෑ අනේ දැන්. මහන්සියි. තුවාලෙත් රිදෙනවා... කෝ අපේ අම්මිත් නැග්ගද?"

"නෑ... අන්න අම්මිලා ආච්චිලා කට්ටියම පහලට බහින්න පටන් ගත්තා. මාත් යන්න ගිහින් ඔයාව දැකලා ආවේ.."

"අක්කට ගලට නගින්න තිබ්බේ. දෝණිව මං තියා ගන්නම්.."

"දෝණිව තියාගෙන කරගත්ත හරිය මදැයි. ඔන්න ඔහේ ඉමු..."

"හ්ම්..."

සරසි මේ උන්නාට ඉන්නේ ආකාශ්ගේ වැඩ ගැන කේන්තියෙන් බව ඉන්දු මුල සිටම දැන උන්නාය. දෙදෙනාගේම දෙදෙනාට කුමක් හෝ ආකර්ෂණයක් ඇති බව ඉන්දු දුටුවේ දැන් ටික කාලයක සිටය.

"ඔයාට තියෙන්නේ මහන්සිය නෙමෙයි.. තරහා නේද?"

"අනේ මං ඇයි තරහා ගන්නේ? අනික කා එක්කද?"

"වෙන කවුද අපේ ආකාශ් එක්ක."

"අනේ මං මොකටද එයා එක්ක තරහා ගන්නේ... මොනවා බෙදා ගන්න බැරුවද..."

"ඔයාලා දෙන්නටම බෑ මට බොරු කරන්න... මාත් ඔය වයස පහු කළානේ... මං ඔයාට මෙහෙම කියන්නම්, කේන්ති අරන් තේරුමක් නෑ නංගි. ඒත් මට එකක් කියන්න පුළුවන්. ඔයා ටිකක් උත්සහ කළොත් ඔයාට තමයි පුළුවන් එයාව ඔය ගෙවන ජීවිතෙන් ගලව ගන්න."

ඉන්දුගේ කතාවට පිළිතුරක් දෙන්නට සරසිට ඉඩක් නොලැබුණේ ආකාශ් ඔවුන් වෙතට ආ නිසාය.

"යං යං... අනිත් අය අන්න යනවා... මේ දෙන්නා කෝප්ප හෝදනවා..."

"මාර වැඩේ මල්ලී.. සාරාව වඩාගෙන තමයි යන්න වෙන්නේ.."

"ඇයි අක්කා?" ආකාශ් ඇසුවේ සරසි වෙතට නෙතු යොමු කරමිනි. සරසි ඒ කතාවට ඉන්දු දෙස රවා බැලුවාය.

"කකුලේ තුවාලේ රිදෙනවලු..."

"ඇත්තද සාරා?"

ඔහු ඇසුවේ ඇය වෙත බලමිනි. එසේ නම් ඇය ආරාධනා ගලට නඟින්නට නොආවේ ඒ නිසා වන්නට ඇත. 'අපරාදේ... මට ටිකක් බලලා එක්කන් යන්න තිබුණා. ආසාවෙන් හිටියේ යන්න.' ඔහු තනිවම සිතුවේය.

"අනේ මේ... මට තනියම යන්න පුළුවන්.."

සරසි ඉක්මනින් වාඩි වී උන් තැනින් නැඟිට්ටාය. නමුත් ඇයගේ කකුල හිරි වැටී තිබුණ නිසා අඩිය තැබුණේ නුහුරටය. සරසි වැටෙන්නට යද්දී ආකාශ් ඇයව අල්ලා ගත්තේය.

"ඔය ඉතිං.. පණ්ඩිතයිනේ..."

ඉන්දු සිනහවක් පා දියණියත් වඩාගෙන පහළට යන්න වූයේ ඔවුන් දෙදෙනාට නිදහසේ එන්නට ඉඩ හරිමිනි. සරසි ඔහුව අතහැර තනිවම සිට ගන්නට උත්සහ කළේ අමනාපයක් පෙන්වමිනි.

"බොරුවට පුපුරන්නේ නැතුව එනවා යන්න." කී ආකාශ් උරහිස වටා අත යවා ඇයව ළං කර ගත්තේය.

සරසි ඔහුගේ අතින් මිදෙන්නට හැදුවේ අක්කා කී ලෙසට ඔහු තමාව වඩාගනීවි යැයි බියෙනි. එය වැටහී ආකාශ්ට සිනහවක් නැඟුණි.

"හරි හරී බං. වඩා ගන්නේ නෑ. අල්ලගෙන යන්නම්. නැත්තං ඔහොම ගිහින් දඩබඩ ගාලා පහළට රෝල් වෙයි..."

# 06.

කවදාවත් නැතිව එදා මධූ පුස්තකාලයෙන් එළියට ආවේ තනිවමය. වෙනදා නම් නොවරදාම සරසිත් ඇය සමඟින් එන්නීය.

ආකාශ් පුස්තකාලයට ආවේ පොතක් සොයන්නට ය. ඔහු දැන් මාස කීපයක සිටම ව්‍යාපාරක් ආරම්භ කිරීමට තොරතුරු රැස් කරන්නේ ඉන්දු අක්කාගේ කීමටය.

"ආ... මධූ නඟා.. මොකෝ තනියම.."

"තනිවයි උපන්නේ... තනිවයි මැරෙන්නේ..." මධූ කීවේ ඔහු අසන්නේ සරසි නැත්තේ ඇයි කියා බව දැන දැනය.

"කෝ අර නපුරි?"

"සාරා ආවේ නෑ අනේ අද.."

"ඒ මොකද? දෙන්නා තරහා වුණාද?" ආකාශ් ඇසුවේ ඉදහිටක දෙන්නා එසේ තරහා වූ දවස්ද තිබූ බැවිනි.

"නෑ අනේ.. එයාගේ හිත රිදිලා. ආයේ එළියට බහින්නේ නෑ කියන්නේ.."

"ඇයි ඒ... මොකක්ද සීන් එක? නැන්දා එක්ක වලියක්ද?"

"නෑ... මටත් විස්තරේ කිව්වේ නැන්දා. සාරාගේ ෆෝන් එකවත් ගන්නේ නෑ.."

"එච්චර හිත රිදෙන්න තරම් මොනවද නංගි වෙලා තියෙන්නේ? මේ ටිකේ පේන්නවත් හිටියේ නෑ තමයි මේ කෙල්ල." ආකාශ් ඇසුවේ බැරෑරුම් ස්වරයෙනි.

"බලන්නකෝ ආකාශ් අයියේ.. මේ ගමේ එකියක් මහ ජරා කතා ටිකක් කියලා අපේ සාරා ගැන.."

"මොනවද කියලා තියෙන්නේ?"

"සාරාට කොල්ලෙක් ඉන්නවා... වැඩේම ඒ කොල්ලා එක්ක තැන් තැන්වල යන එක. කොළඹ පන්ති කියලා යන්නේ කොල්ලොන්ව හම්බෙන්න... විභාගේ පාස්

වුණොත් නම් පුදුමයක්... අරවා මේවා ගොඩක්... පුදුමයි ඔයාලට තාම ආරංචි වෙලා නෑ... මටත් යාළුවෝ දෙතුන් දෙනෙක් කිව්වා මෙහෙම කතාවක් යනවා කියලා.."

"කවුද කියලා තියෙන්නේ කියලා දන්නවද?" ආකාශ් ඇසුවේ මැඩගත් කෝපයෙනි.

"අපිට ආරංචි වුණ විදිහට නම් අර බනුරි.."

"බනුරි! අපේ මේ හර්ෂලාගේ ?" ආකාශ් පුදුමයෙන් අසද්දී මධූ 'ඔව්' කියන්නට හිස වැනුවාය.

මදක් කල්පනා කල ඔහු පුස්තකාලයට යන ගමන නවතා ආපසු හැරුණේය. ඔහු වේගයෙන් මොටර්බයිසිකලය වෙත යද්දී මධූ ඔහුට කතා කළාය.

"අයියේ..."

"පරිස්සමින් ගෙදර යන්න නංගි..." කියූ ඔහු බයිසිකලය පනගන්වා ගත්තේය.

"අද ඉවරයි වගේ.." මධූ ඔහු යන දෙස බලාගෙන තනිවම මිමිණුවාය.

ආකාශ් කෙලින්ම ගියේ තම මිතුරා ගයාන්ව සොයාගෙනය. ගයාන්වත් රැගෙන ඔහු පිටත් වූයේ හර්ෂගේ නිවසට යාමටය. බනුරි යනු හර්ෂගේ සහෝදරියයි.

බයිසිකලය නවත්වන විට හර්ෂ ඉදිරියට ආවේ සිනහා මුසු මුහුණිනි.

"ආ... මේ දෙන්නට අපිව මතක් වෙලා තියෙන්නේ..."

"ඔව් ඔව්... උඹට මතක් කරලා දෙන්න තමයි අපි මේ ආවේ..." ගයාන් බයිසිකලයෙන් බහින අතරේ කීවේය.

"මොකක්?" හර්ෂ  ඇසුවේ පුදුමයෙනි.

"නිකං හිටපං බං..." අකාශ් ගයාන් දෙස බලා කීවේය.

"කෝ උඹලාගේ නංගි?"

"ගෙදර ඉන්නවා ආකාශ්. ඇයි මොකක්ද අවුල?"

"උඹ අයියා කෙනෙක් විදිහට ඒකි කරන කියන දේවල් ගැන හොයලා බලන්නේ නැද්ද බං?"

"ඒකි ගැන මොනවා හොයන්නද බං... මට දැන් කියලම ඇති වෙලා... ලෝකේ කාලා වතුර බීලා ඉන්නේ..."

"ඒක නම් ඇත්ත හැබැයි..." ගයාන්ට ඉබේටම කියවුණේය.

"මොකක්ද ප්‍රශ්නේ බං? ඇයි අපේ ඒකී ගැන හොයන්නේ?"

"හොයන්නෙද? එල්ලලා මරන්න.."

"කටවහං හිටපංකෝ ගයානයා ටිකක්.." ආකාශ් ටිකක් සැරෙන් කීවේ ගයාන්ගේ කතාවලට හර්ෂ පුදුමයෙන් ආකාශ් දෙස බලද්දීය.

ගයාන් කටපියා ගනිද්දී ආකාශ් සිදුව ඇති දේ හර්ෂට විස්තර කර කීවේය. ඔහු එය අසා උන්නේ පුදුමයෙනි.

"සරසි නංගිට එහෙම කතාවක් කියන්න ඒ ළමයා මේකිට මොන වරදක් කරලද..." හර්ෂ කීවේ බනුරි ගැන උපන් කේන්තියෙනි.

එවිටම බනුරි නිවසින් පිටතට ආවේ මිදුලේ කතා කරන්නේ කවුරුන්දැයි බලන්නටය. ඇයව දුටු ගයාන් ඇයට අත වනා ළඟට කතා කර ගත්තේය.

"ඇයි?"

"නංගි මේ... අපිට ආරංචියක් ආවා අර සරසි ගැන... එයාට කොල්ලෙක් ඉන්නවා.. කොළඹ ගිහින් කොල්ලෝ එක්ක ඉන්නවා කියලා... ඒක ඇත්තද?"

"ඔයාලා ඇයි ඒක මගෙන් අහන්නේ? මං එයාගේ කවුරුවත් නෙමෙයි නේ.." ඇය අමනාපයෙන් කීවාය.

"එයාගේ නම් කවුරුවත් නෙමෙයි තමයි. ඒ වුණාට ඒ කතාව කියලා තියෙන්නේ උඹෙනේ නංගී..."

"මං...? කවුද කියන්නේ? ඔයාලාට වැරදීමක් වෙලා."

"මේ නංගී... මං සේරම දැනගෙන ඇවිල්ලා මේ කතා කරන්නේ... අනුන්ට පද හදන්න එපා බං. ඒ කෙල්ල උඹට මොන වරදක් කලාටද?"

"මං කාටවත් හදපු කතාවක් නෑ... ඔයාලාට පිස්සුද?"

"මේ බනුරි... උඹට රට වටේටම කොල්ලෝ ඇති. එහෙමයි කියලා වැදගත් විදිහට පැත්තකට වෙලා ඉන්න එවුන්ට කතා හදන්න එපා. ඒකි වැදගත් විදිහට හැදෙනවා උඹලාට බලන් ඉන්න බෑ... උඹලට ඕන ඒ කෙල්ලත් ඉන්නේ උඹලාගේ වලේ කියලා පෙන්නන්න. මං උඹට මේ පළවෙනි සහ අන්තිම වතාවට කියන්නේ.. ආයේ සාරා ගැන වචනයක් හරි කියලා අහුවුණොත්.. මං උඹේ අයියා මගේ යාළුවා කියලා බලන්නේ නෑ.. අන්න ඒක මතක තියා ගනිං..."

කියූ ආකාශ් බයිසිකලයට නැඟී හර්ෂ දෙස බැලුවේය.

“සමාවෙයං බං... මුන්ට මේවා මීට වැඩිය හොඳට කියන්න මං දන්නේ නෑ...”

“ඒවා හිතන්න එපා බං... මාත් මේක දැන්නේ දන්නේ... ඉතුරු ටික මං මේකිට කියලා දෙන්නම්...”

*************************

මධූට සරසිව බලන්න යන්නට ඉඩක් ලැබුණේ හැන්දෑවේය. ඇය උදේ ආකාශ් හමුවූ අයුරුත්, කතා කළ දේවලුත් සරසිට කීවාය.

“මොකක්?”

“ඔව් බං. ඒක ඇහුණ ගමන් බයික් එකට නැග්ගා ගියා... පුස්තකාලෙට යන්න ගිය ගමනත් නවත්තලා ගියේ...”

“යන්න ඇති එහෙනම් බනුරිලාගේ ගෙදර...”

“න්නෑ... “

"මං හිතන විදිහට නම් ඉතිං..."

"ඔව් ඉතිං කියන්න බෑ..."

කියමින් මධූ සිනාසුණාය. සරසිගේ දුරකතනය නාද වන්නට වූයේ ඒ මොහොතේය. තිරයේ දිස්වුණේ නාඳුනන අංකයකි.

"කවුද?"

"දන්නේ නෑ බං..."

"අරං බලපං.."

සරසි ඇමතුමට සම්බන්ධ වූයේ මධූටත් ඇසෙන සේ එහි හඬ වැඩි කරය.

"හෙලෝ..."

"හෙලෝ .. සරසි බස්නායක?"

"ඔව්.."

"ලොකු මැඩම්... මං කියන දේ හොදට අහගත්තොත් හොඳයි.."

එහා පසින් කතා කළේ තරුණියකි. අහලා පුරුදු කටහඬක් වුවද සරසිට එකවරම ඇයව හදුනා ගැනීමට අපහසුය. ඒ නමුත් මේ කතා කරන්නේ දන්න කෙනෙක් බවට නම් විශ්වාසය.

"ඉතිං අහන්න ඔයා මොකුත් කිව්වේ නෑ නේ..." සරසි කීවේ මද සිනහවක් නඟමිනි.

"එහෙනම් අහගන්නවා.. මැඩම් හරි චණ්ඩියෙක් වෙලා නේද අපේ ගෙවල් වලටම මැරයෝ එවන්න..."

"මොකක්?" සරසිට කියවුණේ පුදුමයටම ය.

"බොරුවට මොකක් හොකක් ගාන්න එන්න එපා සරසි. ආකාශ් මහ ලොකු චණ්ඩියෙක් කියලද ඔයා හිතන් ඉන්නේ? මං ඒකාට බය වෙයි කියලා හිතුවද? එහෙනම් ඔයාට වැරදිලා සරසි..."

"මේ... කරුණාකරලා මට කියනවද ඔය කවුද කියලා..."

"දන්නේම නෑ... ඔයා බබා. අර ආකාශ් කියන බේබද්දාව මට බනින්න එව්වේ මං කවුද කියලා දන්නේ නැතුව වෙන්න ඇති..."

සරසිට මදහසක් නැඟුණේ මේ කතා කරන්නේ කවුරුන්දැයි සිතට එද්දීය. 'මං හිතුවා හරි. මේ පිස්සා එහෙනම් එහෙට තමයි ගිහින් තියෙන්නේ..'

"ආ... එහෙනම් මේ අර බනුරි වෙන්න ඇති නේද? ආකාශ් බේබද්දෙක්ද මැරයෙක්ද නැද්ද කියන එක ගැන මං බලා ගන්නම්.. ඔයා ඒ ගැන කලබල නොවී ඉන්න."

"හහ්... මේ සරසි.. තමුන් හිතුවද මට එහෙම කැසිල්ලක් තියනවා කියලා..."

"එහෙමද මෙහෙමද කියන්න මං දන්නේ නෑ... හැබැයි ඉතිං ඔයා කරලා තියෙන වැඩත් එක්ක නම් මට පේනවා ඔයාට මොකක් හරි ප්‍රශ්නයක් තියනවා කියලා.. නැත්තං මේ අහක ඉන්න මට පද හදන්නේ මොකටද..."

"අනේ මේ...තමුන් මං කිව්වයි කියලා හිතා ගන්නවා..."

"මොනවා හිතන්නද? අමුතුවෙන් හිතන්න දෙයක් නෑ. හිතන්න ඕන ටික මං හිතාගෙන ඉවරයි. තියන්නං හොදේ.."

කියූ සරසි දුරකතනය ඇඳ මතට විසි කළේය.

'ආවා මෙතන මඟුලක් කතා කරන්න...' සරසි තනිවම කුටු කුටු ගගා බනිද්දී මධූ ඇයගේ උරහිසට තට්ටු කළේ ඇයව මදක් සන්සුන් කරන්නට ය.

# 07.

“දැන් හිතං ඉන්නේ හරි ලොකු වැඩක් කළා කියලද? මොකක්ද ඒ කළේ? ඔයා මහ ලොකු චණ්ඩියෙක් කියලා පෙන්නලා එන්නද ගියේ? මං ඔයාට කිව්වද එහෙම ගමනක් යන්න කියලා? අඩු තරමේ එහෙම දෙයක් වුණා කියලවත් මං ඔයාට කිව්වද? ඇයි එහෙම කළේ ආ..?”

ආකාශ්ට දුරකතන ඇමතුමක් ගත් සරසි කියාගෙන කියාගෙන ගියේ ඔහුට හිතන්නටවත් ඉඩක් නොතබාය.

“මං... සාරා... මේ...ඔයා..”

“මොකද දැන් ගොත ගහන්නේ? හිතුවේ මං මේ දේවල් දැන ගන්න එකක් නෑ කියලද... ඒවා කොහෙද මාත් එක්ක..”

“සාරා... ඔයා ඒ ගැන හිතලා දුක් වෙන නිසයි මං එහෙම කළේ.. ඔයා ගෙදරින් එළියටවත් බහින්නේ නැතුව ඉන්නේ ඒකි කියපු කතාව නිසානේ...”

"මුලින්ම මට මේක කියන්න ආකාශ් අයියේ ඔයා මට වඩා අවුරුදු කීයක් වැඩිමල්ද? ඔයා හිතන්නේ දැන් සේරම හරි.. මං හරිම සතුටින් කියලද? එහෙනම් රෑ වෙලා මේ පැත්තේ එන්න. අපි පාටියක් එහෙම දාමු සතුට සමරන්න."

කී සරසි දුරකතනය තැබුවාය.

"මල මඟුලයි බං..." ආකාශ් කීවේ ගයාන් වෙතට හැරෙමිනි.

"මොකද පුතා වුණේ... වඳින්න ගිය දේවාලේ ඉහේ කඩන් වැටුණද?"

"ඒ වගේ තමයි... සාරා කේන්තියෙන් කතා කළේ..."

"මං උඹට කිව්වා.. තව ටිකක් හිතපං කියලා... කොහෙද ඉතිං ගාල කඩා ගත්ත වස්සා වගේ ගියානේ ගේම ඉල්ලන්න..."

ගයාන් කීවේ අසල වූ ගලකට පයින් පහරක් ගසන අතරේය.

sinhalaebooks.com

**වසර 04 කට පසු**

ආකාශ් කුඩාවට පටන් ගත් ඇඟළුම් ව්‍යාපාරය බලා ඉද්දීම දියුණුවට පත් වූයේ වසර හතරක ඇවෑමෙන් ආකාශ් ප්‍රදේශයේ ප්‍රසිද්ධ ඇගළුම් කම්හලක හිමිකරුවකු බවට පත් කරමිනි. සරසි ඔහුගේ මේ දියුණුව දෙස බලා හදවතින්ම සතුටු වූවාය.

ඇයද ඒ වන විට විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබමින් සිටියාය. ඇය ගමට ආවේ කලාතුරකිනි.

“මධූ... උඹට පිස්සුද කෙල්ලේ.. ඔය කොල්ලා ඔයත් එක්ක සෙල්ලමක් කරන්නේ...”

සරසි නිවාඩු ආ දිනයක මධූ ඇය තම පෙම්වතා ගැන කීවේ සතුටිනි. නමුත් සරසිගෙන් ඇයට ලැබුණේ මෙවැනි පිළිතුරකි.

“ඇයි සාරා ඔයා එහෙම කියන්නේ?”

“මධූ... මේ බලන්න ඔය කොල්ලා එක්ක තියෙන සම්බන්ධෙන් අන්තිමට ඔයාට දුක් විඳින්න වෙයි.”

“ඒත් සාරා...”

"මධූ... මට පුළුවන් කියන්න විතරයි. ඔයාට කැමති තීරණයක් ගන්න. ඒත් මිගාර කියන්නේ මොන වගේ කෙනෙක්ද කියන එක ගැන මට වඩා හොඳට ඔයා දන්නවා.." කී සරසි එතැනින් කතාව නතර කළාය.

සරසිට මෙන් විශ්ව විද්‍යාලයට යාමට වරම් නොලැබුණද මධූ හොඳින් ඉගෙන ගත්තාය. කුඩා කල සිටම තම මිතුරියගේ සිතුම් පැතුම් ගැන දැන සිටි හෙයින්ම සරසි මේ සම්බන්දයට දැඩි ලෙස විරුද්ධ වූවාය.

"සාරා... ඇයි කියන්න සාරා ඔයා ඔහොම කතා කරන්නේ? මිගාර මාව රවට්ටන්නේ නෑ... එයා මට ඇත්තටම ගොඩක් ආදරෙයි..."

මධූට හැඟුණේ සරසි තම පෙමට විරුද්ධව කතා කරන දූකටය.

"අඬන්න එපා මධූ.. මං කියන දේ කල්පනා කරලා බලන්න. ඔයා පස්සේ දුක් විඳිනවා බලන්න බැරි නිසයි මං මෙහෙම කියන්නේ.. අනික මිගාරට වඩා කොච්චර හොඳ කෙනෙක් ඔයාට හොයා ගන්න පුළුවන්ද?"

"ඇයි සාරා... මොකක්ද මිගාරගේ තියෙන වැරැද්ද?" මධූ ඇසුවේ කෝපයට පත් හඬිනි. ඇයගේ හඬට සරසිද තිගැස්සී ගියාය.

"මධූ..."

"එක අතකින් ඇයි සාරා මං ඔයා කියන දේ අහන්නේ... ඔයා මගේ යාළුවා. ඒක හරි. ඒත් ඔයා හිතං ඉන්නේ ඔයා කරන්නේ හරි වැඩක් කියලද? අර ආකාශ් ගැන හීන බලන්නේ.. ඒක හරිද එතකොට? ඔයාගේ ළඟින්වත් එයාව තියන්න පුළුවන්ද? මමයි මෝඩ. මං දැනගන්න එපැයි හරි මනුස්සයෙක්ට මේවා කියන්න..."

කියාගෙන ගිය මධූ සරසිට තවත් යමක් කියන්නට ඉඩක් නොතබාම එතැනින් පිට වී ගියාය.

"උඹ මිගාර පෙන්නන බොරු ආදරේට මත් වෙලා මධූ. දවසක උඹම තේරුම් ගනී මං කිව්වේ මොනවද කියලා.."

*********************

අනුජ් සහ මිතුරන් වටකරගෙන අතීතාවර්ජනයේ යෙදී සිටි මධූ කතාව නතර කළේ දෙනෙතට කඳුළු පුරවා ගනිමිනි.

"අනේ පුංචි..." දර්ශි ඇයගේ අතකින් අල්ලා ගත්තේ දුකිනි.

"ඒක තමයි දරුවෝ මේ ජීවිතේ මං කරපු ලොකුම මෝඩකම. එදා මං සාරා කියපු දේ ඇහුවා නම්... මාත් අද කසාඳ බැඳලා ඔයාලා වගේ ලොකු දරුවෝ එක්ක සතුටින් ජීවත් වෙනවා..."

"ඒ මිගාර කියන කෙනාට මොකද වුණේ පුංචි?" නිම්නා ඇසුවේ කුතුහලයෙනි."

"ම්...." මධූ කඳුළු පිසදාගෙන නැවතත් කතාව පටන් ගත්තාය.

***************

සරසි එදා නිවසට යන්නට ගියේ තනිවමය. වෙනදාට නම් මධූ යන්නේ සරසිව ගෙදරට ඇරලවාය. කල්පනා ලොවක තනිවූ සරසි නතිවම නිවසට යන්නට වූවාය.

වැඩි දුරක් යන්නට ලැබුණේ නැත. වේගයෙන් ආ මෝටර් බයිසිකලයක් තම දෙපා අසලම හඩ නංවමින් තිරිංග තද කරද්දී ඇය තිගැස්සී පසුපසට වූවාය.

"මොකෝ මේ බය වෙලා?" ආකාශ් ඇසුවේ සිනාසෙමිනි.

"මොනවා කරනවද මංදා... මං බය වුණා.."

"කෝ අද නැට්ට?"

ආකාශ් වටපිට බලමින් අසන්නේ මධූ ගැනය. ගෙදර ආ විට සරසි මධූ නැතිව ගමනක් යන්නේ නැති බව ආකාශ් දනියි.

"එයා නෑ..."

සරසි බිම බලාගෙන කීවේ දුකෙනි. මේ කොහේවත් යන කොල්ලෙක් නිසා තමාගේ සෙවනැල්ල මෙන් සිටි මිතුරිය තරහා වී යාම ගැන සරසි උන්නේ දැඩි වේදනාවකිනි.

“සාරා...” ආකාශ් බයිසිකලයෙන් බැස ඇය වෙත ආවේ ඇයගේ වෙනස හඳුනාගෙනය.

“ඇයි සාරා මේ... මොකද වුණේ?”

“ මොකුත් නෑ...” ඇය කඳුළු පිසිමින් කීවාය.

“නැති වෙන්න බෑ... ඔයා අඬනවා. නඟිනකෝ අපි යන්. ගිහින් කතා කරමු.” ඔහු යළිත් බයිසිකලය වෙත යමින් කීවාය.

“මං... පයින් එන්නම්...”

“මේ සාරා... මගේ යකා අවුස්ස ගන්නේ නැතුව නඟිනවද නැද්ද?”

ආකාශ් මදක් තදින් කියද්දී සරසි තවත් කිසිවක් නොකියාම බයිසිකලයට නැඟුණාය.

ආකාශ් කෙලින්ම ගියේ  ඔහුගේ ඇඟළුම් කම්හල වෙතය. එහි ඔහුගේ කාර්යාලය වෙත සරසිව රැගෙන ගිය ඔහු ඇය එහි වූ අසුනක වාඩි කරවූවේය.

සරසි වටපිට බැලුවේ පුදුමයෙනි. ආකාශ්ගේ ව්‍යාපාරයේ තොරතුරු අසා තිබුණද ඇයට මීට පෙර මෙහි එන්නට අවස්ථාවක් ලැබුණේ නැත.

“ආකාශ් අයියේ...”

“ඇයි ළමයෝ පුදුම වෙලා... මේක ඉතිං අපේ තමයි..”

“අපේ?”

“ආ... නෑ... මං කිව්වේ මගේ...”

ආකාශ් පටලවමින් කියද්දී සරසි සිත යටින් සිනාසුණාය.

“දැන් මට කියන්න සාරා... මොකක්ද ප්‍රශ්නේ?”

“මොනවා වෙන්නද අනේ ඉතිං... මධූ තරහා වුණා...”

"හේතුව?" ආකාශ් බැරෑරුම් ලෙස අසද්දී සරසිට සිනහා යන්නට ආවේය.

"හේතුව ඇයි මං ඔයාට කියන්නේ?"

"හරි ඉතිං.. මං ඔයාගෙන් අහනවානේ... අනික ඉතිං මං නැතුව..."

ආකාශ් කියන්නට ගිය දේ ගිල ගනිද්දී සරසි දෑස් පුංචි කර ඔහු දෙස තියුණු බැල්මක් හෙළුවාය.

"හරි... ඒක මං කියන්නම් ඔය දෙන්නා තරහා වුණේ ඇයි කියලා කිව්වට පස්සේ."

"හ්ම්..."

# 08.

“මධූ අද ඇවිල්ලා මට කිව්වා එයාගේ බෝයි ගැන. මට ඇහුවම පුදුම හිතුණා එයා අපි හොදට දන්න කෙනෙක් අයියේ.”

“දන්න කෙනෙක්? කවුද?”

“මිගාර”

“මොකක්! මිගාර… මේ අපේ මිගාරයා?”

ආකාශ් ඇසුවේ පුදුමයෙනි.

“ඔව්… මිගාරලු එයාගේ බෝයි.”

“ඇත්තටම මේ කෙල්ලට පිස්සුද සාරා… එයා දන්නේ නැද්ද මිගාර කියන්නේ මොනවගේ එකෙක්ද කියලා? ඔයාවත් එයාට කිව්වේ නැද්ද? ඔයා හිතනවද සාරා ඔය මිගාර මධූ එක්ක දිගටම ඉදියි කියලා?”

"මං කිව්වා අයියේ.. මධූ වුණත් මටත් වැඩිය හොදට මිගාර ගැන දන්නවා. මං බැන්නත් එක්ක. මිගාර මොනවගේ කෙනෙක්ද කියලා දැන දැනත් මධූ එයාටම කැමති වෙලා..." සරසි කීවේ දුකෙනි.

"එයා ඔයා කියන දේ ඇහුවේ නැද්ද ඉතිං?"

"නෑ අයියේ... එයාට කියන්න කලින් මට හැදිලා ඉන්න කියලා මටත් බැනලා යන්න ගියා.."

ඒ කතාවට නම් ආකාශ් තිගැස්සී ගියේය. මධූ ඒ විදිහට සරසිට කිව්වේ ඇයි? ඒ කියන්නේ සරසි එවැනි සම්බන්ධයක් දැනටමත් තියෙනවද?

"ආකාශ් අයියේ...." සරසි කතා කළේ ඔහු තිගැස්සෙනු හොඳින්ම දුටු නිසාය.

"ඇයි සාරා මධූ එහෙම කිව්වේ? ඒ කියන්නේ ඔයාටත් ඒ විදිහේ එෆෙයාර් එකක් තියෙනවද?"

"එෆෙයාර් එකක් නම් නෑ... එයා ඒ කිව්වේ මගේ හිතේ ඉන්න කෙනා ගැන."

"ඒ කවුද කියලා මං ඇහුවට කමක් නැද්ද?"

එය අසද්දී ආකාශ්ගේ කටහඬත් මොකක්දෝ වී තිබුණි. මෙතෙක් බිම බලාගෙන සිටි සරසි හිස ඔසවා කෙලින්ම ඔහු දෙස බැලුවාය.

"දැන් අවුරුදු ගානක ඉඳලා එයා මගේ හිතේ ඉන්නවා... ඒ ගැන මං ඇරුනාම දන්නේ මධූ විතරයි. ඒකයි එයා එහෙම කිව්වේ..."

"ඒ කෙනා?"

ආකාශ්ට දැන් වෙන කතාවලින් වැඩක් නැත. ඔහුට අවැසි ඒ කෙනා කවුදැයි දැන ගන්නටය. සරසි ද ඒ බව දැන උන්නාය.

"ඒ ඔයත් හොඳට දන්න කෙනෙක් අයියේ.."

"ප්ලීස් සාරා... මට කියන්න ඒ කවුද කියලා.."

ආකාශ් ඇසුවේ කලබලයෙන් පුටුවෙන්ද නැගිට ඇය වෙත එමිනි.

"අයියේ... ඇයි මේ? ඔයා ඇයි මෙච්චර කලබල වෙලා..?" සරසි ඇසුවේ නැගෙන්නට ආ සිනහව ආයාසයෙන් සඟවාගෙනය.

"න්..නෑ සාරා... මං කලබල වෙලා නෑ. ඔයා කියන්නකෝ..."

"අනේ මන්දා මේවා ඔයාට කියන එක හරිද කියලා. මොකද මං එයාට කැමති වුණාට එයා මට කැමතිද නැද්ද කියන්න මං දන්නේ නෑ. අනික අපේ ගෙදරින් වුණත්.."

"හරි හරි සාරා... ඔය මොනවා වුණත් කමක් නෑ. ඉස්සෙල්ලම මට කියන්න ඒ කවුද කියලා.."

"අනේ ඇයි ආකාශ් අයියේ මේ...?"

"මට දැන ගන්න ඕන සාරා ඒක... මොකද මං ඔයාට...."

ආකාශ් කියන්නට ගිය දේ ගිලගෙන ජනේලයෙන් පිටත බලා ගත්තේ තම දෑස් සරසිගෙන් වසන් කරන්නටය. සරසි ඔහු දෙස බලා සුසුමක් හෙළුවාය.

"මං ඒක දන්නවා ආකාශ් අයියේ..."

ආකාශ් යළිත් ඇය වෙතට හැරුණේ පුදුමයෙනි.

"දන්නවා? මොනවද සාරා?"

"ඔයා කියන්න ගිහින් නවත්තපු දේ... මං දන්නවා අයියේ..."

"නෑ සාරා... ඔයා කොහොමද.."

සරසි පුටුවෙන් නැඟිට ඔහු වෙතට ගියේ මද සිනහවකින් මුව සරසාගෙනය. ඔහු අසලටම ගිය ඇය ඔහුගේ දෑස්වලට එබුණාය.

"කොහොම හරි... මං දන්නවා අයියේ... ඔයා මට ආදරෙයි කියලා..."

"සාරා.... මං..."

"ඇයි එහෙම නෙමෙයිද? ඔයා මට ආදරේ නැද්ද?"

“ඔව් සාරා. ඇත්ත. මං ඔයාට ආදරෙයි. ඒත් මගෙන් ඔයාට කිසිම බලපෑමක් නෑ. මට කියන්න කවුද ඒ කියලා...”

ආකාශ් ආයාචනාත්මකව කියද්දී සරසි මදහසක් නැඟුවාය.

“මං මෙච්චර වෙලා කියපු ඒ කෙනා... වෙන කවුරුත් නෙමෙයි අයියේ... ඒ ඔයා..”

“මොනවා..! ඒ කියන්නේ සාරා...”

“ඔව්.. මාත් ඔයාට ආදරෙයි අයියේ...”

සරසිගේ මුවින් ඒ වචන ටික පිටවෙනවාත් සමඟම ආකාශ් ඇයව තදින් වැළඳ ගත්තේ සතුටිනි. එසේ නම් ඔහුගේ සිහින කුමරියගේ ලොවේ සිහින කුමාරයා වී ඇත්තේද ඔහුය.

********************

මේ කතාව අනුජ් අසා සිටියේ පුදුමයෙනි. ඔහුගේ මිතුරන්ද මෙය අසා සිටියේ පුදුමයෙනි. මේ කතාවේ

තවමත් අනුජ්ගේ අම්මා ගැන කිසිවක්ම නොකියවුණේ ඇයි? සියලු දෙනාටම තිබූ පැනය එයයි.

"තාත්තා ආදරේ කලේ එයාට නම්.. මගේ අම්මා?" අනුජ් සියල්ලන්ටම පෙර ඇසුවේ සිතෙහි උතුරන කුතුහලය නිසාය.

"ඔයාගේ අම්මා මේ කතාවට ආවේ ගොඩාක් පස්සේ අනුජ්..."

"ගොඩක් පස්සේ..." නිම්නා තමාටම මුමුණා ගත්තාය.

"ඔව් දුව. ගොඩක් පස්සේ. අවුරුදු ගානකට පස්සේ ඒ දේවල් සිද්ධ වුණේ.." කී මධූ යළිත් කතාව කියන්නට වූවාය.

***************

එදා සිද්ධියෙන් පසු මධූ නැවතත් සරසිට කතා නොකලාය. සරසි ඒ ගැන උන්නේ දැඩි සිත් තැවුලෙනි. නිවාඩු

අවසන් වී යළිත් විශ්වවිද්‍යාලයට පැමිණියත් ඇය දිගින් දිගටම සිතුවේ ඒ ගැනමය.

ඒ හැන්දෑවේද ඇය කල්පනා කරමින් සිටියේ මධූ ගැනය. බෝඩිමේ මිතුරින් සියලු දෙනාම පිටතට ගොසිනි. සරසිට දුරකතන ඇමතුමක් ආවේ ආකාශ්ගේ අංකයෙනි.

"අයියේ..."

"සාරා... ඔයා ඇඬුවද?" ආකාශ් ඇසුවේ ඇයගේ කටහඬේ වෙනසක් දැනුන නිසාමය.

"න්...නෑ."

"බොරු කියන්න එපා ළමයෝ කටහඬ වෙනස් වෙලානේ.."

"අයියෝ නෑ... මට මේ ටිකක් හෙම්බිරිස්සාව වගේ... ඒ නිසා වෙන්න ඇති." ඇය අපහසුවෙන් බොරුවක් ගොතාගෙන කීවාය.

"ආහ්... ඒක වෙන්න පුළුවන්. මං දන්නවානේ ඔයාගේ හැටි. දැන් ලෙඩ තියාගෙන පාඩම් කරන්නේ කොහොමද කියනවකෝ ඉතිං..."

"හරි හරි ඉතිං... මං හිතලා හෙම්බිරිස්සාව හදා ගත්තේ නෑ නේ අයියේ..."

"හිතලා තමයි බබා ඔයා ලෙඩ වෙන්නේ. මහ රෑ වෙලා සීතලේ නානවා.. වැස්සට තෙමෙනවා... කූල් බොනවා.. ආයේ අයිස්ක්‍රීම්... අයිස්ක්‍රීම් එකක් දැක්කොත් වෙලාවක් අවේලාවක් නෑ..." ආකාශ් කියාගෙන කියාගෙන ගියේ සරසිට සිනහවක් නැගෙද්දීය.

"මේ මං දකින දකින අයිස්ක්‍රීම් කන්නේ නෑ හරිද.. මං කන්නේ චොකලට් අයිස් විතරයි..."

"ඔව් ඔව්... ඒක කෑවම ඇති." ආකාශ් කීවේ මවාගත් කෝපයෙනි.

"හරි ඉතිං. ඇයි ඔච්චර කෑ ගහන්නේ..."

“කැගහන්න නෙමෙයි උස්සලා පොළවේ ගහන්න තියෙන්නේ…”

“ගහයි කියලා තමයි බය.”

“ඇයි බෑ කියලද හිතන්නේ… වරෙන්කෝ ගෙදර…”

“හූ…හූ… ඔයාට බෑ අනේ..”
කියමින් සාරා ඇමතුම විසන්ධි කලේ ආකාශ්ව සිනහ ගස්වමිනි.

# 09.

තමා හොඳින් බව අඟවන්නට කෙතරම් උත්සහ කලද සරසි ඉන්නේ මධූගේ ප්‍රශ්නය නිසා සිත් තැවුලෙන් බව ආකාශ් දැන උන්නේය. ඇයට දුක මධූ තරහා වූ එකටත් වඩා ඇය කරදරයක වැටෙන්නට යන එක ගැනය. ආකාශ්ට මේ ගැන මධූ සමඟ කතා කරන්නට ද සිතුණ නමුත් මේ මිතුරියන් දෙදෙනාගේ ගැටලුවට තමන් මැදිහත්වෙන එක හොඳදැයි ඔහු සිතුවේය.

දිනක් ආකාශ් අහම්බයෙන් මෙන් දුටුවේ මධූ බසයකින් බැස පුස්තකාලය වෙතට ඇවිද යන අයුරුය. ඔහු දෙවරක් නොසිතාම ඇය අසලට ගොස් බයිසිකලය නතර කලේය.

“නංගි...”

“ආ... මේ ආකාශ් අයියානේ...”

“අපේ සාරා එන දවසක් කිව්වේ නැද්ද නංගි?” ආකාශ් කිසිම දෙයක් නොදන්නා ලෙසින් ඇසුවේය.

"ෆෝන් නම්බර් එකත් තියෙන එකේ කතා කරලා අහගත්තා නම් ඉවරනේ... අපට කරදර නොකර." ඇය කීවේ අමනාපයෙනි.

"මධූ..."

ඇය යන්නට හැරෙද්දී ආකාශ් බයිසිකලයෙන් බැස ඇය වෙතට ගියේය.

"මේ අහන්න නංගි. මං දන්නවා ඔයා සාරා එක්ක තරහින් ඉන්නේ කියලා.."

"දන්නවා නම් මොනවද තව අහන්නේ..." ඇය කීවේ තරමක කෝපයෙනි.

"නංගි.. මං දන්නේ නෑ මට මෙහෙම කියන්න අයිතියක් තියෙනවද නැද්ද කියලා... ඒත් මං දන්න කාලෙක ඉදලා ඔයාලා දෙන්නා හොදම යාළුවෝ. දෙන්නා එකටමයි හිටියේ... ඒත් දැන් ඇයි මෙහෙම?"

"ඇයි දැන් තරහා වුණා කියලා කියපු කෙනා ඔයාට කිව්වේ නැද්ද ඒකට හේතුව?"

"මධූ... මට මේක කියන්න... ඔයාට වැඩියෙන්ම තරහා ඔයාගෙයි මිගාරගෙයි සම්බන්ධෙට සාරා විරුද්ධ වුණ එකටද... එහෙම නැත්තම්..."

"එහෙම නැත්තම්..?" ආකාශ් මගින් කතාව නවත්තද්දී මධූ කුතුහලයෙන් ඔහු දෙස බලා ඇසුවේය.

"නැත්නම්.. ඔයාට මිගාරට ආදරේ කරන්න එපා කියන එයා මට ආදරේ කරන එකටද?"

"ආ... එහෙනම් ඔයා දන්නවා එයා ඔයාට ආදරෙයි කියලා..."

"ඔව්. මං දන්නවා. ඒ වගේම මාත් එයාට ආදරෙයි." ආකාශ් කතා කලේ තරමක් උස් හඬිනි.

"මේක අහගනිං නංගී... මං සාරාට ආදරෙයි. එයා ඔයා ගැන හරියට දුක් වෙනවා. එයා දුක් වෙනවා බලන්න බැරි නිසයි මං අද ඔයාට කතා කරන්න හිතුවේ... සාරා උඹට මිගාරව අත අරින්න කියන්නේ ඌ දුප්පත් නිසා නෙමෙයි... ඌ උඹට ආදරේ නැති නිසා. හිඟන්නෙක් හරි කමක් නෑ උඹට ඇත්තටම ආදරේ කරන එකෙක් නම් නංගී.. මිගාර ගැන ඔය දෙන්නටම වඩා දේවල් මං දන්නවා.."

"ප්ලීස් ආකාශ් අයියේ... ඔයාව මේ දේවල් කියන්න එවපු කෙනාට කියන්න වැඩක් වෙන්නේ නෑ කියලා. මිගාර මට ආදරෙයි. මං එයාව අතඅරින්නේ නෑ කවුරු කිව්වත්."

"හොඳයි නංගී. මේ ටිකත් අහගෙනම යන්න එහෙනම්. මං මේ කියන්නේ සරසි නිසා නෙමෙයි. උඹ හොඳ කෙල්ලෙක් නිසා. කොල්ලෙක් නිසා ඒ වගේ යාළුවෙක් නැති කර ගන්න එපා... අනිත් එක, මං ඕන ඔට්ටුවක් අල්ලනවා... මිගාර ඔයාට ටිකක් හරි ආදරෙයි නම්, ඊට වඩා සිය දහස් ගුණයක් වැඩියෙන් සාරා උඹට ආදරෙයි."

කී ආකාශ් යන්නට ගියේ මධූව එතැන තනි කරමිනි.

*******************

"ආදරේදී මිනිස්සු අන්ධ වෙනවා කියන්නේ ඇත්ත දරුවෝ... එදත් මං ආකාශ් අයිය කිව්ව දේවල් පිළිගත්තේ නෑ. ඒත් එදා ආකාශ් අයියා කිව්වේ ඇත්ත. මිගාර මට ටිකක් හරි ආදරේ කලා නම් ඊට වඩා සිය දහස් ගුණයක් සාරා මට ආදරේ කලා.. අදටත් ඒක එහමමයි."

මධූ කීවේ කඳුළු පිසදා ගනිමිනි.

"පුංචි.."

"දැන් ගොඩක් රෑ වෙලා. පුතාලා දැන් ගිහින් නිදාගන්න."

"ඒත් පුංචි..."

"අපි හෙට කතා කරමු දරුවෝ.." මධූ නැඟිට ගෙතුළට ගියේ මිතුරන් සිව් දෙනා මිදුලේ තනි කරමිනි.

ඒ යන අතරේද කඳුළු පිස දමන ඇය දෙස ඔවුන් බලා උන්නේ අනුකම්පාවෙනි.

"පුංචිට ඒ අතීතේ මතක් කරන එක වේදනාවක්..."

"ඔව් තනුක. පුංචි ඒ වුණ දේවල් ගැන ගොඩක් පසුතැවිලි වෙනවා.." නිම්නා ඇය ගිය දෙස බලාගෙනම කීවාය.

"දැන් ඒ දේවල් වෙලා ඉවරයිනේ. පුංචි දුක් වෙනවා තමයි. ඒත් ඒකට කමක් නෑ. අපි මේ කතාව සම්පූර්ණයෙන්ම අහලා දැනගන්න ඕන.."

"දර්ශී..!" අනුජ් කීවේ පුදුමයෙනි.

"මේ අහන්න අනුජ්, පේනවා නේද අපේ පුංචි අද පසු තැවෙන විදිහ? ඒ විදිහට දවසක ඔයත් පසුතැවෙනවා බලන්න අපිට බෑ. එහෙම වුනොත් අපිත් පසු තැවෙයි මේ කතාව අහගත්තේ නැති එකට. ඒ නිසා අපි සේරම අහගන්න ඕන. අනිත් එක පුංචි බෑ කිව්වේ නෑ නේ.."

එසේ කියා උන් තැනින් නැගිට්ට දර්ශී ඉස්සර වූයේ නින්දට යන්නටය.

දර්ශිටත් තනුකටත් යන්නට ඉඩහැර නිම්නා නතර වූයේ හිතාමතාමය. අනුජ් තවමත් කල්පනාවේය.

"අනුජ්... දැන් ඇති නේද? අපි යමු නිදා ගන්න."

"මං තාමත් කියන්නේ මට මේ දෙවල් අහන්න ඕන නෑ නිම්නා.."

"නෑ අනුජ්... මට නම් හිතෙන්නේ ඔයා මේ කතාව අහන්නම ඕන. නැත්තං අර දර්ශි කිව්වා වගේ ඔයාට දවසක පසුතැවෙන්න වෙයි."

"ඒත් නිම්නා..."

"අනුජ්... අපි මුලින්ම අහලා ඉමු මේ කතාව. ඊට පස්සේ තීරණය කරමු මොකක්ද කරන්නේ කියලා. අපි මේ දේවල් කරන්නේ ඔයාට තියෙන ආදරේටනේ අනුජ්.."

"හ්ම්... මං දන්නවා" අනුජ් කීවේ නිම්නාගේ උරහිස වටා අතක් දමා ගනිමිනි.

"මේ... උඹලා දෙන්නා ලව් කරලා ඉවර නම් වරෙන් නිදාගන්න..."

දර්ශිගේ හඬට දෙදෙනාම ඒ දෙසට හැරුණෝය. නිම්නා නම් ලැජ්ජාවටම රතුවී උන්නාය.

අනුජ් මද සිනහවක් පා ගෙතුළට ගියේ දෙදෙනාටම සුබ රාත්‍රියක් පතමිනි.

හෙමිහිට නිම්නා අසලට ගිය දර්ශි ඇයට ඇඟිල්ලකින් ඇන්නාය.

“බලපල්ලකෝ මේකිගේ මූණ... ලැජ්ජාවට රතු වෙලා...”

“පිස්සුද බං... මේ සීතලට...”

“ආ ඇත්තද... මං එහෙම හිතා ගන්නම්කෝ”

“යමං යමං නිදා ගන්න.”

“ඔහොම හිටපංකෝ..”

“මොකෝ...?”

“කොහොමද නේ සාරා ඇන්ටි ආකාශ් අංකල්ට කිව්වා වගේ... අනුජ් උඹේ ළඟට ඇවිල්ලා කිව්වොත්...”

“මොනවද?”

“නිම්නා... මං දන්නවා ඔයා මට ආදරෙයි කියලා. මාත් ඔයාට ආදරෙයි නිම්නා...”

දර්ශී රඟපාමින් කියද්දී නිම්නාට ලැජ්ජා සිතුනි. ඇත්තටම නිම්නාගේ සිතේ අනුජ් ගැන ආදරයක් උපන්නේ අදක ඊයෙක නොවේ... පුංචි කාලේ තිබූ මිතුරු කම ආදරයකට හැරුනේ කවදාදැයි ඇයට නිනව්වක් නැත.

“මොකද මොකද? නෑ කියන්නද හදන්නේ..? නිම්නා.. මං මොන්ටිසෝරි කාලේ ඉඳලා උඹව දන්නේ. මං දන්නවා දැන් ටික කාලෙක ඉඳලා උඹ අනුජ්ට ආදරේ කරනවා. එහෙම නේද?”

“ඔයාට හංගන්න දෙයක් නෑ කෙල්ලේ... ඔව්. මං එයාට ආදරෙයි තමයි. අපි බලමුකො ඉතිං. දැන්ම මේ දේවල් එයාලාට නොකියා ඉමු.”

“මං දන්නවා උඹට බයයි යාළුකමුත් නැති වෙයි කියලා... ඒත් මට විශ්වාසයි. එහෙම වෙන එකක් නෑ.”

“බලමුකෝ දර්ශී... මුලින්ම මේ ප්‍රශ්නේ විසඳගෙන ඉමුකෝ...” නිම්නා කීවේ සුසමක් හෙලාය.

"යමු යමු නිදා ගන්න. හැබැයි එකක් නිම්නා.."

"මොකක්ද?"

"උඹට ලේසි වෙන එකක් නෑ ඔය කුකුල් කේන්තිකාරයාත් එක්ක.."

දෙදෙනාම ගෙතුළට ගියේ දර්ශිගේ ඒ කතාවට සිනහවෙමිනි.

# 10.

පසුදින උදෑසන මිතුරන් තිදෙනාම ගියේ වටපිටාව ටිකක් නරඹන්නටය. සුන්දරව ගලා හැලෙන කුඩා දිය ඇල්ලක් අසල නතරවූ පිරිස දර්ශිගේ පුංචි සාදා දුන් උදේ ආහාරය එතැන සිට ගන්නා ගමන් කතා කරන්නට විය.

“ඊළඟට මොනවා වෙන්න ඇතිද බං?” තනුක අසන්නේ සරසිගේත ආකාශ්ගේත් කතාව ගැනය.

“අනේ මන්දා බං. අපේ පුංචි කියාගෙන යන විදිහට නම් ඉතිං ඒ දෙන්නා මැරි කරන්න ඕන...”

“එහෙම වුණා කියලා හිතන්න බැනේ... ගෙදරින් අකමැති කතාවකුත් කිව්වා නේද?”

“ඒකත් ඇත්ත. එහෙනම් ගෙදරින් උදැල්ල දාන්න ඇති.”

“ඒත් ඉතිං... ඒ දෙන්නා එච්චරටම ආදරේ කළා නම් ගෙදරින් එපා කියපු පලියට වෙන් වෙයි කියලා ඔයාලා හිතනවද?” නිම්නා ඇසුවේ කල්පනාබරවය.

"ඒකත් ඇත්ත. අනික මොකක් හරි දේකට එදා වෙන්වුණ දෙන්නා පස්සේ ආයෙත් එකතු වෙලා තියනවා.."

"ඔක්කොමත් හරි. ආකාශ් අංකල් ඔය තරම් සාරා ඇන්ටිට ආදරේ කළා නම් ඇයි වෙන කෙනෙක් මැරි කළේ?"

"අනේ මන්දා බං... ඕවා ඔක්කොටම උත්තර තියෙන්නේ පුංචි කියන කතාව ඇතුලේ තමයි. යමල්ලාකෝ ගෙදර. ගිහින් ඉතුරු ටිකත් අහගමු." කී දර්ශි නැගිට වාහනය දෙසට ගියේය.

මේ කතා සියල්ල මෙතෙක් නිහඬවම අසා උන් අනුජ් වචනයක්වත් නොකියා කෑම කෑවේය.

දහවලේ කතාවේ ඉතිරි ටික අසන්නට ගියද අනුජ් උන්නේ මදක් කැළඹීමෙනි. මෙවන් කතාවක් ඔහු දැන උන්නේ නැත. මෙවන් කතාවක් අසන්නට බලාපොරොත්තු වූවේද නැත. සියල්ලටමත් වඩා අම්මා ගැන තමාට කියූ යොමාල් අයියාවත් මේ දේවල් කීවේ නැත.

දර්ශිගේ පුංචි කියන ලෙසට තාත්තා ආදරය කළේ සරසිට නම්... සරසි ආදරේ කළේ තාත්තාට නම්... 'එතකොට මගේ අම්මා?' අනුජ් සිතින් අසා ගත්තේය.

"ඉතිං පුංචි..."

"ඉතිං... ඊට පස්සෙත් කීපසැරයක්ම ආකාශ් අයියා මට ඒ ගැන තේරුම් කරන්න හැදුවා. ඒත් මං ඒ දේවල් අහන්න ලෑස්ති වුණේ නෑ. සාරා එක්ක වුණත් ආයේ කතා කරන්නේ නෑ කියලා තීරනේක මම හිටියේ."

**************

සරසි ආකාශ්ට දුරකතන ඇමතුමක් ගත්තේ පසුගිය දින කිහිපයේම ඔහුගෙන් ඇමතුමක් නොලැබුණු නිසාවෙනි.

"සාරා..."

"කෝල් එකක් ගන්න බැරි තරම් ඔයා බිසීද අයියේ?"

"අනේ සාරා... එහෙම දෙයක් නෙමෙයි ළමයෝ.."

"එහෙනම් ඇයි ආකාශ් අයියේ මට කෝල් එකක්වත් දෙන්නේ නැත්තේ ඔයා?" සරසි ඇසුවේ දුක්බර හඬිනි.

"ඔයාට මේ දවස්වල එක්සෑම් නේද? ඒකයි මං කතා නොකලේ. සේරටම කලින් ඒ වැඩ ටික කරගන්න සාරා... අපිට කතා කරන්න නම් ඕන වෙලාවක පුළුවන් නේ... ඔයා ඉගෙනගන ඉහළටම යන්න ඕන සාරා... ඒක තමයි මගේ ආසාව... ඔයාගේ ඒ ගමනට මාවවත් බාධාවක් වෙනවට මං කැමති නෑ..."

"අනේ..." සරසිට ඇඩුණේ ආකාශ්ගේ කතාවටය.

"කෝ ඉතිං... අඩන්න එපා ළමයෝ... කියන්නකෝ, එක්සෑම් ඉවරද?"

"හ්ම්..."

"ලේසිද?"

"අවුලක් නෑ..." සරසි කියද්දී ආකාශ් මහ හඬින් සිනාසෙන්නට වූවේය.

"මොකද හිනා වෙන්නේ?"

"ඔයා ඉතිං මොන විහාගෙට ගියත් ගෙදර ඇවිල්ලා කියන්නේ ඕක තමයි.."

"ඉතිං අවුලක් නැත්තතම් නෑ කියන්නේ නැතුව වෙන මොනවද කියන්නේ?"

"හරි හරි ඉතිං..."

"සාරා..."

"කියන්න..."

"මධූ කතා කලේ නැද්ද?"

ආකාශ් අසද්දී සරසිට සුසුමක් හෙළුනේ ඉබේටමය. එදා ඒ සිද්දියෙන් පසු අද වනතුරුත් මධූ ඇයට කතා කළේ නැත.

"මට තේරෙනවා සාරා... මාත් දවස් දෙකතුනක්ම මහදි හම්බෙලා ඔය ගැන කතා කරන්න හැදුවා. ඒත් එයා අපි කියන දෙයක් අහන්න ලෑස්ති නෑ."

"මං දන්නවා අයියේ... කොහොමත් ඒ දෙන්නව බලෙන් වෙන් කරන්න අපට අයිතියක් නෑ. ඒ වුණාට... මං කොහොමද දැන දැනම මගේ යාළුවා අමාරුවේ වැටෙනකම් බලන් ඉන්නේ?"

"සාරා... මේ අහන්න ළමයෝ... අපි උපරිම උත්සහ කරමු හරිද? ඔයා ඔයාගේ වැඩ ටිකත් හරියට කරගන්න ඕන හරිද?"

"හරි ඉතිං... අනේ අයියේ මධූ ගැන පොඩ්ඩක් බලන්න හොදද?"

"හරි ළමයෝ... මං ඔයා නොකිව්වත් බලනවානේ..." ආකාශ් කියද්දී සරසිට දැනුණේ සැනසීමකි.

මේ වන විට සරසිගේ බෝඩිමේ මිතුරියනුත් එක්කෙනා දෙන්නා බෝඩිමට එන්නට විය. ඔවුන් අතරින් සරසිට වඩාත් හිතවත් වූ ලිහිණි කාමරයට ආවේම කෑ ගසාගෙනය.

"ඈ බං... උඹ මල් කඩ කඩා ඉදපං. තාම ඇදුම් මාරු කරලාවත් නෑ නේ... කීයටද ලෙක්චර්ස් ඉවර වුණේ.."

ලිහිණිගේ කෑගැසීම ආකාශ්ටද හොදින් ඇසුණි.

"ඔයාටද ඔය බනිනවා ඇහෙන්නේ?"

"හ්ම්.."

"බලන්නකෝ ඉතිං... මං නිසා වැඩ පාඩු කරගන්න එපා කියලා කිව්වා විතරයි. දැන් රෑ වෙලානේ ළමයෝ... බලන්න තාම ආපු ගමන්ද ..."

"හරි හරි බං ඉතිං. දැන් වොෂ් එකක් දාගෙන නිදා ගන්න තියෙන්නේ.."

"බං? මටද බං කිව්වේ?" ආකාශ් ඇසුවේ පුදුමයෙනි.

"නැතුව ඉතිං... ඔය මහත්තයට තමයි."

"අහුවෙයන්කෝ මට..."

සරසි එයට නම් හඬනඟා සිනාසුණාය.

"හ්ම් හ්ම්... දැන් යන්න බබා එහෙනම්. කාලා බීලා නිදා ගන්න. මේ රෑ වෙලා නාන්න එහෙම එපා ලෙඩ වෙයි..."

"එහෙමයි සර්..."

"විහිළු නෙමෙයි. මං තියනවා එහෙනම්. බුදුසරණයි. පරිස්සමින් සතුටින් ඉන්න ඕන හොඳද..""

"හ්ම්...බුදුසරණයි අයියේ.." සරසි දුරකතනය ඇඳට දමා නැගිට්ටේ නාන කාමරයට යන්නටය.

ආකාශ් දුරකතනය අතේ තබාගෙනම කල්පනා කළේ තමාගේත් සරසිගේත් අනාගතය ගැනය.

'අපිට මොන තරම් ප්‍රශ්න එයිද සාරා.. මං දන්නවා අම්මලා ඔයාව මට දෙන්න කැමති වෙන්නේ නෑ.. සමහර විට අපිට වෙන් වෙන්න වෙයි. මං දන්නවා දවසක ඔයාට එයාලාගේ වචනෙට පිටින් යන්න බැරි වෙයි. එහෙම වුනොත්... කමක් නෑ... ඒක අපි එතකොට බලමු. එතකම් මේ හීනේ ජීවත් වෙන්න මං ආසයි සාරා....'

ආකාශ්ගේ කල්පනා ලෝකය බිඳුනේ  කවුරුන් හෝ නොකඩවා දොරට තට්ටු කරන හඬිනි.

"ආකාශ්... මේ දොර ඇරපං.. යකෝ උඹ දැන්මම නිදිද? නැත්තං මැරිලද?"  ගයාන්ගේ කටහඬ පිටතින් ඇසෙද්දී ආකාශ්ට සිනහවක් නැඟුණි.

"හිටපං මේ එනවා..."

ආකාශ් දොර අරින විට ගයාන් සමඟින් තවත් තරුණයෙක් එහි විය. දැක හුරු පුරුදු වුණත් ආකාශ්ට ඔහුව එකවර හඳුනා ගන්නට බැරි විය.

"කීයේ ඉදන්ද බලපං මේ දොරට තඩිබාන්නේ... ඇත්තටම උඹේ කනේ කලාදුරු හැදිලද බං?"

"නෑ බං. මං මේ කෝල් එකක්..."

"ආ... හරි හරි... උඹ ප්‍රේම ජවනිකාවකද හිටියේ? එහෙනම් කමක් නෑ... සොරි වෙන්න ඕන බාධා කළා නම්.."

ගයාන් එසේ කියද්දී ආකාශ්ට පමණක් නොව අනෙක් තරුණයාටද සිනහවක් නැඟුණි.

"ඒක නෙමෙයි. උඹට මතකද මේ මල්ලී?"

"දැකලා නම් පුරුදුයි බං... ඒත් හරියටම කවුද කියලා මතක නෑ..."

"ශාලින්ද බං..."

"ශාලින්ද කිව්වේ..."

"ඇයි බං උඹලෑ අයියාගේ වෙඩින් එක දවස්වල අපිට සෙට් වුණේ... ඉන්දු අක්කලාගේ ගෙවල් ළඟ."

"අඩෝ... කොල්ලෝ... කොහොමද ඉතිං..? සොරි බං එකපාරටම අඳුර ගන්න බැරි වුණා.." ආකාශ් කීවේ සතුටිනි.

"හොඳයි අයියේ වරදක් නෑ.."

"කොල්ලා අපට වැඩක් අරන් ඇවිල්ලා තියෙන්නේ.." ගයාන් කීවේය.

"මොකක්ද කොල්ලෝ..?"

"අයියේ... අපේ ටී ෆැක්ට්‍රි එකේ වර්කර්ස්ලා පන්සීයකට වඩා ඉන්නවා. අපි එයාලාට අළුතින් යුනිෆෝර්ම් එකක් ඩිසයින් කරලා තියනවා. අයියට ඒ ඕඩර් එක ගන්න පුළුවන්ද බලන්න ආවේ.."

"මරුනේ බං..." ආකාශ් කීවේ ගයාන්ගේ කරටද අතක් දමාගනිමිනි.

# 11.

"ආකාශ් අයියා එදා ශාලින්ද ගෙනාපු වැඩේ දෙපාරක් හිතන්නේ නැතුවම බාර ගත්තා. ඒ වගේම එදා ඉඳලා එයාලා ළඟම යාළුවෝ වුණා. ගයාන් වගේම තමයි එයත් ආකාශ් අයියට ඕනම දෙයක් ගැන නිදහසේ කතා කරන්න පුළුවන් යාළුවෙක්.."

"ශාලින්ද? මං එහෙම කෙනෙක් ගැන අහලවත් නෑ නේ..." අනුජ් කීවේ කල්පනා බරවය.

"එයා අංකල්ගේ ළඟම යාළුවෙක් නම් උඹ දන්නවා ඇති බං..," තනුක කීවේය.

"අනුජ් පුතා එයා ගැන දන්නේ නෑ තමයි. ඒ ඇයි කියලා මේ කතාව අහනකොට ඔයාලාට තේරෙයි.."

"ඉතිං කියන්නකෝ පුංචී..." දර්ශී කීවේ කුතුහලයෙනි.

"ඒ කාලේ සාරාගේ ළඟින්ම හිටපු යාළුවා ලිහිණි. එයා අපේ විස්තරත් සේරම දැනගෙන හිටියේ. මං

සාරාව අතඇරලා දැම්මට පස්සේ එයාට ලිහිණී ලොකු ශක්තියක් වුණා. ඒ කාලේ ලිහිණී මටත් කතා කරන්න උත්සහ කළා. ඒත් මං එයාට කතා කළේ නෑ.."

**************************

"සරසි..."

"කරුණාකරලා මං කියන දේ තේරුම් ගන්න අමිත..."

අමිත සරසිගේ ආදරය පතා එන්නේ බොහෝ කාලයක සිටය. විශ්වවිද්‍යාලයට පැමිණි දා සිටම ඔවුන් හොඳ මිතුරන් වූවද සරසි දිගින් දිගටම ඔහුගේ ආදරය ප්‍රතික්ෂේප කලාය.

"ඇයි සරසි මේ... මොකක්ද මට තියෙන අඩුපාඩුව.?"

"අමිත, ඔයාගේ අඩුපාඩුවක් ගැන නෙමෙයි මං කතා කරන්නේ... මට එක හිතයි තියෙන්නේ. මං දැනටමත් වෙන කෙනෙක්ට ආදරය කරනවා. ඒ නිසා මට ඔයා ගැන හිතන්න බෑ.."

"ඔයා ඔය කියන කතාව මට පිළිගන්න බෑ සරසි... කමක් නෑ... මෙච්චර කල් බලන් හිටියා වගේ මං තවත් බලන් ඉන්නවා... කවදා හරි දවසක් එයි ඔයා මගේ ආදරේ පිළිගන්න..."

කියූ අමිත සරසි යමක් කියන්නටත් පෙරම පිටව ගියේය. සරසි ඔහු යන දෙස බලා සිටියේ අනුකම්පාවෙනි.

"මං සේරම අහගෙන... පව් බං අමිත. දැන් කවදා ඉඳලද ඔය පස්සෙන් එන්නේ.." ලිහිණි ආවේ එසේ කියාගෙනය.

"එහෙම කියලා මට දෙන්නෙක්ට ආදරේ කරන්න බෑ නේ... මං ආදරේ කරන්නේ ආකාශ් අයියට. ඒ ඇරෙන්න වෙන කෙනෙක් ගැන මට හිතන්න බෑ."

සරසි කියද්දී ලිහිණි ඇය අසලින් වාඩි වූවේ සුසුමක් හෙලමිණි.

"මේ අහපං සාරා... මං දෙයක් අහන්න කේන්ති ගන්නේ නෑ නේද?"

sinhalaebooks.com

"අහන්න.." සරසි ඇය වෙතට හැරෙමින් කීවාය.

"උඹට කවදාවත් හිතිලා නැද්ද ආකාශ්ට වඩා හොඳ කෙනෙක් උඹට ලැබෙයි කියලා..?"

"වැරදිලාවත් එහෙම හිතන්න මට බෑ ලිහිණි. දන්න කාලෙක ඉඳලා මගේ ලෝකේ ඉන්නේ එයා. එයාට වඩා හොඳ කෙනෙක් මං දකින්නේ නෑ. මට ඉන්න හොඳම කෙනා එයා…"

"උඹ හිතන්නේ එහෙමනම් එච්චරයි. දැන යමං බෝඩිමට." ලිහිණි තවත් කිසිවක් අසන්නට නොගොසින් සරසිත් සමඟ බෝඩිමට ගියාය.

දින කීපයකට පසු උදෑසනින්ම අවදි වූ ලිහිණි දුටුවේ ඇඳේ ගුලිවී සරසි කෙඳිරිගාමින් සිටින ආකාරයයි. ඇය ඉක්මනින් ඇඳෙන් බැස සරසි වෙත ගියාය.

"සාරා.."

"අනේ ඇයි සාරා මේ?" කියමින් ලිහිණි ඇයගේ ඇඟට අත තබා බැලුවාය.

"දෙයියනේ..."

සරසිට හොඳටම උණය.ඇඟ ගිනි කබලක් මෙනි. ඇය උන්නේ කතා කරගන්නවත් බැරි තරමට වෙව්ලමිනි.

බෝඩිමේ අනිත් අයටද ඉක්මනින් කතා කළ ලිහිණි ඔවුන් හා එක්ව සරසිව රෝහල වෙත රැගෙන යන්නට කටයුතු කළේ මේ ගැන සරසිගේ නිවසටද දන්වමිනි. සරසිට දින කීපයක්ම රෝහලේ ගත කරන්නට ද වූවේ උණ බැස යන තුරුය.

මේ අතර දින කීපයක්ම සරසිගේ දුරකතනය ක්‍රියා නොකිරීම ගැන ආකාශ් උන්නේ චකිතයෙනි.

"ආකාශ් අයියා... මොකක්ද අවුල?"

ශාලින්ද ආකාශ්ගේ කාර්යාලයට පැමිණ අසුන් ගත්තේ ඔහුගේ වෙනස දෙස බලාගෙනමය.

"අනේ මන්දා බං..."

"ඇයි මොකක්ද ප්‍රශ්නේ... මට කියන්න බැරි දෙයක්ද?"

"උඹටයි ගයාන්ටයි නොකියන දේවල් මට නෑ බං... මං මේ කල්පනා කළේ දැන් ටික දවසක් සාරාගේ ෆෝන් එක වැඩ නෑ.."

"ෆෝන් වැඩ නෑ? මොකුත් කරදරයක්වත් ද?"

"අනේ මන්දා බං. මාත් කල්පනා කළේ ඒකයි."

"සාරාගේ යාළුවෙක්ගේ නම්බර් එකක්වත් නැද්ද?"

"අයියෝ... මට අමතක වුණානේ.. ලිහිණි ඉන්නවා. එයාට අරන් බලමු නේද.."

"අයියා ළඟ නම්බර් එක තියෙනවාද?"

"ඔව්. දවසක් සාරා ඒකෙන් මට ගත්තා.." ආකාශ් කීවේ කලබලයෙන් ලිහිණිගේ අංකය සොයමිනි.

ලිහිණී විශ්වවිද්‍යාලයෙන් පිටතට ආවේ හෙම්බත් වී ය. සරසි බැලීමට රෝහලට ගිය ඇය යළිත් විශ්ව විද්‍යාලයට ආවේ අතපසු වූ සටහන් කිහිපයක් රැගෙන යන්නටය. බෝඩිමට පය තබද්දී නාද වූ දුරකතනය ඇය කනේ තබා ගත්තේ තරමක අමනාපයෙනි.

“හෙලෝ..”

“හෙලෝ.. මේ ලිහිණී නංගි නේද?”

“ඔව්. කවුද මේ?”

“නංගි මං ආකාශ් අයියා කතා කරන්නේ. සරසිලාගේ ගමේ…”

“ආ… මේ අපේ ආකාශ් අයියානේ..”

ලිහිණී කීවේ මහන්සියට ඇදෙන් වාඩිවෙමිනි.

“කෝ අපේ සාරා ඉන්නවද නංගි ඔතන?”

“සාරා...මේ...”

“එයාට කරදරයක්ද නංගි? දැන් දවස් දෙක තුනක ඉඳලා ෆෝන් එක වැඩ කරන්නෙත් නෑ...”

ලිහිණි සුසුමක් හෙලා සරසිගේ කොට්ටය ඔසවා බැලුවාය. සිතුවා හරිය. සරසිගේ දුරකතනය කොට්ටය යටය.

“නංගී?” ආකාශ් යළිත් කතා කලේ ඇයගෙන් පිළිතුරක් නොවූ නිසාය.

“මේකයි අයියේ සාරාට ටිකක් සනීප නෑ මේ දවස්වල.”

“සනීප නෑ... ඇයි නංගි.. සාරාට මොකද වෙලා තියෙන්නේ?” ඔහු අසන්නේ කලබලයෙනි.

“දැන් දවස් දෙකතුනකට කලින් එයාට හොඳටම උණ ගත්තා. වෛරස් එකක්ලු. තාම හොස්පිට්ල් එකේ ඉන්නේ.”

"අනේ... එයාට ගොඩක් අමාරුයිද නංගි?"

"දැන් හොදයි අයියේ. හෙට ටිකට් කපනවා කිව්වා. එයාලාගේ අම්මාත් ඇවිල්ලා ඉන්නේ මේ ටිකේ."

"එහෙමද... අනේ සාරාව හොදට බලා ගන්න නංගී.. මං එහෙනම් තියන්නම් නංගි.."

"හරි අයියේ.. මං බලන්නම්"

ආකාශ් දුරකතනය තබා ශාලින්ද දෙස බැලුවේ ස්තූති පූර්වක දෑසිනි. ඔහු මතක් නොකළේ නම් ලිහිණිට ඇමතුමක් ගන්නට වන්නේ නැත.

"ඇයි ආකාශ් අයියේ?"

"සාරා හොස්පිට්ල් එකේලු බං. අම්මලාත් එහේ ගිහින්ලු."

"ඇයි අයියේ.. සාරාට මොනවා වෙලාද?"

"වෛරස් උණක් ඇවිල්ලා."

"පව්. ගොඩක් අමාරුයිලුද?"

"නෑ කොල්ලෝ... දැන් හොඳයිලු. හෙට ටිකට් කපයි කියන්නේ."

"අයියේ... ඔයා ගිහින් නංගිව බලලා ආවොත් නරකද?"

"මං කොහොමත් යන්න ඉන්නේ මල්ලී තව සතියකින් විතර."

ආකාශ් කියද්දී ශාලින්දට සිනහවක් නැඟුණි.

"මොකෝ?"

"නෑ මං කල්පනා කලේ කෙල්ල ලෙඩ වුණාම බලන්න යන්නේ නැකතකටද කියලා.."

"ඔය කිව්වේ ඉතිං. ලබන සතියේ සාරාගේ බර්ත්ඩේ එක යකෝ. මං බැලුවේ එදාට යන්න."

"ගිහිල්ලා ?"

"ගිහිල්ලා ඉතිං බලලා තෑග්ගක් එහෙම අරන්දීලා එන්න."

ශාලින්ද මදක් කල්පනා කරමින් ආකාශ් දෙස බලාා උන්නේය.

"ඊට වඩා හොද නැද්ද අපි පොඩි පාටියක් දුන්නොත්?"

"පාටියක්?"

"ඔව්. ලිහිණිගෙනුත් උදව් අරන්. ලස්සනට පාටියක්. අපිත් ඉන්නවානේ."

ආකාශ් ශාලින්ද දෙස බලා උන්නේ තම සොයුරෙක්ට තරම් ආදරයෙනි.

# 12.

“ෂා... සප්‍රයිස් බර්ත් ඩේ පාටි එකක්..”

නිම්නා කීවේ සිනාසෙමිනි.

“ඔව්... ඒක තමයි මතක ඇති කාලෙක මං සාරාට සුබ පතන්නේ නැතුව මගඇරපු උපන්දිනේ...එදා එහෙම කරපු එක ගැන මං අදටත් දුක් වෙනවා. මොකද සාරාටත් ඒක තදින් දැනිලා තිබුණා..”

“ඒ කියන්නේ පුංචි විෂ් කළේ නැද්ද?”

“නැහැ... මගේ ආදරේට විරුද්ධ වුණ නිසා මං සාරා එක්ක තරහින් හිටියේ... ඒත් සාරා බලන් ඉදලා තිබුණා මං කතා කරනකම්..”

“පව්...” දර්ශිට කියවුණේ ඉබේටමය.

"හ්ම්... කොහොම වුණත් ඒ පාටියට වැඩිම මහන්සියක් දරලා තිබ්බේ ශාලින්ද... ඒක මට සාරා පස්සේ කාලෙක කිව්වා..."

***************

"එහෙනම් අපි හෙට සාරා නඟා බලන්න කොළඹ යනවා එහෙනම්..." ගයාන් කීවේ ගමනට සූදානම්වන අතරේය.

"යකෝ උඹට තියෙන සතුට..."

"සතුටු නැද්ද බං... දැක්කත් සීදේවි කෙල්ලනේ.."

"ආ... හා... හා.. ඇති ඇති.."

"ඇයි ඇයි මොකද? බලපං උඹේ ඊරිසියාව...." ගයාන් කියද්දී ශාලින්ද ද ඔහුට එක්ව සිනාසුණේය..

"ඒක නෙමෙයි බං... අර සාරා නංගිගේ යාළුවා ඉන්නේ... මධූ ද කව්ද.."

"ඔව් ඉතිං...?"

"ඒකිට පිස්සුද බං අර මිගාරයාත් එක්ක සෙට් වෙලා ඉන්නේ?"

"කිව්වට තේරුම් ගන්නේ නෑ බං. මාත් කිව්වා.. සාරා මුලදිම කිව්වා. ඒ ගැන කියන්න ගිහින් දැන් ඔය සාරා එක්කත් තරහා වෙලා ඉන්නේ.."

"නෑ.. සිරාවටම? උන් දෙන්නා හරියට ඉදිකට්ටයි නූලයි වගේනේ හිටියේ.." ගයාන් කීවේ විස්මය පිරි මුහුණින් යුතුවය.

"ඒක තමයි ඉතිං. සාරා හෙන අවුලෙන් ඉන්නේ.."

"අනිත් එක බං ආකාශ් මං දැනුවත්ව මිගාරයාට තව සම්බන්ධයක් තියනවා. මේ අපේ ගමේ අපි හොඳට දන්න කෙල්ලෙක් එක්ක... පුළුවන් නම් හිතලා කියපං..."

“කවුද බං? විකාර නොකර කියපංකෝ...”

“වෙන කවුරුත් නෙමෙයි අර බනූරි බං.”

“බනූරි! අර අපේ හර්ෂයාගේ නංගි?”

“ඔව් බං. හැබැයි උන් දෙන්නා නම් තකට තක..” ගයාන් කීවේ සිනහවෙමිනි.

“මේකට මොනවා හරි කරන්න වෙනවා බං. මධූ උෟට රැවටිලා ඉන්නේ... හැබැයි මේ.. මං උඹට එකක් කියන්නම් උඹ වැරදිලාවත් ඔය කතා සාරා ඉස්සරහා එහෙම කියන්න එපා. කෙල්ල දැනටමත් අවුලෙන් ඉන්නේ..”

ආකාශ් කීවේ ගයාන්ගේ කටේ දිග පළල හොඳින්ම දැන උන් නිසාය.

“ඒක ඇත්ත ගයාන් අයියේ. ආකාශ් අයියාගේ කතාව හරි. අපි ඒකට මොකක් හරි කරන්න බලමු. සරසි නංගිට එයාගේ වැඩ ටික නිදහසේ කරගෙන යන්න දෙමු. මං නම් කියන්නේ අපිට මධූට මේ ගැන තේරුම් කරලා දෙන්න බැරි

වෙන එකක් නෑ...'' ශාලින්ද ද ආකාශ්ගේ කතාවට එකතුවෙමින් කීවේය.

''හරි බං. එල. අපි ගේමක් ගහමු එහෙනම්.'' ගයාන් සිනහවක් පා ඔවුන්ට එකඟ වූවේය.

තමාගේ උපන්දිනය බව දැන දැනත් ආකාශ් තමාට සුබ පතන්නට කතා නොකළ එක ගැන සරසි උන්නේ දුකෙනි. ඇය දවසේ මුල්ම සුබ පැතුම බලාපොරොත්තු වූවේ ඔහුගෙනි. මිදුලේ බංකුවට වී කල්පනා කරමින් සිටි ඇය ලිහිණි තමා වෙතට එනවාවත් නොදුටුවාය.

''සාරා..''

ලිහිණිගේ හඬට ඇය නිහඬවම හිස ඔසවා බැලුවාය.

''මොකද බං මේ උදේ ඉඳලම මූණ එල්ලගෙන? කෝ නැගිටලා වරෙන් ගමනක් යන්න.

''කොහෙද?'' සරසි ඇසුවේ පුදුමයෙනි. අද යාමට ඔවුන් විශේෂ ගමනක් යොදාගෙන තිබුණේ නැත.

"ගමනක් ඉතිං... මේ මං දුන්න ගවුම ඇඳන් යං හොඳේ..." සරසිව කාමරය වෙත බලෙන්ම ඇදගෙන යන අතරේ ලිහිණී කීවාය.

අද දවසේ මුල්ම සුබපැතුම සරසිට ලැබුණේ ලිහිණීගෙනි. වෙනදාට නම් මුලින්ම සුබපතන්නේ මධූය. නොකීවාට අදවත් ඇය කතා කරන තුරු සරසි බලා උන්නාය.

කාමරයට ගිය සරසි ලිහිණී අද උදේ තෑගි කළ ඇයගේ කැමතිම මෝස්තරයේ අලුත් ගවුම ඇඳගෙන එයටම ගැලපෙන්නට ගෙනැවිත් තිබූ පාවහන් යුගල පයලා ගත්තාය.

"ඔහොම හිටපං මං ලස්සනට කොණ්ඩේ හදන්න..." කියමින් ලිහිණී සරසිව ඇඳ මත වාඩි කරවූවාය.

"ලිහිණීයෝ..."

"ම්..."

"කොහෙද අපි මේ යන්න හදන්නේ.."

“ගියාම බලා ගන්න ඉතිං.”

“අනේ..”

“කුරු කුරු නොගා හිටපං බං. උඹව මරන්න නෙමෙයි ගෙනියන්නේ.” කියූ ලිහිණි ඇතුළට ගියේ සූදානම් වන්නටය.

ආකාශ් සරසි වෙනුවෙන් උපන්දින සාදය සූදානම් කළේ කොළඹ සිටි ශාලින්දගේ මිතුරකුට අයත් නිවසකය. උදෑසනින්ම එහි පැමිණි මිතුරන් තිදෙනා සාදයේ කටයුතු සූදානම් කළෝය.

“ශාලින්ද... සේරම හරි නේද කොල්ලෝ..? ලිහිණි මැසේජ් එකක් දාලා. එයාලා එන ගමන්ලු..”

“සේරම හරි ආකාශ් අයියා... කිසි අවුලක් නෑ..” ශාලින්ද උඩුමහලේ සිට පහළට එබෙමින් කෑ ගැසුවේය.

ඒත් සමඟම ගේට්ටුව අද්දර ත්‍රීවීලරයක් නතර විය. එයින් බැස සුරංගනාවියක් මෙන් නිවස දෙස බලා

හිදින සරසි දෙස ආකාශ් බලා උන්නේ ආදරයෙනි. ඔහුගේ මෙන්ම තවත් දෑසක් ආශාවෙන් සරසි දෙස බලා උන් බවක් ආකාශ්වත් සරසිවත් දැන උන්නේ නැත.

ගේට්ටුවෙන් ඇතුළට පැමිණි සරසි සුවිසල් නිවසේ දොරකඩ සිටි රුව දැක පුදුමයෙන් ගල් ගැසුණාය.

"දෙයියනේ... ආකාශ් අයියා..."

සරසි ඔහු වෙත දුවගෙන ගියේ සතුටින් ඉපිලෙමිනි. ලිහිණි බලාසිටියදීම ඇය ආකාශ්ව වැළඳ ගත්තේ සතුටු කඳුළු හෙළමිනි.

"හැපි බර්ත් ඩේ බබා.."

"අනේ.. ඔයා..."

"ඇයි ළමයෝ මේ අඬන්නේ ඉතිං..?"

ආකාශ් ඇසුවේ සරසිගේ කඳුළු පිරි මුහුණ දෝතින්ම ගෙන ඒ දෑසට එබෙමිනි.

"සතුටට දෙයියනේ සතුටට.."

"සතුටට  නම් අඩන්න එපා ළමයෝ... හිනාවෙන්න..." ඔහු කීවේ සරසිගේ නෙතින් ගලා ගිය කඳුළක් පිසලමිනි.

# 13.

"අඩන්න එපා සාරා... අපි කඳුළු පිහිදාගෙන යමුකෝ ඇතුළට..."

සරසි අතේ තිබූ ලේන්සුවෙන් කඳුළු පිසදාගෙන ලිහිණී දෙස හැරී බැලුවාය.

"ලිහිණී නංගා... යමු ඇතුළට.."

සරසි ගෙතුළට යන්නට අඩිය තිබ්බේ ආකාශ්ගේ සුරත තදින් වැළඳගෙනය.

"ඩෝං...."

එක්වරම විශාල ශබ්දයකින් යමක් පුපුරා යද්දී බියපත් වූ සරසි කෑ ගසමින් ආකාශ්ගේ ගෙලෙහි එල්ලුණාය. සතර අතට විහිදෙන පාට පාට කොළ කැබලි අතරින් මතු වුනේ ගයාන්ගේ සිනා මුහුණයි.

"හැපි බර්ත් ඩේ නඟා..."

“මොනවද ගයාන් අයියේ කරන්නේ.... මං හොඳටම බයවුණා...” සරසි කීවේ පපුවට අතක්ද තබාගෙනය.

“ඔහොම නම් බෑ නඟා... අපේ ආකාශ්ගේ වයිෆ් වෙන්න ඉන්න එකේ... ඔය වගේ සද්ද බද්ද වලට හුරු වෙන්න වෙනවා...”

“ඒ මොකද?” සියල්ලන්ටම පෙර ඇසුවේ ලිහිණිය.

“ඇයි මේ අපේ එකාට තරහා ගියාම අතට අහුවෙන එක පොළවේ ගහනවානේ...” ගයාන් කීවේ සිනාසෙමිනි.

“හැබැයි අපේ එක්කෙනාගෙත් වැඩි වෙනසක් නෑ..”

“එහෙනම් අපිට පුළුවන් වෙයි දෙන්නා බැන්දට පස්සේ ගේ වටේට වළං කටු ඇහිද ඇහිද ඉන්න.” ශාලින්ද පහළට එමින් කී කතාවට සියලු දෙනාම සිනාසුණේ මහ හඬිනි.

ආකාශ් සූදානම් කර තිබූ උපන්දින කේක් එකත් කපා ඉන් අනතුරුව කට්ටිය බොහෝ වෙලාවක් කතා බහ කරමින් සිටියහ.

“අහන්න සාරා... ඔයා ගමට එන්න ඕන හොඳට ඉගෙන ගෙන ඉවර වෙලා තේරුණාද? මගෙන් කෝල් එකක් නෑ කියලා මූණ එල්ලන් ඉන්න ලෑස්ති වෙන්න එපා. මේච්චර කල් හිටියා වගේ අපි ඉතිරි ටිකත් ඉමු. මං ඔයාට මැසේජ් කරන්නම්. ඒත් ප්ලීස් ඔයා මට වැඩිය අවධානයක් ඔයාගේ පාඩම් වලට දෙන්න ඕන තේරුණාද?”

“අනේ ඒත්..”

“කියන දේ අහන්න ළමයෝ... මේක සෙල්ලම් කරන කාලයක් නෙමෙයි. දන්නවා නේද අම්මයි තාත්තයි ඔයා ගැන කොච්චර බලාපොරොත්තු තියාගෙනද ඉන්නේ කියලා? ඔයා අනිවාරෙන් හොඳ තැනකට එන්න ඕන. ඒ දවස එනකම් මාත් බලන් ඉන්නවා. හොඳද?” සරසි හිස වැනුවේ “හා” කියන්නටය.

එදින සරසි ආකාශ්ගෙන් වෙන් වී ආවේ සතුටක් මෙන්ම දැඩි වේදනාවක්ද සිතට දැනෙද්දී ය. ඇය බෝඩිමට පැමිණි පසුත් කල්පනා කළේ මේ සිහිනයේ කවදා වනතුරු

ඉන්න ලැබේවිදැයි කියාය. නොසිතන දිනයක මේ සිහිනයෙන් අවදි වන්නට වන බව ඇය දැන උන්නාය.

*******************

"හිතේ මුලින්ම ආකාශ් අයියා ගැන කැමැත්තක් ඇතිවුණ දවසේ ඉඳලා සාරා හිතුවා. ඒ දෙන්නට එන්න තියෙන ප්‍රශ්න ගැන... ඒ දේවල් එක්ක ඉස්සරහට යන්නේ කොහොමද කියන එක ගැන.."

"ඉතිං පුංචි.. ඊට පස්සේ මොනද වුණේ?"

"ගොඩක් දේවල් වුණා දුව... අපි නොහිතපු දේවල් ගොඩක් වුණා."

"ගොඩක් දේවල්?" තනුක ඇසුවේය.

"ඔව් පුතා. හිටපු ගමන් කතාව වෙන පැත්තකට හැරුණා. අපි හීනෙකින්වත් නොහිතපු විදිහටයි කතාව ඉවර වුණේ... කොහොම වුණත් ඒ දෙන්නා ආදරෙන් හම්බෙලා කතා කරපු අන්තිම දවස එදා කියලා එයාලාවත් දැනන් හිටියේ නෑ..."

"මොකක්! ඇයි පුංචි... මොකද වුනේ ?" නිම්නා ඇසුවේ පුදුමයෙනි.

"මොනවා වෙන්නද ඉතිං. එයා අර පස්සෙන් ආපු කොල්ලා එක්ක යාළුවෙන්න ඇති..." අනුජ් කීවේ උපහාසය කැටි වූ හඬිනි.

"නැහැ පුතා. ඒ දවස්වල මං සාරා එක්ක තරහයි තමයි. ඒත් මං සාරාගේ හිත හොඳට දන්නවා. සාරාට කවදාවත් ආකාශ් අයියව දාලා වෙන කෙනෙක් ළඟට යන හිතක් තිබුණේ නෑ..."

"පුංචි කෙහොමද හරියටම කියන්නේ? හිත් කියන දේවල් අපි නොහිතන වෙලාවල් වල වෙනස් වෙන්න පුළුවන් නේද?"

කවාදාවත් නැතිව මේ ප්‍රශ්නයේදී නිම්නා තමාගේ මතය පිළිගත් එක ගැන අනුජ්ට දැනුනේ සියුම් සතුටකි.

"නැහැ දරුවෝ... ඔයාලා සාරා ගැන නොදන්න නිසයි ඔහොම කියන්නේ. මුල ඉඳලම එයා හිටපු මතේ ඇහුවොත් ඔයාලා පුදුම වෙයි"

"ඒ මොකක්ද?"

"එයාලාගේ සම්බන්ධෙට ගෙදරින් විරුද්ධ වෙන බව සාරා දැනගෙන හිටියා. ඒ වගේම තමයි ගෙදර අයට පිටින් ගිහින් හිතුවක්කාර තීරණයක් ගන්න පුළුවන් කමක් එයාට තිබුනේ නෑ... ඒත් සාරා තීරණය කරලා තිබුණේ.. ඒ දෙන්නා කතා බහ කරලා දෙන්නාගේ කැමැත්තෙන් වෙන් වුණොත් ඇරෙන්න වෙන කිසිම බලපෑමක් නිසා ආකාශ් අයියව අමතක කරන්නේ නෑ කියලා...ලෝකෙට පේන්න වෙන් වුණත් හැමදාම ආකාශ් වෙනුවෙන් ඉන්නවා කියන තීරණේ එයා හිටියේ..."

"ඒ කියන්නේ තනිකඩවම?"

"ඔව් අනුජ් පුතා. පුදුමයි නේද? සාරා තනිකමට හුරු වෙන්න හිත හදාගෙන හිටියේ ඒ කාලේ ඉඳලම. අදටත් එයා ඔයාලාගේ ගෙදරින් ගියාට හිතින් ඔයාලා දෙන්නටම බැඳිලා ඉන්නේ. ඒක කවදාවත් වෙනස් වෙන්නේ නෑ.."

කියූ ඇය නැගිට ගෙතුළට ගියේ රාත්‍රී ආහාරය සකස් කරන්නටය. ඇය ගිය පසු මද වෙලාවක් යන තුරු මිතුරන් අතර පැවතියේ නිහඬතාවයකි.

“මං හිතන්නේ අපි බලංගොඩ එන්න තීරණය කරපු එක ගොඩක් හොදයි.” දර්ශි කීවේ කල්පනාබරවය.

“ඒක ඇත්ත. මෙතන අපි හිතුවට වඩා වෙනස් ලොකු කතාවක් තියෙවා..”

“ඔව් නිම්නා. ඒක මටත් තේරුණා” තනුක කීවේ නෙත් කොනින් අනුජ් වෙත බැල්මක් හෙළමිනි.

අනුජ් උන්නේද කල්පනා කරමිනි. තවමත් ඔහු සරසි ගැන හොදක් දකින්නට කැමති නැත. ඒ තරම් තද වෛරයක් ඇය ගැන ඇති කරවන්නට මේ කතාව අනුජ්ට කී තැනැත්තාට හැකි වී තිබුණි.

“අනුජ්...”

නිම්නා කතා කලේ අනුජ්ගේ සුරත මතින් අත තබමිනි. බොහෝ වෙලාවක් කල්පනාවේ ගිලී සිටි ඔහු පියවි ලොවට ආවේ ඒ මොහොතේය. දර්ශි හා තනුක ගෙතුළට

යනවාවත් ඔහුට දැණුනේ නැත. නිම්නා ඔහු අසල නතර වුණේ හිතාමතාමය.

"දැන් ඇති නේද කල්පනා කළා..?"

"මං නිම්නා ... මේ.."

"මං දන්නවා... ඔයාගේ හිත මේ වෙලාවේ කලබලයි කියලා. ඒත් අනුජ් අපි කලබල වෙලා තීරණයක් ගන්නවට වඩා ඇත්ත දැනගන වැඩ කරන එක හොඳයි නේද?"

"ඇත්ත... මොකක්ද ඔය කියන ඇත්ත නිම්නා? ඇත්තම කතාව එයා මගේ අම්මා නෙමෙයි කියන එක නේද? එයත් ඒක පිළිගත්තා..."

"ඔව් අනුජ්. ඒ කතාව ඇත්ත වෙන්න ඇති. ඒත් එයා කවදාවත් ඔයාට කුඩම්මා කෙනෙක් වුණෙත් නෑ..."

"නිම්නා.."

"මං දන්නවා... ඔයා ඔය තත්ත්වෙන් එයා ගැන හොඳක් හිතන්න කැමති නෑ... ඔයා ඒ අතීතය ගැන අහපු කතාව ඒ තරම් නරකයි."

"මේ අපි අහගෙන යන කතාවේ අවසානේ ඒක නෙමෙයි කියලද ඔයා කියන්න හදන්නේ?"

"අනුජ්, ඒ කතාවේ අවසානේ ගැන අපි තාම දන්නේ නෑ. සමහර විට ඔයා කියන දේ ඇත්ත වෙන්න පුළුවන්... සමහර විට ඊට වඩා වෙනස් කතාවක් වෙන්නත් පුළුවන්... ඒත් මට හිතෙන්නේ මෙතන වෙනස් කතාවක් තියෙනවා."

"එහෙම නොවුණොත්?"

"මේ අහන්න අනුජ්. අපි ඉස්සෙල්ලා වුණ දේවල් දැනගෙන ඉමු. ඊට පස්සේ තීරණය කරමු මොකද කරන්නේ කියලා... මෙතනදි ඇත්තටම සාරා ඇන්ටි වැරදි නම්.. එතනින් එහාට ඔයා ගන්න ඕනම තීරණේකට අපිත් එකඟයි. හැබැයි.."

"හැබැයි?"

"මෙතන එයාගේ වැරැද්දක් නැත්තම් අපිට සිද්ධ වෙනවා මේ වුණ දේවල් සේරම හරි ගස්සන්න."

"හ්ම්... ඒක එතකොට බලමු."

"හිත කලබල කරගන්නේ නැතුව ඉන්න අනුජ්.." කියා අනුජ්ගේ උරහිසට තට්ටුවක් දැමූ නිම්නා මද වෙලාවක් ඔහු දෙස බලා හිඳ ගෙතුළට ගියාය.

# 14.

ඉන්දු නිවාඩු දිනයේ දියණියන් දෙදෙනාත් සමඟ ආකාශ්ගේ නිවසට ආවේ ඔවුන් දෙදෙනාගේ සුව දුක් බලා යාමටය. දෙන්නාට දෙන්නා ඉන්නේ හිත හොඳින් නොවන බව ඉන්දු හොඳින්ම දනී. ඈත තියාම ඔවුන්ව දුටු ආකාශ් ඉදිරියට ගියේය.

"ඉන්දු අක්කා... මගේ කෙල්ලෝ දෙන්නාත් ඇවිල්ලා... එන්න එන්න. "

"කොහොමද බාප්පි?"

"ඉන්නවා චූටි දුව ඉතිං... ඔයාලාට කොහොමද?"

"හොඳයි බාප්පි.."

"බාප්පී... කෝ මල්ලී?"

ඉන්දුගේ බාල දියණිය දෙනෙත් ආලින්දයේ අසුනකට බර වෙද්දී වැඩිමහල් දියණිය ඇසුවේ වටපිට බලමිනි.

“එයා යාළුවොත් එක්ක ට්‍රිප් එකක් ගියා දෝණී.”

“ඒ කොහෙද ආකාශ්?”

“අනුරාධපුර කියලා කිව්වේ අක්කා. දැන් දවස් තුනක් වෙනවා ගිහින්.”

“අයියෝ එහෙමද... කවද්ද එනවා කිව්වේ බාප්පී?”

“යාළුවෙක්ගේ ගෙදරක් තියනවලු එහේ. කට්ටිය එක්ක ටික දවසක් ඉදලා එනවා කිව්වා.”

දෙනෙතිගේ මුහුණ බිමට බර වූයේ ඉබේටමය. ඇය අද ආවේම මල්ලිව කතාවට අල්ලා ගන්නට සිතාගෙනය. මල්ලිටත් මේ පොඩි අක්කාටත් හමුවූ විට කියවන්නට හැමදාමත් රස කතා ගොඩක් තිබේ.

“විභාගෙත් ඉවර එකේ කොල්ලාට පාළුත් ඇති.”

"ඒක තමයි මාත් ඔහේ යන්න ඇරියේ..."

"සේන මාමා..." කියා කෑගසමින් දෙනෙති කුස්සිය දෙසට ගියේ ඔහුව කතාව අල්ලා ගන්නටය. ඒ කාලයේ සිටම සේන මාමා මේ දරුවන් තිදෙනාට බොහෝ ලෙන්ගතුය.

තම බාල දියණියට යන්නට හැර ඉන්දු දෙව්මි දෙස බලා හිසින් ආකාශ්ව පෙන්වූවාය.

"බලන්න දෝණී බාප්පිගේ හැටි.." ඇය නොකියා කිව්වේ එයයි.

"බාප්පී... අනේ මේ මොකද බාප්පී? ඔහේ බලාගෙන කල්පනා කර කර ඉන්නේ... රැවුලවත් කපලා නෑ නේද දවස් ගානකින්? ගෙදරත් එක්ක පාළුවට ගිහින්..."

දෙව්මි කතා කලේ වේදනාවෙනි. පුංචි කාලයේ සිටම දෙව්මිගේ ලොවේ වීරයා මේ බාප්පාය. බාප්පාගේ වෙනස නැඟනියට නොදැනුනද දෙව්මිට එය තදින්ම දැනුණේ ඒ නිසා වන්නට ඇත. ඇයට බාප්පා ගැන දැනුනේ අනුකම්පාවකි.

"ගේ පාළු වුණේ ඔයාගේ පුංචි මේ ගෙදර දාලා ගිය දවසේ ඉඳලා දෝණී..." ආකාශ් කීවේ මළානික මුහුණිනි.

"හැමදාම මෙහෙම ඉන්නද හදන්නේ බාප්පී... මං මල්ලිට කතා කරන්නද?"

"එයා අපි කියන දේවල් අහන්න ලෑස්ති නෑ දෝණී. ඔයා හිතන්නේ මං උත්සහ කළේ නෑ කියලද? හැම වෙලාවකම වුණේ අපි දෙන්නම හිත් රිදවගත්ත එක විතරයි. අනුජ් පුංචිගේ නමවත් අහන්න කැමති නෑ.."

"එහෙම කියලා අපිට බලන් ඉන්න පුළුවන්ද බාප්පී? ඒ කාලේ වුණ දේවල් සේරම මං දැක්කා. ඔය දෙන්නා කොච්චර දුක් වින්දද? මෙහෙම කිව්වට මොකුත් හිතන්න එපා බාප්පී... ඔයාට ආදරේ කරලා එයා පුදුම දුකක් වින්දේ."

ආකාශ් එය දැන උන්නේය. ඇය තමා වෙනුවෙන් තමාට කළ ආදරය නිසා වින්ද දුක ඔහුට රහසක් නොවේ.

"පුංචි ආදරේ කළේ බාප්පිට විතරක් නෙමෙයි. අපි හැමෝටම ආදරේ කළා. මට මතකයි ඉස්කෝලේ ඉදලා ආපු ගමන් අපිව හොයාගෙන එන්නේ... කවදාවත් මට ඇදුමක්

ගන්නේ නැතුව එයා ඇඳුමක් ගත්තේ නෑ... අපේ අම්මාට පවා පුදුම ආදරෙන් සැලකුවේ. තාරු පුංචිට පවා එයා ආදරෙයි. අනේ බාප්පී... ඒ ආදරේ අපට නැති කරන්න එපා. මල්ලිට මේවා තේරුම් කරලා අපි කොහොම හරි පුංචිව හොයාගමු..."

කියූ ඇය මිදුලට බැස්සේ කඳුළු පිසලමිනි.

ඉන්දු බැලුවේ ආකාශ් දෙසය. ඔහුගේ මුහුණ බලන්නට බැරි තරම් දුකය. දෙව්මි කී කිසිවක් බොරු නොවන බව ඇයද දනී.

"මල්ලී... සාරා ගියපු එක කෙල්ලෝ දෙන්නටම දරා ගන්න බෑ. දෝණී ඇඩුවත් එක්ක. මල්ලී දන්නවානේ මේ දෙන්නා මටත් වඩා සාරාට ආදරෙයි. ඒ නිසයි ඔය. මල්ලී දුක් වෙන්න එපා. අපි කොහොම හරි සාරාව හොයාගමු."

ඉන්දු ආකාශ්ගේ සිත සැදීමට බොහෝ උත්සහා කළාය. මේ දෙන්නා එකිනෙකාට ආදරය කරන්නේ බොහෝ කාලයක සිටය. නමුත් දෙදෙනාට සතුටින් එක්ව ජීවත් වීමට ලැබුණේ ඉතා කෙටි කාලයකි. නොසිතූ තරම් බාධක ඔවුන්ට ආවේය.

****************

"බාප්පා..."

දෙව්මි කතා කරන විට ආකාශ් උන්නේ කාමරයේය. ඉන්දු කුස්සියේ සේනත් සමඟ ආහාර පිසිමින් උන්නාය.

"එන්න දෝණී."

දෙව්මි හෙමින් දොර රෙද්ද මෑත් කර බලා කාමරයට ඇතුළු වූ වාය. ආකාශ් මද සිනහවක් පා ඇයව තමා අසලින්ම වාඩි කරවා ගත්තේය.

"බාප්පා.."

"කියන්න දෝණී.."

"පුංචි ඉන්න තැනක් ගැන ආරංචියක් නැද්ද?"

ආකාශ් බරැති සුසුමක් හෙලා හිස වැනුවේ 'නැතැ'යි කියන්නටය.

"අඩු තරමේ කෝල් එකක්වත්?"

"නැහැ දෝණී. මං පුළුවන් හැම තැනකම හෙව්වා. දන්න හැම කෙනෙක්ටම කතා කරලා බැලුවා. එයා හරි පුදුම විදිහට අපිව අතඇරලා දාලා."

"පව්.. එයා ඒ විදිහට තමන් ආදරේ කරන දේවල් වලින් ඈත් වෙන්න පුරුදු වුණෙත් ඔයා නිසා ම තමයි බාප්පි."

දෙව්මි එසේ කියද්දී ආකාශ් ඇය දෙසට හෙළුවේ පුදුමයට පත් බැල්මකි.

"මං නිසා..?"

"ඔව් බාප්පි..."

"ඒ කොහොමද දෝණී?"

"පුංචි ඒ දේට හුරු වුණේ බාප්පා කසාඳ බඳින බව දැනගත්ත දවසේ ඉඳලා. බාප්පා ළඟ එයාට තිබුණ තැනට තාරු පුංචි ආපු දවසේ ඉඳලා."

"තාරුකා..."

" බාප්පා... දැන් පරණ දේවල් මතක් කරලා වැඩක් නෑ. මට සමාවෙන්න. ඒ අතීතය වේදනාවක් විතරයි කියන්න මං දන්නවා. දැන් අපි කොහොම හරි පුංචිව හොයා ගන්න බලමු."

දෙව්මි කීවේ ආකාශ්ගේ වත දුකින් මැලවී යද්දීය.

****************

ආකාශ්ගේ දූරකතනයට ඇමතුමක් ලැබුණේ නාදුනන අංකයකිනි. ඔහු ඇමතුමට සම්බන්ධ වූයේ මේ කතා කරන්නේ සරසි වේවායි පතමිනි. නමුත් ඒ සරසි නොවේ. ආකාශ්ට ඇසුණේ වසර ගණනාවකට පෙර ඇසුණු හුරුපුරුදු කටහඬකි.

"ගයාන්?" ආකාශ් කතා කලේ පුදුමයෙනි.

"ඔව් මං තමයි... මට ආරංචි වුණා උඹේ සාරා උඹව දාලා ගියා කියලා..." ගයාන් කීවේ සමච්චල් හඬිනි.

"උඹ මට හිනා වෙනවද ගයාන්?"

"මං විතරක් නෙමෙයි යකෝ... මේවා දන්න හැමෝම උඹට හිනාවෙනවා... පව් බං උඹ."

"උඹ කතා කළේ ඕක කියන්න නම් මං තියන්නම් එහෙනම්..." ආකාශ් කීවේ වසර ගනනාවක් එකට සිටි මිතුරාට කිසිවක් කියන්නට තවමත් දිව නොනැමෙන නිසාය.

"ඇයි උඹට අහන් ඉන්න අමාරුද? ඔය ටික කරගන්න නේ උඹ දැඟලුවේ... සරසිව ළං කරගන්න ඕනවට උඹ අර අහිංසක කෙල්ලවත් මරාගෙන හිරේ ගියා."

"ගයාන්..."

"උඹ මහ පව් කාරයෙක් යකෝ...අර කෙල්ල මැරුණා. අන්තිමට සරසි උඹ ළඟට ආවා. ඒත් ඊට පස්සේ ඒකිගේ මිනිහටයි දරුවටයි මොකද වුණේ.."

"මේක අහගනිං ගයාන්... මං තාරුකාව මැරුවේ නෑ. ඔය කියන විදිහේ උවමනාවක් මට තිබ්බා නම් මං ඒ කෙල්ලව කසාද බදින්නේ නෑ."

"ඒ වුණාට ඒක වුණා. ආකාශ් උඹ නිසා ඒ කෙල්ල මැරුණා.. අර ලස්සනට තිබ්බ පවුලක් කඩලා උඹ සරසි එක්ක අළුතින් පවුලක් හදා ගත්තා. දැන් මොකද වුණේ ? ඕවට තමයි කියන්නේ කලකම් පල දෙනවා කියලා.."

"සාරා ගෙදරින් ගියා කියලා මගේ පවුල කැඩෙන්නේ නෑ මිනිහෝ... සාරා ආයේ එනවා. මං ඒක දන්නවා." ආකාශ් කීවේ ආවේගයෙනි.

"ඔව් ඉතිං. ඒකිත් එදා ඉඳලම උඹේ පව්වලට කරගහන්න එන එකීනේ.."

"වැඩිකල් යන්නේ නෑ සාරා එනවා." ආකාශ් තමාටම මුමුණා ගත්තේය.

"මට මෙච්චර කාලයක් උඹට මේක කියන්න බැරි වුණා. මේ කරපු දේවල් වලට උඹට සහගහනවා යකෝ... උඹ දරුවෝ දෙන්නෙකුට අම්මලා නැති කරපු පව්කාරයෙක්.. උඹට දැන් විඳවන්න වෙලා තියෙන්නේ ඒවට තමයි..." කියා ගයාන් දුරකතනය තැබුවේ ආකාශ්ගේ සිතට තවත් බරක් එකතු කරමිනි.

# 15.

"කතාවේ හැටියට නම් අනුජ්, ඔයාලාගේ ලොකු අම්මා කිව්වා වගේ අපි නොදන්න කොටසකුත් මේකේ තියනවා."

තනුක කීවේ අනුජ් සමඟ පහළ දිය පහරේ නාගෙන ආපසු එන අතරේය.

"ඒක නම් මටත් හිතුණා තනුක. අනේ මන්දා.."

"උඹ පසුතැවෙනවද අනුජ්?"

"මොනවා ගැනද?"

"සාරා ඇන්ටි..."

"නැහැ තනුක. මට එහෙම කිසිම පසුතැවීමක් නෑ.." කී අනුජ් ගමන ඉක්මන් කළේය.

sinhalaebooks.com

දර්ශී හා නිම්නා උන්නේ පුංචි සමඟ කුස්සියේ ආහාර පිසිමිනි. අනුජ් අමනාපයෙන් මෙන් ගෙතුළට යනු ඔවුන්ද බලාගෙනය.

"නිම්නා පුතේ.."

"පුංචි.." නිම්නා එළවළු කපන එක නවතා මොහොතකට ඇය දෙස බැලුවාය.

"අපේ අනුජ් හරි කේන්තිකාරයා නේද?"

"අපෝ... කියලා වැඩක් නෑ පුංචි."

"ඉස්සර ආකාශ් අයියත් ඔහොමයි. ඒක පුදුම කේන්තියක්. දවසකට සැරයක් මොකකට හරි පැටලෙනවා. බලන් ගියාම තාත්තා විදිහම තමයි පුතත්.."

"ආකාශ් අංකල් දැන් එහෙම නෑ නේ .."

දර්ශී කීවේ පුදුමයෙනි. ඔවුන්ට මතක ඇති කාලයේ සිටම ආකාශ් ඉතා නිවුණු ගති පැවතුම් ඇති තැනැත්තෙකි.

"ඒ කාලේ වුණ දේවල් එක්ක ආකාශ් අයියා හරි පුදුම විදිහට වෙනස් වුණා ළමයෝ..." ඇය කීවේ සුසුමක්ද හෙළමිනි.

හැන්දෑවේ මිතුරන් එකතු වූයේ කතාවේ ඉතිරි ටික අසා ගන්නටය. නමුත් ඒ මොහොතේම අනුජ්ගේ දුරකතනය නාද වන්නට විය.

"කවුද බං ඒ හෙනහුරා?" තනුක ඇසුවේ කතාවේ ඉතිරිය අසාගන්නට තිබූ වුවමනාව නිසාය.

සිනහවක් නඟාගත් අනුජ් ඇමතුමට සම්බන්ධ වූවේය.

"දෝණී අක්කා.."

"ආ... මලයට අපිව මතකයි එහෙනම්."

"එහෙම අමතක වෙනවද අක්කා.."

"හරි හරි... දැන් ඔය කොහෙද ඉන්නේ?"

"අපි ඉන්නේ බලංගොඩ.." අනුජ් කියද්දී තනුක හිසෙහි අතගසා ගත්තේය. නිම්නා හා දර්ශිද එකවර හැරී බැලුවෝය. අනුජ්ට එය සිහි වූයේ දැන්ය.

"න්...නෑ.. මේ මං කිව්වේ අනුරාධපුර අක්කා."

"අනුජ්." දෙව්මි කතා කළේ මදක් තදිනි.

"අක්කා."

"බොරු කියන්න ලෑස්ති වෙන්න එපා අනුජ්. ඔයා ඉන්නේ අනුරාධපුර නෙමෙයි."

"න්..නෑ.. නෑ .. දෝණී අක්කා.."

"අනුජ්...."

"හ්ම්... ඔව්. අපි ඉන්නේ බලංගොඩ. ඒත් අක්කා ප්ලීස්. මේ ගැන තාත්තා දන්නේ නෑ."

"හරි. මං බාප්පිට කියන්නේ නෑ. ඒත් මට කියන්න ඇයි බලංගොඩ ගියේ? දැන් දවස් ගානක් ඔහෙට වෙලා මොකද කරන්නේ?"

දෙව්මි ඇහුවේ කුතුහලයෙනි. බලංගොඩත් සමඟ තිබූ සබඳතා අතහැරී ගොස් දැන් ගොඩක් කල්ය. එහෙව් එකේ අනුජ් එහි ගියේ ඇයි?

"මං ආවේ මගේ අම්මට මොකද වුණේ කියලා දැනගන්න."

"සාරා පුංචි.."

"දෝණී අක්කා. ඔයත් දන්නවා නේද මගේ අම්මා එයා නෙමෙයි කියලා? මගේ අම්මා තාරුකා. මං ආවේ එයාට මොකද වුණේ කියලා දැන ගන්න."

"ඔයා ගියේ එහෙනම් ඒ අතීතේ හොයන්න."

"ඔව්."

"හරි කමක් නෑ. මට කියන්න ඔයා දැන් කා එක්කද ඉන්නේ? කාගෙන්ද ඔයා ඒ ගැන දැනගන්න යන්නේ?"

බලංගොඩ ඉතිරි වූයේ මිතුරන්ට වඩා සතුරන් බව දෙව්මි දනී. ඇත්තම කතාව දැන උන්නේ කිහිප දෙනෙක් පමණි. බොහෝ දෙනා වැරදි කාරයා බවට පත් කළේ සරසිවය. එහෙම කෙනෙක්ගෙන් අනුජ් සිදුවූ දෙය ඇසුවොත් ඔහුගේ සිතුවිල්ල නිවැරදි වන බව දෙව්මි දනී.

"අපි ඉන්නේ දර්ශිගේ පුංචිලාගේ ගෙදර. ඒ පුංචි සේරම විස්තර දන්නවා."

"මට එයාට කතා කරන්න ඕන මල්ලී."

"අනේ අක්කා. දැන් නම් අපි ටවුන් එකේ ඉන්නේ. ගෙදර ගියාම මං දෙන්නම් ඔයාට."

"හරි එහෙනම්. ඉන්න තැනක පරිස්සමින්."

"හරි අක්කා.."

අනුජ් දුරකතනය තබා මිතුරන් වෙත ආවේය. ඔහුගේ කතාව අසා සිටි මිතුරන් උන්නේ පුදුමයෙනි.

"ඇයි අනුජ් දෙව්මි අක්කිට අපේ පුංචි එක්ක කතා කරන්න දුන්නේ නැත්තේ?"

"ඒ ඔක්කොමලා ඉන්නේ එක පැත්තක. මට ඕන ඒ කවුරුත් මැදිහත් නොවී මේ කතාව අහගන්න."

"අනුජ්, උඹ බලන් ඉන්නේ කොතනකදි හරි සාරා ඇන්ටිව වැරදි කාරයා කරන්න. ඒකයි උඹ කැමති නැත්තේ එයාලා මේකට සම්බන්ධ වෙනවට."

තනුක කියාගෙන යද්දී අනුජ් කිසිවක් නොකියා නිහඬවම අසා උන්නේය.

"මේ අහපං අනුජ්... මතක ඇති කාලෙක ඉඳලා උඹව බලා ගත්තේ සාරා ඇන්ටි. උඹව විතරක් නෙමෙයි අපිවත් බලා ගත්තා. අනික උඹ සාරා ඇන්ටිට අර තරම් ආදරෙන් ඉදලා කොහොමද මෙහෙම..."

"ඔයා කියන එක ඇත්ත තනුක. මටත් තාම හිතා ගන්න බෑ අනුජ් සාරා ඇන්ටි ගැන මේ තරම් වෛරයක් ඇති කර ගත්තේ කොහොමද කියලා.."

“ඇත්තටම ඇයි බං උඹ අර යොමාල් කිව්ව පළියට මේවා විශ්වාස කළෙ? උඹ එහෙම එකෙක් නෙමෙයි නේ…”

“එදා මං ඒක විශ්වාස කළත් නොකළත් ඒ කතාව ඇත්ත කියලා අපි දැන් දන්නවානේ. අනික එදා යොමාල් අයියා මට…” අනුජ් කියන්නට ගිය දේ ගිල ගත්තේය.

“ඔව් කියන්න අනුජ්…”

“එයා මට අම්මාගෙයි තාත්තාගෙයි වෙඩින් ෆොටෝ එක පවා පෙන්නුවා. ඉතිං මං කොහොමද ඒක බොරුවක් කියන්නේ?”

“එහෙනම් ඒකයි වුණේ..” තනුක තමාටම මුමුණා ගත්තේය.

“අනුජ් මේක අහන්න. සමහරවිට මේ කියන දේ නිසා ඔයා මාත් එක්ක තරහා වෙයි. ඒත් මං කියන්නේ ඔයා මේ ගැනත් කල්පනා කරන්න ඕන.”

“මොනවද ගැනද කියන්නේ නිම්නා?”

"දැන් මේ කියන විදිහට ඔයාගේ අම්මා තාරුකා. මොකක් හරි දෙයක් නිසා ඔයා ඉපදුනාට පස්සේ එයා නැති වෙලා. වැරැද්ද කාගේ වුණත් එයා නැතිවෙලා ඉවරයි. ඔයාගේ තාත්තා අවුරුදු දහයකට හිරේට ගියා. ආච්චිලා සීයලා නෑ... ඉන්දු ආන්ටිට කරගන්න දෙයක් නෑ අක්කිලා දෙන්නම පොඩියි. එතකොට ඔයා වෙනුවෙන් කවුද ඉතිරි වුණේ?

අනාතයෙක් වගේ තැන් තැන්වල හැදෙන්න නොදී සාරා ඇන්ටි ඔයාට අම්මා වුණා. කවදාවත් එයා කුඩම්මෙක් වුනේ නෑ. අනික ඔය කියන විදිහට තාරුකා ආන්ටිව මරන්න එයාට ඕන වුණානම්, එයාට තාරුකා ආන්ටි ගැන වෛරයක් තිබුණා නම් එයා ඔයාව බාර අරගෙන ඔයා වෙනුවෙන් කැපවෙයි කියලා හිතනවද? එයාට තිබුණා ඔයාව අනාථ නිවාසෙකට බාර දීලා ආකාශ් අංකල් ආවාම එයාව මැරි කරන්න.

ඒත් එයා එහෙම කළේ නෑ. එයා අවුරුදු දහයක් තනියම ඔයාව හදා ගත්තා. රස්සාවක් කරලා හම්බකරා. ඔයාට හොදට ඉගැන්නුවා. කිසිම අඩුවක් නොකර. අවුරුදු 19ක් අනුජ්. දහ නමයක්! ඒ එයාගේ ජීවිතේ හොදම කාලේ. ඔයා වෙනුවෙන් කැප වුණා. එහෙව් කෙනාව ඔයා එක මොහොතින් පාරට ඇදලා දැම්මා. ඒත් එයා ඔයාට වචනයක් කිව්වේ නෑ නේද? ඔයාම හිතලා බලන්න අනුජ්... ඔයා කරපු දේ හරිද කියලා..."

"නිම්නා.."

අනිත් සියල්ලන්ම ගොළුවී බලා ඉද්දී අනුජ් ඇයට කතා කලේය. නමුත් ඒත් සමඟම ඇයගේ දුරකතනය නාද වද්දී ඇය එයත් රැගෙන ඉවතට ගියාය.

# 16.

දෙව්මි නැගෙනියත් සමඟ කෑම මේසයට යන විට ඉන්දුත් සංජීවත් කෑම මේසයට වාඩි වී සිටියෝය. මේ දෙදෙනා මේ පහළට එන්නේ ඉන්දු තෙවන වරටත් කතා කළ පසුය.

නිහඬවම කෑමට වාඩි වූ දෙව්මි කතා කරන්නට වූවේ කෑම ගන්නා අතරතුරේය.

“තාත්තා..”

“ම්… මොකද.. නඩුවක්වත්ද?” ඔහු ඇසුවේ සිනාසෙමිනි.

“මළ ගෙදරක් වෙලානේ. යන්න වෙයි.”

“කාගෙද මළගෙදර? අපි දන්නෙත් නෑනේ..” ඉන්දු කතා කළේ පුදුමයෙනි.

“කැම්පස් එකේ ළමයෙක්ගේ අම්මා කෙනෙක් නැති වෙලා. යාළුවෝ එකතු වෙලා යනවලු. මාත් යන්න වෙයි නේද?”

“කොහෙද මළ ගෙදර තියෙන්නේ?”

“ම්..මේ.. කෑගල්ලේ අම්මා.”

“කෑගල්ලේ? දැන් කාත් එක්කද යන්නේ?”

“මේකයි අපි යාළුවෝ හතර පස්දෙනා ගිහින් එන්න බැලුවේ. කාර් එකේ ගිහින් එන්න පුළුවන්නේ..”

“කාර් එකේ... ඔයා දැන් කෑගල්ලටම ඩ්‍රයිව් කරන් යන්නද හිතං ඉන්නේ?”

“අයියෝ අම්මා... අපිට මාරුවෙන් මාරුවට පුළුවන් නේ. අනික බෝයි කෙනෙකුත් යනවා. අපි ගිහින් එන්නම්.” දෙව්මි අම්මාත් තාත්තාත් දෙස බලා ආයාචනාත්මකව කීවාය.

"හ්ම්... පරිස්සමට ගිහින් එන්න." සංජීව තම තීන්දුව දුන්නේය.

"හෙට එනවා නේද?" ඔහු අවසර දුන්නද ඉන්දු මේ ගමන ගැන උන්නේ කැමැත්තෙන් නොවේ.

"ඒක හරි නෑනේ ඉන්දු. යාළුවෙක්නේ. අනික දන්නවනේ මෙයාලාට මළ ගෙදර යන ගමනත් ට්‍රිප් එකක්." සංජීව දෙව්මි වෙනුවෙන් කතා කළේය.

"ඒ වුණාට... එහෙනම් නංගිත් එක්කං යන්න."

"අපෝ අම්මා... මට බෑ මළ ගෙවල්වල යන්න. අනිද්දාට එක්සෑම් එකකුත් තියනවා. යාළුවෝ එක්කනේ යන්නේ අක්කි ගිහින් එයිනේ."

දෙනෙති කියන්නටත් පෙරම අකමැත්ත ප්‍රකාශ කළාය.

කෑම ගෙන අවසානයේ කාමරයට ගිය දෙව්මි ඇඳුම් කිහිපයක් ගෙන බෑගයට දමා ගත්තාය. අනතුරුව සුදු පැහැති ගවුමක් ගෙන මදින්නට වූවාය. හෙට පාන්දරින්ම යා යුතුය.

මේ අතරේ කාමරයට ආ දෙනෙත් ඇයගේ ඇඳෙන් වාඩි වූයේ දෙව්මි දෙස බලාගෙනමය.

"මොකක්ද මගේ සහෝදරී මේ අල්ලන්න යන අඩච්ච?" ඇය කෙලින් ඇසුවාය.

"ෂ්ෂු.... කෑගහන්න එපා මෝඩියේ." කියූ දෙව්මි ඉක්මනින් ගොස් කාමරයේ දොර වසා ඇමුවාය.

"මෝඩ පැටියා. කෑගහන්න විතරයි දන්නේ."

"හරි හරි... සොරි. කියනවකෝ කොහෙද යන්නේ කියලා..."

"යන්නේ බලංගොඩ."

"බලංගොඩ?"

"ඔව්."

"ඇයි මේ හදිස්සියේ... අම්මලාටත් බොරු කියලා මාවත් බොරුකාරයෙක් කරලා බලංගොඩ යන්නේ?"

"ඔයාව කවුද බොරුකාරයෙක් කළේ?"

"ඇයි මට එන්න කිව්වොත් එක්සැම් කියන්න කිව්වේ.. දැන් ඉතිං අම්මට පේන්න හෙට දවසම පාඩම් කරනවා වගේ රඟපාන්නත් වෙනවා."

"සොරි නංගා.. ඒත් මේ ගමන මං යන්නම ඕන."

"ඇයි කියලා කියන්න බැරිද? අම්මිලාට බොරු කියලා ඔයා තනියම යන්නේ? අනික දැන් බලංගොඩ අපේ කියලා කවුරුත්ම නෑනේ අක්කි.."

"ඉන්නවා. එහේ අනුජ් මල්ලි ඉන්නවා."

"මල්ලි? එයා අනුරාධපුර ගියා කියලනේ බාප්පි කිව්වේ..."

"නෑ. එයා බලංගොඩ ගිහින් තියෙන්නේ... තාරු පුංචිට මොනවද වුණේ කියලා හොයන්න."

"දෙයියනේ..."

"හා..හා... කට වහගනිං. මං ගිහින් එනකම් සිද්ධිය පත්තරේ නොදා කට පියන් ඉන්න බලන්න. මං ඉක්මනට මේක විසඳලා මල්ලි එක්කගෙන එනවා."

"හරි හරි... පරිස්සමින් ගිහින් එනවා එහෙනම්. මටත් එන්න තිබ්බානම් හොදයි. කොහෙද ඉතිං ඔයා මාව හැලුවානේ.." කියමින් දෙනෙති දෙව්මිගේ කාමරයෙන් පිටව ගියාය.

***************

අනුජ් සහ මිතුරන් නැවතත් දර්ශිගේ පුංචි වටා එකතු වූයේ කතාවේ ඉතිරි කොටසත් අසා දැන ගන්නටය.

"එදා සාරාගේ බර්ත් ඩේ එකෙන් පස්සේ ටික කාලයක් යනකම් ආකාශ් සාරා එක්ක කතාබහ කරලා තිබ්බා ෆෝන් එකෙන්. ඒත් එයාගේ ෆයිනල් එක්සෑම් ලං වෙද්දී

ආකාශ් අයියාගෙන් මැසේජ් එකක්වත් ආවේ නැලු. සාරා ඒ ගැන ගොඩක් කල්පනා කරලා තිබුණා. ලිහිණි සාරාගේ හිත හදන්න ගොඩක් මහන්සිවෙලා තිබ්බා. මොකද පාටි එක දවසේ ආකාශ් කියලා තිබ්බානේ වැඩ පාඩුවෙන නිසා කතා කරන්නේ නෑ කියා. ඒ කතාව සාරා වගේම ලිහිණිත් විශ්වාස කරලා තිබුණා. ආකාශ් අයියා නරක කෙනෙක් නෙවෙයි කියන්න ලිහිණිත් දැනගෙන හිටියා.''

*****************

''ආකාශ් අයියා පුදුම ආදරයක්නේ තියෙන්නේ මෙයාට...''

''ඇයි එහෙම කියන්නේ?'' සරසි ලිහිණිගෙන් ඇසුවේ මදහසක් නංවාගෙනය.

''වෙන කොල්ලෝ ඉතිං ලව් කරන්න ගත්තම ඔහොම පාඩම් කරන්න තියනවා කියලා හිත හිත ඉන්නේ නෑ නේ...''

''ඒක ඇත්ත ලිහිණි. එයා මට ගොඩක් ආදරෙයි. එයා මං දිහා බලන්නේ තාත්තා කෙනෙක් එයාගේ දුව දිහා බලන විදිහට... මගේ ජයග්‍රහණවලදි මටත් වඩා එයා සතුටු

වෙනවා. ඒ වගේම තමයි එයා බයයි මට ගොඩක් ළං වෙන්න. මොකද ඉස්සරහට ප්‍රශ්න ගොඩක් එනබව අපි දෙන්නම දන්නවා...'' සරසි කීවේ හැඟුම්බරවය.

''බය වෙන්න එපා. ඒ සේරම හොඳ විදිහට විසඳෙයි කෙල්ලේ.''

''අපි එහෙම හිතමු..''

''හරි හරි... දැන් පාඩම් කරපං. එක්සෑම් එකත් ළඟයි. ඒක ඉවර වෙලා ගමේ ගිහින් බැරියෑ දෙන්නට ලව් කරන්න..'' ලිහිණි කීවේ සිනාසෙමිනි.

******************

''ආකාශ් අයියාගෙන් මැසේජ් එකක්වත් නැතුව මාස හතරක් ගිහින් තිබ්බා. විශාගෙට මහන්සි වුණ නිසා සාරා ඒ ගැන වැඩිය හිතුවේ නෑ කියලා ලිහිණි කිව්වේ. ඒ වුණාට මං දන්නවා එයා කාටත් නොපෙනෙන්න ගොඩක් දුක් වෙන්න ඇති.එයා එහෙමයි..''

''ඊට පස්සේ මොකද වුණේ?'' අනුජ්ට ඉබේටම ඇසුණි.

"මාස හතරක් මැසේජ් එකක්වත් නෑ... ආදරේ කරන කෙනාට...විභාග නෙමෙයි මොනවා තිබ්බත් එහෙම ඉන්න පුළුවන්ද? මට නම් ඒකේ අමුත්තක් දැනෙනවා." නිම්නා මදක් කල්පනා කර කීවාය.

"ආදරේ පවර් එක තමයි." තනුක කීවේ සිනාසෙමිනි.

"විහිළු නෙමෙයි පුතා... ආදරේට ගොඩක් දේවල් කරන්න පුළුවන් කියලා මේ කතාව අහද්දී ඔයාලාට තේරෙයි."

"හරි හරි පුංචි... ඔයා කතාව කියන්නකෝ.." දර්ශි ඇවිට්ලි කළේ කතාවේ ඉතිරි ටිකත් ඉක්මනින් අසා දැනගන්නටය.

"හ්ම්... කොහොම හරි මාස හතරකට පස්සේ ෆයිනල් එක්සෑම් එකත් ඉවර කරලා සාරා ගමට ආවා... ඒත් එදා එයා එද්දී..."

මධූ කතාව නතර කළේ මිදුලේ මෝටර් රථයක් නතර වන හඬට ඒ දෙස හැරී බලමිනි.

වාහනයෙන් බැස නිවස දෙසට ඇවිද එන රුව දුටු මිතුරන්ගේ දෑස් පුදුමයෙන් විසල් වී ගියේය. අනුජ් හිඳ වුන් අසුනෙන් නැගිට්ටවුණේ ඉබේටමය.

නමුත් කාරයෙන් බැස ආ තැනැත්තිය ඔවුන්ව පසුකර ගොස් නතර වූයේ මධූ ඉදිරියේ ය.

“මධූ නැන්දි...”

“දෝණි....” මධූ කීවේ දෙව්මිව ආදරයෙන් වැළඳගනිමින් ය.

“දෝණි දැන් ගොඩක් ලොකුවෙලා නේ... මට දැක්ක ගමන් අඳුරන්නත් බැරුව ගියා..”

“අපිම හොයාගෙන එනකම් නැන්දි අපිව බලන්න ආවේ නෑනේ ඉතිං..” දෙව්මි නෝක්කාඩු කීවාය.

“අනේ මට සමාවෙන්න පැටියෝ..”

මේ දෙදෙනාගේ කතාව මිතුරන් සිව් දෙනාම අසා උන්නේ පුදුමයෙනි. දෝණි අක්කා මැයට මෙතරම් ලෙන්ගතු යැයි අනුජ්වත් නොසිතුවේය.

“දෙව්මි අක්කි පුංචිව අඳුරනවද?”

"ඔව් දර්ශී. මං මධූ නැන්දිව දන්නේ උපන්දා ඉඳලානේ.. මං බයේ හිටියේ මල්ලි මේ පුංචිගේ විස්තර අහන්නේ කාගෙන්ද කියලා. දැන් බයක් නෑ. ඔයාලා හරිම කෙනා ළඟට ඇවිල්ලා තියෙන්නේ."

"මං මෙයාලාට ඒ කතාව කිය කියා හිටියේ දෝණී."

"මධූ නැන්දි සාරා පුංචිගේ හොඳම යාළුවා. මං හිතන්නේ ඒ කතාව නැන්දිට වඩා හොඳට දන්න කෙනෙක් ඉන්නවා නම් ඒ පුංචි විතරයි."

"හරි හරි... දැන් දෝණී ආපු එකේ අපි මොනවා හරි කාලා බීලා ඉමුකෝ.." මධූ කීවේ කුස්සිය දෙසට යමිනි.

"මටත් කතාවේ ඉතුරුටික අහන්න ඕන හරිද?" දෙව්මි කීවේ මධූ පසුපසින් කුස්සියට යමිනි.

# 17.

සරසි බෝඩිමේ සිට නිවසට එන විට හවස් වී තිබුණි. ගෙට ගොඩවීමටත් පෙරම ගෙතුළ කිහිප දෙනෙකු කතා කරන හඬ ඇයට ඇසුණි.

ගෙතුළට යද්දී ඇය දුටුවේ තම මවත් පියාත් සමඟින් කතා කරමින් සිටින ආකාශ්වය. ඔහු අසලම තවත් තරුණියක් අසුන්ගෙන සිටියාය. ඔවුන්ට සිනහවක් පා ගෙතුළට ගිය සරසි බෑගය කාමරයෙන් තබා යළිත් සාලයට ආවාය. මාස හතරකට පසු ආකාශ්ව දකිද්දී සරසිට දැනුණේ සතුටකි.

“සාරා... ඔයත් මෙහෙට එන්නකෝ..” අම්මා කියන විට සරසිත් ඇය අසලින්ම වාඩි වූවාය.

“ඔන්න ඔයාගේ යාළුවා ඔයාට තව යාළුවෙක් ගේන්න හදන්නේ..”

“මොකක්?” සරසි අම්මා කී දෙය තේරුම්ගත නොහැකිව ඇසුවාය.

"ඔන්න ආකාශ් අයියා ඇවිල්ලා තියෙන්නේ අපිට එයාගේ වෙඩින් එකට ආරාධනා කරන්න..." අම්මා කියන විට සරසි ආකාශ් දෙස බැලුවේ තිගැස්සීගෙනය.

"වෙඩින් එක!" සරසි තමාටම යළි මුමුණා ගත්තාය.

"අඳුන්වලා දෙන්නත් බැරි වුණා නේ... සාරා මේ ඉන්නේ මං බඳින්න ඉන්න කෙනා. නම තාරුකා. තාරුකා, මේ ඉන්නේ සාරා." ආකාශ් කිසිදු වෙනසක් නොපෙන්වා කියද්දී තාරුකා සරසි දෙස බලා සිනාසුණාය. අපහසුවෙන් සිනහවක් මවා ගත් සරසි නැඟී සිටියාය.

"ඔයාලා කතා කරන්නකෝ... මං වොෂ් එකක් දාගෙන එන්නම්.." සරසි එතනින් මිදී කාමරයට ගියේ දුවගෙන මෙනි.

'වෙඩින් එක! එයා බඳින්නද යන්නේ? දෙයියනේ එහෙම වුණේ කොහොමද? එයා කිසි දෙයක් නොදන්න ගානට කොහොමද මට එහෙම කතා කළේ... මේ මොන විහිළුවක්ද? ඒ මං ආදරේ කරපු මට ආදරේ කරපු ආකාශ් අයියා වෙන්න බෑ.. නෑ නෑ.. මේක වෙන්න බෑ... මේක

හීනයක්...' සැබැවටම සරසිට නම් මෙය සිහිනයකි. නපුරු සිහිනයකි.

දිනෙන් දින ආකාශ්ගේ විවාහ උත්සවය ළං වෙද්දීත් සරසි උන්නේ කිසිවක්ම සිතාගත නොහැකිවය. සියලු දෙනාම කලබලයෙන් විවාහයට සූදානම් වෙද්දී සරසි උන්නේ අඳුරු ලෝකයක සිරවී කල්පනා කරමිනි.

අඬනවාද සිනහවෙනවාද කියලා සිතා ගන්නටවත් සරසිට බැරිය. කාමරයට වී තනිවම සිටි ඇයට තමා මේ දකින්නේ සිහිනයක් නොවන බව තේරුම් ගියේ ආකාශ්ගේ විවාහ දිනය උදා වූ පසුවය.

අම්මා ඇයට සුන්දර ගවුමක් ගෙනැවිත් තිබුණි. යන්ත්‍රයකින් ක්‍රියා කරවන්නියක් මෙන් ඒ ගවුම ඇය ඇඳ ගත්තේ ගෙදර අයට වෙනසක් පෙන්වන්නට බැරි නිසාය.

"සාරා... දුව ඔයා ලෑස්තිද? අපි යන්න හදන්නේ.." අම්මාගේ හඬින් සරසි කල්පනාවෙන් මිදුණාය.

"ඔයාලා යන්න අම්මා... මං තව ටිකකින් එන්නම්."

මේ ගමන යා යුතුමද? දැනුම් තේරුම් ඇති කාලයේ සිටම වයස උගත්කම නොබලා ආදරය කළේ ඔහුටයි. ඔහුත් ආදරය නොකළා යැයි කිව හැකිද? නමුත් අද සියල්ල කණපිට හැරී ගොසිනි. සමුගැනීමකින් තොරවම ඔහු යන්න ගියේ ඇයි?

අද සිට තවත් ඔහුව තමාගේ සිහින තුළට වද්දා නොගත යුතු බව සරසි දනී. නමුත් එසේ කරන්නේ කෙසේද? දන්නා කාලයක සිට අනාගතය ගැන දුටු සෑම සිහිනයක්ම දුටුවේ ඔහු නමිනි. තවමත් ඒ සිහින තිබෙන්නේ ඔහු නමටය. එහෙත් ඔහු ඒ කිසිවක් නොදත් අයුරින් නව දිවියක් ආරම්භ කිරීමට සූදානම්.

සරසිට දැනුණේ වාවා ගැනීමට අසීරු තරමේ දුකකි. ආදරය යන වචනයේ තේරුමවත් නොදන්නා කාලයේ සිට ඇය ඔහුට ආදරය කළාය. ඇය පමණක් නොව ඔහුද ආදරය කළේය. හිටිහැටියේ සිදු වූ මේ වෙන්වීම දරා ගන්නේ කෙසේදැයි සරසිට සිතා ගන්නට බැරිය.

සරසි වාහනය පදවාගෙන ගියේ උමතුවෙනි. ඇයගේ දෑස් ඉදිරිපිට මැවි මැවී පෙනුණේ  ආකාශ් එදා තාරුකාව හඳුන්වා දුන් ආකාරය ය.

පාළුවට ගොස් තිබූ වැව් පිටිය අසල වාහනය නතර කරගත් සරසි  එයින් බැස ගොස් එහි වූ ගල්කුළක් මත වාඩි වූවාය.

වේගයෙන් ගලා යන කඳුළු වැල් පිස දමන්නට උනන්දුවක් නොවූ සරසි කඳුළු වලට ඕහේ ගලාගෙන යන්නට ඉඩ හැරියාය. ඇය හැඬුවාය. කෑ ගසා හැඬුවාය. වටපිටාවේ කිසිවෙකුත් නොවූවෙන් ඇය සිතුසේ තම දුක කියමින් හඬන්නට වූවාය.

“අනේ මගේ අයියේ... මොකක්ද මේ වුණේ අයියේ? ඇයි මාව දාලා යන්නේ... මං ඔයාට ආදරේ කළා මදි ද දෙයියනේ? තාරුකා ඔයාට මට වැඩියෙන් ආදරෙයිද? ඇයි මාව දාලා එයා ළඟට යන්නේ? අනේ දැන් හරි... දැන් හරි ඔය කසාදේ එපා කියලා එන්නකෝ... මං තරහා නෑ ඔයත් එක්ක... මට මෙහෙම කරන්න එපා දෙවියනේ...”

කිසිවකු තමා අසල වාඩිවනු දැනී සරසි තිගැස්සී හිස හරවා බැලුවාය. ඔහු ආවේ සරසිගේ පිටුපසින්මය. ඇය වැව් තලය දෙස බලාගෙන හඬන අයුරු ඔහු බොහෝ වෙලාවක් තිස්සේ බලාගෙන උන්නේය.

"ශාලින්ද අයියේ..." ඇය කතා කළේ ඉකිබිඳුම් අතරිනි.

"මේ මොනවද අයියේ වෙන්නේ? ඇයි එයා..."

"හිත හදාගන්න නංගි."

"අනේ ඇයි දෙයියනේ ඔයත් ඔහොම කියන්නේ? මං කොහොමද මේවා ඉවසං ඉන්නේ... මගේ පපුව පැලිලා මැරිලා යයි." සරසි තවත් හඬන්නට වූවාය.

"නංගී... දැන් ඇති ඇඬුවා. තමන්ව දාලා ගිය කෙනෙක් වෙනුවෙන් ඔය තරම් අඬන්න එපා. ඔයා මොන දේවල් කියලා ඇඬුවත් එයා මේ කිසිම දෙයක් වෙනස් කරන්නේ නෑ. අඩු තරමේ අපිවත් දන්නේ නෑ ආකාශ් හදිස්සියේම මෙහෙම තීරණයක් ගත්තේ ඇයි කියලා. හැබැයි මං එකක් දන්නවා.."

"මොකක්ද?"

"ඔයා හිතනවා ඇති මේ කසාදේට එයා කැමති වෙන්න ඇත්තේ ගෙදරින් ආපු බලපෑම් නිසා වෙන්න ඇති කියලා නේද?" සරසි එයට 'ඔව්' කියන්නට හිස වැණුවාය.

"නෑ නංගි. එයාට කාගෙන්වත් කිසිම බලපෑමක් වුණේ නෑ. මේ සේරම දේවල් ලෑස්ති වුණේ එයාගේ තනි මතේට. මං හිතන්නේ අයියලා වුණත් ඉන්නේ මේ වුණේ මොකක්ද කියලා හිතාගන්න බැරුව... ආකාශ් මෙහෙම වෙනස්වෙන්න හේතුව දන්නේ උඩ ඉන්න දෙයියෝ තමයි ඉතිං."

"නෑ... නෑ... ඒක වෙන්න බෑ..."

"මට ඔයාට බොරු කියන්න හේතුවක් නෑ නංගි. එයා නිතරම කිව්වේ ඔයාට එයා වගේ කෙනෙක් ගැලපෙන්නේ නෑ කියලා. එයාට ඕන වුණා ඔයත් එක්ක තිබ්බ සම්බන්ධෙ නවත්තන්න... තාරුකා ගැන ඔයාට කියන්න... ඒත් පහුගිය ටිකේ ඔයාට ෆයිනල් එක්සෑම් නිසා එයා බය වුණා මේ ගැන කියලා ඔයාව අවුල් කරන්න."

"ඒ කියන්නේ මේක අද ඊයේ වුණු දෙයක් නෙමෙයි..."

"හ්ම්... මේ අහන්න සාරා... දැන් ඔයා මෙහෙම ඇඬුවා කියලා කිසිම දෙයක් වෙනස් වෙන්නේ නෑ. මේ ගැන හැමෝම දැනගෙන මෙතන තවත් ලොකු ප්‍රශ්නයක් ඇතිවෙන එක විතරයි වෙන්නේ... ඔයා දන්නවානෙ මං කියන්නේ මොකක් ගැනද කියලා... දැනටමත් ඔයා ගොඩක් පරක්කුයි සාරා. තව ටිකක් වෙලා යද්දී හැමෝම ඔයාව හොයන්න පටන් ගනියි. ඒ නිසා දැන් අපි යමු."

ශාලින්ද කෙසේ හෝ සරසිවත් රැගෙන ආකාශ්ගේ විවාහ උත්සවයට ගියේය. සරසි උන්නේ ඇවිදින මළ කඳක් වගේය. ඇය සෑම විටම උන්නේ මනාල යුවල නොපෙනෙන තැනක වාඩි වී කල්පනා කරමිනි.

ඔහුගේ මනාලිය වන්නට වසර ගණනක් තිස්සේ හීන දැක අද ඔහුගේ විවාහ උත්සවයේ අමුත්තියක ලෙස වාඩි වී සිටින්නට වීම ගැන ඇයට ඇය ගැනම දැනුණේ දුකකි.

විවාහ උත්සවයට පැමිණ සිටි බනුරි සහ තවත් කිහිප දෙනෙකුම සරසි දෙස බැලුවේ උපහාසයෙනි. ඒ බැව් සරසි මෙන්න ශාලින්ද ද හොඳින්ම දුටුවෝය.

සරසි උන් තත්ත්වය දැන උන් නිසාදෝ ශාලින්ද නිතරම ඇය අසල ගැවසුණේය.

*******************

මධූ කතාව නතර කළේ දෑසට කඳුළු පුරවාගෙනය. ඇය පමනක් නොව දර්ශී හා නිම්නා ද උන්නේ කඳුළු පිරි දෑසිනි. දෙව්මි උන්නේ හඬමිනි.

“දෝණී පුංචිකමට එදත් අඩලා තිබ්බා සාරා නැන්දී ඕන කියලා...” කියමින් මධූ ඇයගේ හිස අතගෑවාය.

“දෙයියනේ සාරා ඇන්ටි කොහොමද මේවා දරාගෙන හිටියේ... අවුරුදු ගානක් ආදරේ කරලා එක පාරටම මෙහෙම දෙයක් වුණාම.. අම්මෝ... මට එහෙම ඔහොම දෙයක් වුණා නම් මෙලහට මැරිලා වැටිලා...” නිම්නා කීවේ කම්පාවෙනි.

“සාරා වුණත් හිටියේ මැරිලා වගේ තමයි දූව. එයාගේ මුළු ජීවිතේම කඩන් වැටුණා. එදා එතන ඉඳලා අද වෙනකනුත් සාරා තවත් දුක් විඳිනවා.”

“ඒත් පුංචි අර තරම් ආදරෙන් ඉඳපු ආකාශ් අංකල් මාස හතරට කොහොමද ඔය තරම් වෙනස් වුණේ?”

"සාරාට වුණත් කිසිම දෙයක් හිතා ගන්න බැරි වුනේ ඒක තමයි පුතේ. මං එතකොට සාරා එක්ක තරහා වෙලා හිටියා වුණාට මේක ආරංචි වුණාම මටත් අදහා ගන්න බැරි වුණා. ඒත් ඔය සිද්ධිය වෙලා අවුරුදු දෙක තුනකට පස්සේ අපි දැනගත්තා මේ වුණ හැම දෙයක්ම පිටි පස්සේ තව කෙනෙක් හිටියා කියලා."

"තව කෙනෙක්! ඒ කවුද?" අනුජ් ඇසුවේ පුදුමයෙනි.

"මං ඒ ගැන කියන්නම් පුතා. එයා මුල ඉඳලම වැඩ කරලා තිබ්බේ ප්ලෑන් එකකට... ආකාශ්... සාරා.. මේ කාටවත් ඒ ගැන සැකයක් ඇතිවෙන්න එයා ඉඩ තිබ්බේ නෑ. එයා හරි දක්ෂ විදිහට එයාට අවශ්‍ය වුණ දේ කර ගත්තා."

කතාව මදකට නතර කළ මධූ ගෙතුළට ගියේ දුරකතනය නාද වන හඬ ඇසෙද්දීය. ඇයට යන්නට හැර මිතුරන් මුහුණින් මුහුණ බලා ගත්තෝය.

"කවුරු වෙන්න පුළුවන්ද ඒ?"

"බනුරි? එයා කොහොමත් සාරා ඇන්ටි එක්ක තරහින් නේ හිටියේ.."

"නෑ දර්ශී. එයා නෙමෙයි. මෙතන වෙන කෙනෙක් ඉදලා තියනවා මට හිතෙන්නේ..." නිම්නා කීවාය.

"අර මිගාර කියන කෙනා..."

"වෙන්න බෑ තනුක. ඒ මනුස්සයා මෙතනට කිසිම සම්බන්ධයක් නෑ නේ."

"අනේ මන්දා..." කියමින් සිටි තැනින් නැගිට්ට අනුජ් කාමරයට ගියේ ටිකක් තනිවී කල්පනා කරන්නට අවැසි වූ නිසාය.

# 18.

බලංගොඩට පැමිණ දැන් දින පහක් ගෙවී ගොසිනි. අනුජ් කල්පනා කළේ හෙටවත් යළි නිවසට යන්නටය. සේන මාමාත් සමඟ තාත්තා නිවසේ තනිවම සිටීම ගැන ඔහුට දැනුනේ දුකකි. දර්ශිගේ පුංචි කී කතාවත් සමඟ අනුජ් තාත්තා ගැන වෙනදාටත් වඩා සිතුවේය.

"තාත්තා එයාට එහෙම කරන්න ඇත්තේ කියා ගන්න බැරි මොකක් හරි හේතුවක් තිබුණ නිසා වෙන්න ඇති." ඔහු තමාටම කියා ගත්තේය.

"මධූ පුංචි... අද නම් මුළු කතාවම අපිට කියන්න ඕන... මොකද අපි හෙට යනවා." අනුජ් උදෑසන කෑම මේසයේදී කියනවිට මිතුරන් ඔහු දෙස බැලුවේ පුදුමයෙනි.

"හෙට?"

"ඔව් තනුක. අපිට යන්න වෙනවා. තාත්තාත් ගෙදර තනියම. එයා හිටියෙත් අප්සට් එකේ නේ... මගේ හිතට හරි නෑ තාත්තාව තනියම තියන්න."

"හ්ම්... ඒක හොඳයි. බාප්පි ඉන්නේ හරියට සසර කලකිරිලා වගේ මේ දවස්වල... මොනවා වුණත් මල්ලි ජේන්න හරි ඉන්න එක හොඳයි..." දෙව්මිද කීවේ ආකාශ්ගේ දුක්බර මුහුණ සිහිපත් කරගෙනය.

"මං කියන්නම් දරුවෝ.."

"ආකාශ්ගේ වෙඩින් එකෙන් පස්සේ සාරා තේරුම් ගත්තා තවත් ඒ ගැන හිතලා වැඩක් නෑ කියලා. එයා ටික ටික හිත හදා ගත්තා. ඒකට එයා ළඟින්ම ඉඳලා ගොඩක් උදව් කළේ ශාලින්ද.."

***********************

හිත කොතරම් වේදනා දුන්නද සරසි තාරුකාට සැලකුවේ තම සහෝදරියකට වාගේය.ටික කලක් යන විට තාරුකා සරසිගේ හොඳම මිතුරියක් වූවාය. මේ දෙදෙනා කෙතරම් මිතුරු වූවත් ආකාශ් සෑම විටම සරසිව මගහැර සිටින්නට කටයුතු කළේය.

"සාරා..." සරසිත් සමඟ ටවුමට ගොස් එන අතරතුර තාරුකා කතා කළාය.

"තාරු අක්කි.."

"ශාලින්ද ළඟදි ආවේ නෑ..?"

"එයා නම් ඔය එන්නේ හැමදාම. පොත අත්සන් කරන්න වගේ."

"ඉක්මනට වෙඩින් එක ගත්තා නම් ඒ කොල්ලට හැමදාම ඔහොම යන්න එන්න ඕන නෑනේ..."

"වෙඩින්!" සරසි පුදුමයෙන් තාරුකා දෙස බලද්දී ඇය සිනාසුණාය.

"මේ මේ... බොරු කියන්න ලෑස්ති වෙන්න එපා. මං දන්නවා ඔය දෙන්නාගේ මොකක්හරි තියෙනවා කියලා..."

"අනේ... එහෙම දෙයක් මගේ හිතේ නෑ අක්කා."

"ඔයාගේ හිතේ නැති වුණාට මට පේන විදිහට ශාලින්දගේ හිතේ නම් එහෙම දෙයක් තියනවා."

"මං හිතන්නේ නෑ..."

සරසි ඒ මොහොතේ පිළිනොගත්තද තාරුකා කීවේ සැබෑවක් බව පිළිගන්නට වූවේ ශාලින්දගේ නිවසින් තමාට විවාහ යෝජනාවක් ගෙන ආ දිනයේ ය. තමාගේ කැමැත්ත කුමක් වූවත් අම්මාත් තාත්තාත් මේ යෝජනාවට ඉහළින්ම කැමති වූ බව සරසි දැන උන්නාය.

**************

"මට හිතෙන දේ හරි නම්... මේ ශාලින්දට තමයි ඕන වෙලා තියෙන්න ඇත්තේ මේ දෙන්නව වෙන් කරන්න."

නිම්නා කියද්දී දෙව්මි ඇයට එකඟ වෙමින් හිස වැණුවාය.

"ඉතිං සාරා ඇන්ටි කැමති වුණාද?" තනුක ඇසුවේය.

"ඒ කාලේ වෙද්දී මාත් තේරුම් අරන් හිටියේ ඒ දවස්වල සාරායි ආකාශ් අයියයි කිව්වේ ඇත්ත කියලා. මිහාර මාව දාලා යන්න ගියා. වෙන කාත් එක්කවත් නෙමෙයි අර බනුරි එක්ක..." මධූ දුක්බරව කියද්දී දෙව්මි ආදරයෙන් ඇයගේ අතක් ගෙන පිරිමැද්දාය.

"සාරා හිටියේ වෙන කෙනෙකුට ආදරේ කරන්න පුළුවන් මානසිකත්වයක නෙමෙයි. ඒත් අම්මාගෙයි තාත්තාගෙයි වචනෙට පිටින් යන්න සාරාට බැරි වුණා. එයා අම්මලාට විරුද්ධ වෙන්න තිබ්බා ආකාශ් අයියා එයා වෙනුවෙන් හිටියා නම්. මේකට විරුද්ධ වෙලා අනිත් අයගේ හිත් රිද්දන එක තේරුමක් නෑ කියලා හිතුව සාරා කසාදෙට කැමති වුණා."

"අදටත් ඒ දේවල් හීනයක් වගේ දරුවනේ... වෙඩින් එකට සේරම දේවල් ලෑස්ති කළේ ශාලින්ද. සාරා එයා කැමති විදිහට හැම දෙයක්ම කරන්න දීලා බලන් හිටියා. ඒ දවස්වල සාරා හිටියේ හරියට රොබෝ කෙනෙක් වගේ... පොඩ්ඩක් ඉන්නකෝ.."

කියා ගෙතුළට ගිය මධූ රාමු කරන ලද විශාල පින්තූරයක් ගෙනැවිත් අනුජ් අත තැබුවාය.

"ඔය තියෙන්නේ සාරාගේ වෙඩින් ෆොටෝ එක. දෙවෙනි මනමාලිට හිටියේ මම. මේ මල්කුමාරිට ඉන්නේ දෝණි..." මධු කියද්දී දෙව්මිද ඒ වෙතට එබී බැලුවාය.

"කසාදෙන් පස්සේ දෙන්නා වෙනම ගෙදරක පදිංචි වුණා. ආකාශ්ගේ අලුත් ගෙදර තිබුණෙත් ඒ ළඟ. ඒ කාලේ දෙන්නාත් එක්ක එකටලු ඒ ඉඩම් දෙක අරන් ගෙවල් හදන්න පටන් අරන් තියෙන්නේ. පුදුමේ කියන්නේ මේ දෙන්නාගෙම හිතේ තිබිලා තියෙන්නේ තමන් හදන ගෙදරට සාරාව කැන්දන් යන්න.

ටික කාලයක් සේරම දේවල් හොඳින් සිද්ධ වුණා. සාරා කවදාවත් ශාලින්දට අඩුපාඩුවක් කළේ නෑ. එයාට බැරි වුණේ ශාලින්දට ආදරේ කරන්න විතරයි.

නිවාඩු දවසට සාරා තාරුකා එක්ක කතා බහ කරනවා. කෑම බීම හදනවා... ඒවට ශාලින්ද විරුද්ධ වුණේ නෑ. ඔහොම ටික කාලයක් ගියා.

ඒ දවස්වල සාරාට බබා ලැබෙන්න හිටියේ. මං හිතන්නේ මාස හයක් විතර. එදා ඇඟට හරි නෑ කියලා සාරා නිවාඩු අරන් ගෙදර නතර වෙලා තිබ්බා. එදා දවල් තාරුකා ඇවිල්ලා තිබ්බා සාරාව හොයන්න.."

***************

"තාරු අක්කී... ඇයි මේ සුදුමැලි වෙලා? ඔයාට සනීප නැද්ද?" සරසි වහා නැඟිට තාරුකාව පුටුවක වාඩි කරවමින් ඇසුවාය.

"මගේ ඇඟට මහ අමුත්තක් දැනෙනවා නංගි... අනේ ආකාශ් අයියාත් ගෙදර නෑ.." තාරුකා මිමිණුවේ අපහසුවෙනි.

"ඔහොම ටිකක් ඉන්නකෝ.." කී සරසි වහා කාමරයට ගොස් ගවුමක් දමා ගත්තාය. වාහනයේ යතුර ගෙන යළි සාලයට එනවිටත් තාරුකා උන්නෙ අපහසුවෙන් පුටු ඇන්දට හිස බර කරගෙනය.

"අපි හොස්පිටල් එකට යමු අක්කී."

"අනේ.. ඔයාට ඩ්‍රයිව් කරන්න පුළුවන්ද නංගි.. මට කැබ් එකක් කතා කරලා දෙන්න.."

"පිස්සු නැතුව මෙන්න මෙහෙ එන්න.." සරසි බලෙන්ම මෙන් තාරුකාව වත්තම් කරගෙන ගොස් වාහනයේ වාඩි කරවූවාය.

"මෙයා හරිම වීක් නේ.." තාරුකාව පරීක්ෂා කරන අතරේ වෛද්‍යවරයා කීවේය. අනතුරුව ඇයට සේලයින් එකක් ලබා දෙන ලෙස හෙදියට පැවසූ ඔහු පිටතට ආවේය.

"මේ ඔයාගේ කවුද?" ඔහු ඇසුවේ පිටත අසුන්ගෙන සිටි සරසිගෙනි.

"මගේ අක්කා ඩොක්ටර්."

"එහෙනම් හොදයි අක්කලා නංගිලාට එකට බබාලා නලවන්න පුළුවන්..." ඔහු සරසිගේ ඉදිරියට නෙරා විත් තිබූ කුස දෙසද බලා සිනා සෙමින් කීවේය.

"ඒ කිව්වේ ඩොක්ටර්?"

"ඔයාගේ අක්කා ප්‍රෙග්නට්. ඒ වුණාට එයා හරිම වීක්. මේ තත්වෙන් ඉද්දී එහෙම දුර්වල වෙලා බෑ. කෝ අක්කාගේ හස්බන්ඩ්?"

"අයියා මේ දවස්වල බිස්නස් වැඩ වගේකට දුර ගිහින් ඉන්නේ ඩොක්ටර්."

"හ්ම්... මං මෙයාට විටමින් ටිකක් ලියලා දෙන්නම්. ඔයාලා හැමෝම මීට වඩා හොදට අක්කව බලා ගන්න වෙයි."

"හරි ඩොක්ටර්. තැන්ක් යූ.."

වෛද්‍යවරයාට ස්තූති කළ සරසි තාරුකා සිටි කාමරයට ඇතුල් වූයේ සිනහවකින් මුව සරසාගෙනය.

"තාරු අක්කි.. ඔන්න ඔයාට සුබ ආරංචියක්"

"මොකක්ද සාරා?"

"ඔන්න ඔයා අම්මියෙක් වෙන්න යන්නේ.."

පුදුමයකි. සරසි බලාපොරොත්තු වූ තරම් සතුටක් තාරුකාගේ මුවෙහි නොවීය. ඇය උන්නනේ කනස්සල්ලට පත්වූ අයුරිනි.

"ඇයි මේ අක්කි?"

"ම්..මොකුත් නෑ නංගි. අපි දැන් යමු නේද?"

"හ්ම්.. යමු යමු.."

රොහලින් පිටත් වී නිවසට යන අතර ෆාමසියක් අසල වාහනය නැවතූ සරසි වෛද්‍යවරයා ලියා දුන් විටමින් ටික රැගෙන විත් තාරුකා අත තැබුවාය.

"අනේ නංගි... ඔයාට පිං ඒ වෙලාවේ මාව එක්කන් ආවට."

"පිස්සුද අක්කී... ඒක මහ ලොකු දෙයක් නෙමෙයි. ඒක නෙමෙයි අද ආකාශ් අයියා කොහේ ගිහින්ද?"

"හදිස්සි මීටින් එකක් කියලා උදේම ගියා නංගි.."

"හ්ම්... එහෙමද... ඔන්න හරි. අක්කි එහෙනම් පරිස්සමින් ඉන්න හොදේ.." සරසි තාරුකාගේ නිවස ඉදිරිපිට වාහනය නවතමින් කීවාය.

# 19.

සරසි වාහනය නවත්වද්දී ශාලින්ද දොරකඩ බලා උන්නේය. ඇයට වාහනයෙන් බහින්නටවත් වූයේ නැත.

"සාරා..." ශාලින්ද කෑගැසුවේ කෝපයෙනි.

ඇඟට අමාරු යැයි කියා ඇය නිවසේ නතර වූ නිසා ශාලින්ද සියලු වැඩ ඉක්මනින් නිවසට ආවේ ඇය ගැන බලන්නටය. නමුත් ඇය ගෙදර නැති බව දුටු ඔහු උන්නේ බොහෝ සෙයින් කලබලවී ය. ඔහු වැඩියත්ම කේන්ති ගත්තේ එපා කියා තිබියදීත් ඇය වාහනය පදවාගෙන එනු දකිද්දීය.

"මොළයක් නැද්ද සාරා... වාහනේ අරන් යන්න එපා කියලා තියනවා නේද? අනික තනියම. මට ආදරේ නොකළට කමක් නෑ අඩු තරමේ තමුන්ට අපේ දරුවා ගැනවත් ආදරයක් දැනෙන්නේ නැද්ද කියනවා මට..."

සරසි සැබැවින්ම උන්නේ විඩාවට පත් වීය. ඇය නිහඬමව ආලින්දයේ පුටුවකට බරවී ඔහු දෙස බැලුවේය.

"සමාවෙන්න. මට වෙන කරන්න දෙයක් තිබ්බේ නෑ. තාරුකා අක්කා අසනීපෙන් හිටියේ.."

"තාරුකා ගැන බලන්න තමයි ආකාශ් ඉන්නේ... ඔයා මොනවටද.. අනික තාරුකාට මොනවා වෙලාද?"

"එයා ප්‍රෙග්නට්."

"හත්.. එයා ප්‍රෙග්නට්.. එහෙමයි කියලා මේ ගමන යන්න කලින් හිතන්න තිබුණේ නැද්ද ඔයත් ප්‍රෙග්නට් කියලා." ශාලින්ද කීවේ ඇය අසලම පුටුවක වාඩිවෙමිනි.

"සාරා... ඔයා මේ කරන්නේ වෙන කෙනෙක් කරන්න හිතන්නෙවත් නැති දේවල්. ඔයාට අර තරම් රිද්දලාත් ඔයා තවත් ආකාශ්ට උදව් කරනවා. ආකාශ්ටත් වඩා එයාගේ වයිෆ්ට. ඒකට කමක් නෑ. මාත් ඒකට විරුද්ධ නෑ. ඒත්,"

"ඒත්?"

"ඔයා පරිස්සම් වෙනවා මදි සාරා. ඔයාගේ බඩේ දැන් අපේ දරුවාත් ඉන්නවා. ඔය දෙන්නම පරිස්සම් වෙන්න ඕන. එක්කෙනෙක්ට හරි මොනවා හරි වුණොත් මං කොහොමද ජීවත් වෙන්නේ.. ඒ නිසා මොනවා කළත්

පරිස්සමින්.'' කී ශාලින්ද නැඟිට ගෙතුළට ගියේ සරසිගේ හිසත් අතගාගෙනය.

හැන්දෑවේ සරසි තාරුකා බලන්නට ගියේ ශාලින්දටද කියාය. ඇය යන විට තාරුකා නිවසේ නොවීය. සරසිගේ හඬට පිටතට ආවේ ආකාශ්ය.

''ආ.. ඉන්නවද.. ඔයාවත් හම්බෙන්න හිතාගෙන තමයි මං ආවේ...'' ඉදිරියට නෙරා ආ කුසත් සමඟ දොරකඩ සිටින සරසි දෙස ආකාශ් බලා උන්නේ පුදුමයෙනි.

''එන්න සාරා.. වාඩි වෙන්න.''

''කෝ තාරුකා අක්කා?'' සරසි වාඩිවෙන අතරේම ඇසුවාය.

''එයා අක්කලාගේ ගෙදර ගිහින් එන්න ගියා. තව ටිකකින් එයි.''

''ඇයි ඔයා එයාව තනියම යැව්වේ? මේ ඉන්න තත්ත්වෙත් එක්ක එයාව තනියම මිදුලටවත් යවන්න එපා කියලා ඩොක්ටර් කිව්වේ..''

"ඇ..ඇයි සාරා.. තාරුට මොකද වෙලා තියෙන්නේ?" ආකාශ්ගේ පැනයෙන් පුදුම වූයේ සරසිය. එසේ නම් ඔහු එයවත් දන්නේ නැත.

"ඔයා ඒකවත් දන්නේ නෑ. එයා අම්මා කෙනෙක් වෙන්න යන්නේ. ඩොක්ටර් කියන විදිහට එයා හරිම දුර්වලයි."

"තාරු මේ ගැන මට කිව්වේ වත් නෑ නේ.."

"මේ අහන්න ආකාශ් අයියේ.. මං දැන් ගොඩක් කල් ඉදලා බලන් ඉන්නේ. ඇයි මේ? මොකක් හරි හේතුවක් නිසා ඔයා මාව අතඇරලා එයාව මැරි කලා. දැන් ඒ ඔයාගේ වයිෆ්... ඔයාට හිතෙන්නේ නැද්ද ඔයා එයාට සලකන විදිහ හරි නෑ කියලා... දැන් එයා ඔයාගේ දරුවෙකුත් බඩේ තියන් ඉන්නේ..

මොකක් හරි නිසා ඔයා එයාව කසාද බැන්දා. දැන් එයාගේ වගකීම තියෙන්නේ ඔයා අතේ... ඔයා ඔයාගේ යුතුකම් මඟඅරින්න එපා... තාරුකා කියන්නේ හරි අහිංසක කෙල්ලෙක්. එයාට මෙහෙම විඳවන්න දෙන්න එපා.. එයා ගැන ටිකක් බලන්න. ඔය දෙන්නට හරි සතුටින් ජීවත් වෙන්න පුළුවන් නේ."

ආකාශ් නිහඬවම බිම බලාගෙන සරසි කියූ සියල්ල අසා උන්නේය. යන්නට සූදානම්ව නැඟිට්ට සරසි ඔහුගේ මුහුණ දෙස හොඳින් බැලුවාය.

"මං යන්නම්.."

ඇය පිටවී යන තුරුත් ආකාශ් වචනයක්වත් නොකියා බලා උන්නේය.

කුමක් හෝ හේතුවක් නිසා තමා අතහැර තාරුකා සමඟ විවාහ වූවද ආකාශ් ඉන්නේ කුමක් හෝ වේදනාවකින් බව සරසිට වටහා ගන්නට අපහසු නොවීය. ඔහු තාරුකාව තම කැමැත්තට විවාහ කරගෙනත් ඇයව මේ ලෙසින් නොසලකා හැර සිටින්නේ ඇයි දැයි සරසිටත් සිතා ගැනීමට අසීරුය.

.........මාස තුනකට පසු......

ශාලින්ද උන්නේ කියා නිම කිරීමට නොහැකි තරමේ සතුටකිනි. ඔහු සරසිවත් දරුවාවත් රෝහලේ සිට නිවසට රැගෙන ආවේ මීට මොහොතකට පෙරය.

"සාරා... පුතා මං වගේ නේද?" ශාලින්ද නිදා සිටි පුතු වෙත ළංවී ඇසුවේය.

"අයියෝ... මේ එක දවසට දැන් කීවෙනි පාරද ඔය අහන්නේ? ඉන්න මං කොහේ හරි ලියලා තියන්නම් පුතා තාත්තා වගේමයි කියලා."

"මට හරි සතුටුයි සාරා... මගේ පුතා... මට කියන්න වචන නෑ..."

සිනහවක් පා නානකාමරයට ගිය සරසි යළි එන විටත් ඔහු පුතා දෙස බලාගෙනම උන්නේය.

"ශාලින්ද.."

"ම්..."

"ඔයාට හවස මීටින් එකක් කිව්වා නේද?"

" දැන් මොන මීටින්ද... මං මගේ කොල්ලා ළඟින් හෙල්ලෙන්නේ නෑ.." ඔහු කීවේ නිදා සිටින පුතුගේ කම්මුල් දෙකම සිප ගනිමිනි.

"අනේ මූණ ඉබින්න එපා. එතකොට ලොකු වෙද්දී කම්මුල් එල්ලෙනවලු."

"ඒවා ලොකු වුණාම බලමු." කියමින් ඔහු යළිත් වරක් දරුවා සිපගත්තේ සරසිගේ මුවට සිනහවක් නංවමිනි.

****************************

"දැන් කෝ පුංචි සාරා ඇන්ටිගේ පුතා?"

නිම්නා ඇසුවේ සරසිට තවත් දරුවකු සිටි බව ඔවුන් මේ වන තුරුත් නොදැන සිටි නිසාය.

"ඉන්නවා. එයාගේ තාත්තා එක්ක."

"ශාලින්ද?"

“ඔව් අනුජ්. ශාලින්ද ඉපදෙන්නත් කලින් ඉඳලා දරුවට හරි ආදරෙයි. සාරාගේ කියලත් වෙනසක් නෑ. එයාගේ කුසින් වදපු දරුවානේ ඉතිං. අදටත් සාරා ඒ දරුවට පුදුම ආදරෙයි.” කී මධූ සුසුමක් හෙළුවාය.

“ඒ දෙන්නා පුතා එක්ක සතුටින් හිටියා. ඒත් එක දවසක මේ දේවල් සේරම ආයෙත් වෙනස් වෙන්න පටන් ගත්තා. එතකොට සාරාට පුතා ලැබිලා මාස හයක් විතර. මාත් ඒ වෙද්දී සාරාට ආයේ හිතවත් වෙලා හිටියේ. ඔය සිද්ධිය වුණ දවසේ මාත් හිටියේ සාරාලාගේ ගෙදර...”

******************

මධූත් සරසිත් උන්නේ කාමරයට වී දරුවා සමඟ සෙල්ලම් කරමිනි. ශාලින්ද උන්නේ පහළ ඔහුගේ කාර්යාල කාමරයේ වැඩක් කරමිනි.

එක්වරම කවුරුන් හෝ උස් හඬින් කතා කරනු ඇසී සරසිත් මධූත් මුහුණින් මුහුණ බලා ගත්තෝය.

“ඉදපං බලන්න..” කී මධූ කාමරයට අල්ලා තිබූ බැල්කනියට පැමිණ වටපිට බලන්නට වූවාය.

"සාරා.."

"කවුද මධූ.?"

"මට පේන්නේ මේක අභ්‍යවකාශයේ ඇතිවුණ ගැටුමක් වගේ."

"මොනවද බං කියවන්නේ?" සරසි දරුවා වඩාගෙනම එතැනට ගියේ මධූට බැනවදිමිනි.

ශබ්දය ඇසුණේ ආකාශ්ගේ නිවස දෙසිනි. දෙදෙනා අතර කුමක් හෝ ගැටුමක් බව වටහා ගන්නට මිතුරියන් දෙදෙනාට අපහසු වූයේ නැත.

"අහසයි තරුයි අතර යුද්ධයක්.."

"විහිළු නෙමෙයි මධූ.. අනේ මන්දා මේ දෙන්නා මොනවා බෙදාගන්න බැරුව රණ්ඩු වෙනවද කියලා..."

"ඒවා දැන් උන් දෙන්නාගේ පවුල් ප්‍රශ්න සාරා. බැඳලාත් අවුරුදු දෙකකට වැඩියි නේ දැන්. එයාලා ඒවා විසඳගනියි." කියමින් මධූ නැවත කාමරයට ගියාය.

"ඒක ඇත්ත. ඒත් අනේ මන්දා. තාරුකා අක්කට දැන් දරුවා ලැබෙන්නත් ළඟයි..."

"දරුවත් උන් දෙන්නාගේ... ප්‍රශ්නත් උන් දෙන්නාගේ..."

සැබැවින්ම ආකාශ් හා තාරුකා කවදාවත් නැති ලෙස නිවසේ රණ්ඩු කරමින් සිටියෝය. එක් වරම තාරුකා මහ හඬින් කෑ ගසනු ඇසී සරසි තිගැස්සුණාය.

දරුවා මධූ අතට දී ඇය පහළට බසින විටත් ශාලින්ද ඒ දෙසට දිවයමින් සිටියේය. ඔහු පිටුපසින්ම සරසිද දුවගෙන ගියාය. එක්වරම ආකාශ්ගේ නිවට ඇතුළු වන විටම දුටු දෙයින් ඇය හීරාන්තව ගල් ගැසුණාය.

තාරුකා සිහිසුන්ව බිම වැටී සිටි අතර ආකාශ් ඇය අසල දණගසාගෙන ඇයට කතා කරමින් සිටියේය. ඉක්මනින් ඔවුන් වෙත ගිය ශාලින්ද එතැන සිටි තවත් අයකුගේ සහයෙන් තාරුකාව රෝහලට රැගෙන යන්නට කටයුතු කළේය. දරුවා මධූ අත සිටි නිසා සරසිද තාරුකා රැගෙන රෝහලට ගියාය.

තාරුකාව ඉක්මනින් ශලාසාගාරයට ගත් අතර සරසි එහි දොරටුව අභියස නතර වූවාය. රෝහලෙන් පිටත සිටි ශාලින්ද අතට දරුවා ලබා දුන් මධූ සරසිව සොයාගෙන ඇතුළට ආවාය.

"සාරා..."

"ඇයි මධූ ඔයා බය වෙලා වගේ? කෝ පුතා?"

"පුතා ශාලින්ද අතේ ඉන්නවා... හරි වැඩේ වෙලා තියෙන්නේ සාරා.."

"ඇයි?"

"පොලිසියෙන් ප්‍රශ්න කරද්දී ආකාශ් අයියා කියලා තියෙනවා එයා තාරුකාට ගැහුවා කියලා.."

"මොනවා...ගහලා?"

"ඔව්. ඒ ගහපු පාරට තමයි තාරු වැටිලා තියෙන්නේ..."

"දෙයියනේ... තමන්ගේ දරුවා බඩේ තියන් ඉන්න ගෑණිට අත ඉස්සුවේ මොන වරදක් කළාටද... කෝ දැන් ඔය මිනිහා..?" සරසි වාඩි වී සිටි තැනින් නැඟිට්ටේ කෝපයෙන් වෙව්ලමිනි.

"පොලීසියට අරන් ගියා..." මධූ කියද්දී ඇය යලිත් බංකුවට බර වූවේ කල්පනාවක ගිලෙමිනි.

'ආකාශ් මේ අහිංසක කෙල්ලට ගැහුවේ මොන වරදකටද?'

# 20.

ඉන්දුත් සංජීවත් රෝහලට පැමිණියේ මේ සිද්ධිය දැනගත් විගසමය. සරසිත් සමඟ ඔවුන් දෙදෙනාත් ශල්‍යාගාරය අසල රැඳී උන්නේ තාරුකාට කෙසේදැයි දැන ගන්නටය.

"මිස්" ශල්‍යාගාරයෙන් පිටතට ආ හෙදියක් අසලට සරසි ගියේ දුවගෙන වාගේය.

"පුතෙක් ලැබුණා... බබා නම් හොඳින් ඉන්නවා. ඒත්... අම්මට නම් ටිකක් අමාරුයි." කී ඇය එතැනින් නික්ම ගියේ සියලු දෙනාගේ හිත් අවුළවාලමිනි.

"අනේ අසරණ කෙල්ල.." ඉන්දුට සැබවින්ම තාරුකා ගැන තිබුණේ දුකකි. කුඩා කල සිට අනාත නිවාසයක හැදුණු වැඩුණු ඇයට නෑයෙකුට කියා උන්නේ ඉන්දුත් සංජීවත් ය.

"එක්ස්කියුස් මී... සාරා.. කියන්නේ කවුද?" ඒ මොහොතේ පිටතට පැමිණි හෙදියක් ඇසුවාය.

"මම මිස්.."

"එන්න මාත් එක්ක. පේෂන්ට් ට ඔයත් එක්ක කතා කරන්න ඕනලු."

සරසි ඉන්දු දෙසත් වරක් හැරී බලා හෙදිය පිටුපසින්ම ශල්‍යාගාරයට ඇතුල් වූවාය.

ගිලන් ඇඳේ සිටි තාරුකාව දකිද්දී සරසිගේ නෙතට කඳුළු පිරුණි. ඇය තාරුකා අසලට ගොස් ඇයගේ අතකින් අල්ලා ගත්තාය.

"සා..රා.." තාරුකා කතා කළේ අපහසුවෙනි.

"අක්කී.."

"සාරා... මට මොනවා හරි... මොනවා හරි වුණොත්... මගේ පුතාව වෙන කාටවත් දෙන්න එපා... ඔයා.. ඔයා.. බලා..ගන්න.. මං වෙනු..වෙන්.. මගේ පු..තාට.. හොඳ අම්මා.. කෙනෙක් වෙ..න්න.." අපහසුවෙන් වදන් ගලපමින් ඇය කියද්දී සරසිට හැඬුණි.

"ඔයාට මොකුත් වෙන්නේ නෑ අක්කී..."

"මේ... වුණ කිසිම.. දේකට ආකා..ශ්... වැරදි නෑ.. සාරා... එයාට... බනින්න.. එපා..."

"අනේ දැන් කතා කරන්න මහන්සි වෙන්න එපා අක්කී. අපි පස්සේ කතා කරමු." සරසි කීවේ තාරුකා ඉන්නේ අපහසුවෙන් බව තේරුම් ගෙනය.

"පො..රොන්දු..වෙන්න.. මගේ පුතාව..."

"මං පොරොන්දු වෙනවා අක්කී... මං පොරොන්දු වෙනවා... මං පුතාව බලාගන්නවා. ඒවගේම ඔයාවත්..."

සරසිට ඉතිරිය කියා ගන්නට ඉඩක් ලැබුණේ නැත. තාරුකාට සවිකර තිබූ යන්ත්‍ර වලින් ඝෝෂාවක් නැගෙන්නට විය. වෛද්‍යවරුන් ඉක්මනින් තාරුකාව වට කර ගනිද්දී සරසි ඉබේටම පසුපසට වූයේ හඬමිනි.

වෛද්‍යවරුන් කෙතරම් උත්සහ කළද තාරුකා යළිත් දෑස් හැරියේ නැත. සරසි ශල්‍යාගාරයෙන් පිටතට ආවේ හඬමිනි.

******************

මධූ කතාව නතර කරන විට අනුජ්ගේ පමණක් නොව අනෙක් අයගේද දෑස් කඳුළින් පිරී ගොසිනි.

"ඒ දවස මටත් හීනයක් වගේ දරුවෝ... තාරුකාගේ මරණෙට හේතු වෙලා තිබ්බේ ආකාශ් තල්ලු කරපු වෙලාවේ එයාගේ ඔලුව වැදිලා ඇතිවුණ කම්පනයලු. කොහොමහරි මේ නිසා ආකාශ් අයියාට හිරේ යන්න සිද්ධ වුණා... තාරුකාගේ මරණේ වැඩත් සේරම ඉවර වෙනකම් පුතා හිටියේ හොස්පිට්ල් එකේ."

"මට මතකයි මධූ නැන්දි ලාවට වගේ. තාරු පුංචි නැති වෙද්දී මං ටිකක් ලොකුයි. සාරා පුංචි එදා තාරු පුංචි ළඟට වෙලා හොඳටම ඇඬුවා.."

"ඔව්... සාරා ගොඩක් දුක් වුණා. එයා තාරුට සැලකුවේ එයාගෙම අක්කට වගේ. හදිස්සියේ මෙහෙම දෙයක් වුණේ ඇයි කියන්න අපි කවුරුත් දැනන් හිටියේ නෑ."

"ඊට පස්සේ මොනවද වුණේ පුංචි?" දර්ශි ඇසුවේ නොයිවසිල්ලෙනි.

"මරණේ වැඩ ඉවර වුණාට පස්සේ සාරාට වුවමනා වුණේ තාරුට වුණ පොරොන්දුව ඉෂ්ට කරන්න. එයා කොහොමත් තව දරුවෙක් වැඩියි කියලා හිතුවේ නෑ. ඒ නිසා එයා ගෙදර අයත් එක්ක මේ ගැන කතා කලා."

"එයාලා මොකද කිව්වේ?" මෙතෙක් නිහඬව සිටි අනුජ් ඇසුවේය.

"සාරාගේ අම්මා, තාත්තා, මල්ලී මේ කවුරුත්ම කැමති වුණේ නෑ සාරා කරන්න හදන දේට... විශේෂයෙන්ම ශාලින්ද... එයා තදින්ම සාරාට විරුද්ධ වුණා."

"එතකොට?"

"කිසිම දෙයක් ගනන් ගන්නේ නැතුව සාරා අනුජ්ව ගෙදර ගෙනාවා. අනුජ්ගේ අම්මා විදිහට උප්පැන්නෙට නම දුන්නා. සාරා හැදුවේ ඔය දෙන්නවම එකට උස්මහත් කරන්න. ඒත් ඔයාව ගෙදරට ගෙනාපු දවසේ ඉදලා ශාලින්ද

සාරා එක්ක හොඳටම රණ්ඩු කළා... එක දවසක් ඒ විදිහට රණ්ඩු වෙද්දී සාරා හීනෙන්වත් බලාපොරොත්තු නොවුණ දෙයක් ශාලින්දගේ කටින් පිට වුණා..''

*****************

ශාලින්ද කාමරයට එන විට සරසි උන්නේ එක ළඟ නිදා සිටින දරුවන් දෙදෙනා දෙස බලාගෙන කල්පනා කරමිනි.

''සාරා... මං තමුන්ට මේ බොහොම හොඳින් කියන්නේ... මේ විකාරේ නවත්තලා මේ ළමයව ගිහින් අනාථ නිවාසෙකට දානවා...''

''ශාලින්ද... ඔයාට පිස්සුද... මෙ ඉන්නෙත් අපේ දරුවා වගේම දරුවෙක් නේද? අනික මේ අපි නොදන්න කෙනෙක්ගේ දරුවෙක් නෙමෙයි. මේ ඔයාගේ යාළුවෙක්ගේ දරුවෙක් නේද? කාගේ වුණත් දරුවෙක්ව එහෙම අසරණ වෙන්න දෙන එක පව්..''

''මේක අහගනිං සාරා... ආකාශ් කියන්නේ මගේ යාළුවෙක් නෙමෙයි. ඌව මං පාවිච්චි කළේ උඹව මගේ ළඟට ගන්න විතරයි... ඇත්තටම ඌ මට හතුරෙක්... අන්න ඒ නිසා...

මං කැමති නෑ ඒකාගේ දරුවෙක් මගේ වහල යට හැදෙනවට... ඔයාට අම්මා කියනවට..''

''පාවිච්චි කළා... මාව ළඟට ගන්න?'' සරසි ඇසුවේ විමතියෙනි.

''ඔව්.. ඒක තමයි ඇත්ත. මං ඉස්සෙල්ලම උඹව දැක්කේ සංජීවගේ වෙඩින් එකේදී. එදා මං හිතා ගත්තා... උඹ තමයි මගේ මනමාලි කියලා... ඒත් එතකොට මං පරක්කු වැඩියි. ඒ වෙනකොටත් ආකාශ් උඹට ළං වෙලා ඉවරයි.''

ශාලින්ද කතා කළේ බැල්කනියේ වැටට බර වෙමිනි. සරසි පුටුවකට කඩා වැටුණේ කිසිවක් සිතාගත නොහැකිවය.

''මං කොහොම හරි මට වුවමනා දේ ලබා ගන්න මිනිහෙක් සාරා... මං ආකාශ්ට ළං වුනේ උඹව මට ඕන නිසා. ආකාශ්ගේ ගාමන්ට් එකට ඕඩර්ස් අරන් දීලා ඇතිවුණ හිතවත් කම ටික කාලයක් යද්දී හොඳ යාළුකමකට මං පෙරළ ගත්තා...

ඒ වෙද්දී මං ඔයා ගැන ගොඩක් දේවල් දන්නවා. ඔයාලා දෙන්නා කතා බහ කරපු දේවල් පවා මං දැනන් හිටියා.. ඒ අතින් මාව විශ්වාස කරන්න තරම් ආකාශ් මෝඩ වුණා.

උඹේ යහපතට කිව්වොත් ආකාශ් ගඟක මුහුදක වුණත් පනින බව මං දැනන් හිටියා. ඉතිං මං ඒකෙන් ප්‍රයෝජනේ ගත්තා.”

“ශාලින්ද...?”

“පුදුමයි නේද? පුදුම වෙන්න එපා.. කලබල වෙන්නත් එපා. මං අද සේරම කියනවා. මොකද මං දැන් දිනලා ඉවරයි. උඹ මගේ ගෑණි. මගේ දරුවාගේ අම්මා.. ඒ නිසා මං කියනවා.”

“මං ටික ටික ආකාශ්ගේ හිතට දැම්මා උඹ වගේ ඉගෙන ගත්ත කෙල්ලෙක්ට ඒකා වගේ එකෙක් ගැලපෙන්නේ නෑ කියලා... ඌව බැන්දොත් ඔයාගේ ගෙදර ඒ වගේම නම්බුව හැමදේම ඔයාට නැතිවෙලා හැමදාටම ඔයාට දුක් විඳින්න වෙයි කියලා...

ආකාශ් එහෙම වෙනවට කැමති වුනේ නෑ. අන්තිම ඌ තීරණය කළා ඔයාගෙම හොදට ඔයාගෙන් අයින් වෙන්න... හහ්.. හහ්.. හා... මට පුළුවන් වුණා ආකාශ්ව එහෙම කරන තැනට පත් කරන්න...”

ශාලින්ද වියරුවෙන් මෙන් කියවාගෙන යද්දී සරසි උන්නේ මේ කිසිවක් අදහා ගැනීමට නොහැකිවය.

"ආකාශ් වගේම මාත් දැනන් හිටියා උඹ ඒකාව අතඅරින්නේ නෑ කියලා... ආන්න ඒ නිසා උඹ ගමට එන්න කලින් ආකාශ්ට කසාදයක් ලෑස්ති කලෙත් මං තමයි... පව් අහිංසකයා... උඹේ හොඳට කියලා හිතාගෙන ඒකත් කර ගත්තා... දැන් බලන්න ඉතිං.. මිනීමරුවෙකුත් වෙලා අද හිර ගෙදර..."

"ශාලින්ද... ඔය හොඳටම ඇති..." සරසි පුටුවෙන් නැඟිට්ටේ කෝපයෙන් වෙව්ලමිනි.

"තමුන් මහ තිරිසනෙක් ශාලින්ද... තමුන්ගේ වුවමනාව ඉෂ්ට කරගන්න අහිංසක ජීවිත කීයක් විනාශ කරලා දැම්මද... ච්ක්.."

"සාරා... උඹ කොච්චර කෑ ගැහුවත් උඹට දැන් කරන්න පුළුවන් දෙයක් නෑ. උඹ දැන් මගේ ගෑණි. අර නිදාගෙන ඉන්න ළමයාගේ අම්මා... ඒ නිසා කියන දේ අහලා අර පොඩි එකාව කොහෙට හරි ගිහින් දානවා මාවත් මිනී මරුවෙක් නොකර... ආකාශ්ගේ එවුන් මගේ වහල යට මගේ දරුවා එක්ක හැදෙන්න මං ඉඩ තියන්නේ නෑ...."

***************

"එහෙම කියලා ශාලින්ද යන්න ගියා. ආයෙත් ඇවිල්ලා තිබ්බේ හොඳටම බීලා... ඒ වෙනකොටත් අනුජ් ගෙදර තියාගෙන ඉන්නවා දැකලා එයාට හොඳටම කේන්ති ගිහිල්ලා..

සාරාට හොඳටම ගහලා... ඒ විතරක් නෙමෙයි ඇඳේ නිදාගෙන හිටපු අනුජ්ව බැල්කනි එකෙන් පහළට දාන්න පවා හදලා තියෙනවා..."

"මොනවා..! හරිම දරුණු මිනිහෙක්නේ.. පොඩි ළමයෙක්ට එහෙම කරනවද..." නිම්නා ඇස් දෙකත් ලොකු කරගෙන කීවාය.

"ඔව් පුතේ... ඒ සිද්ධියෙන් පස්සේ සාරා තවත් එහෙ හිටියේ නෑ.. එයා දරුවො දෙන්නම අරගෙන අපේ ගෙදරට ආවා. මොකද අනුජ්ව බාර ගන්න සාරාගේ අම්මලාවත් කැමති වුණේ නෑ..."

"ඉතිං පුංචි... අර මිනිහා ආවේ නැද්ද සාරා ඇන්ටිව හොයන්න?"

"ආවා පුතා... ඇවිල්ලා කීප සැරයක්ම කතා කළා. හැබැයි සාරාටයි එයාලාගේ දරුවටයි විතරයි. සාරා යන්න බෑ ම කිව්වා.. අන්තිම පාර ශාලින්ද ඇවිල්ලා කිව්වා සාරාව ඩිවෝස් කරනවා කියලා..."

"මොකක්!"

"ඔව් දරුවෝ... ඒ මිනිහා හිතුවේ එහෙම කියලා සාරාව  බය කරගෙන ආපහු අරන් යන්න.

# 21.

සරසිව දික්කසාදය ගැන කියා බිය ගන්වා නැවත ගෙන යාමට සිතා උන්නද ශාලින්දගේ උපාය වැරදි ගියේ සරසි දික්කසාදයට කැමති වීමත් සමඟය. එපමණක් නොව දික්කසාදයට අවැසි ලියවිලි තැනීමට ශාලින්දට පෙර ඇය ම කටයුතු කළාය.

මේ අතරතුර දිනක් ගයාන් සරසිව සොයාගෙන මධූගේ නිවසට පැමිණියේය.

“නංගි..”

“ගයාන් අයියේ..”

“මේ තීරණේ වෙනස් කරන්න නංගි. ආකාශ්ගේ දරුවා නිසා ඔයා ලස්සනට හදා ගත්ත පවුල නැති කරගන්න එපා.”

“ගයාන් අයියේ... මං මේ තීරණේ ගත්තේ ආකාශ් අයියා නිසා නෙමෙයි. මං තාරුකා අක්කට පොරොන්දුවක් වුණා. මේ දරුවා අසරණ කරන්න මට බෑ.

මමත් අම්මා කෙනෙක්.. මටත් දරුවෙක් ඉන්නවා... අනිත් එක ශාලින්ද එක්ක දැන් මට හිත හදාගෙන එකට ගමනක් යන්න බෑ.."

"නංගි... ඔයා ඉගෙන ගත්ත ළමයෙක්. මේ දේවල් වෙන හැටි අපට වඩා හොඳට ඔයා දන්නවා... මේ ආකාශ්ගේ දරුවා නිසා ඔයා ශාලින්දගෙන් වෙන් වුණොත් අනාථයෙක් වෙන්නේ ඔයාගේ දරුවා නංගි.."

"මං දන්නවා අයියා කියන දේ... මං මගේ දරුවාව ඉල්ලනවා. සමහර විට දරුවා ශාලින්ද ගනියි. ඒත් මගේ දරුවට නැති වෙන්නේ මාව විතරයි. එයාට එයාගේ තාත්තා.. ආච්චිලා සීයලා මාමලා ඔක්කොම ඉදියි... ශාලින්ද තව කසාදයක් කරගනියි. ඒත් අනුජ්? එයාට මාත් නැති වුණොත් කවුරුත්ම නැති වෙනවා අයියේ..."

"මට තේරෙනවා නංගී... ඒත්.."

"අනිත් එක අයියේ මං මගේ පුතාව මං ළඟට ගත්තා කියමුකෝ.. කවදා හරි දවසක මේ දෙන්නම ඇත්ත දැනගනියි. අන්න එදාට අනුජ් මට ආදරේ කරද්දී මගේ දරුවා මට වෛර කරයි... අනුජ් නිසා එයාට එයාගේ තාත්තා.. ආච්චිලා සීයලා නෑදැයෝ සේරම නැති කළා කියලා."

"ඔය කවුරු හිටියත් දරුවෙක්ට අම්මා නැති වෙලා වැඩක් තියෙනවද?" ගෙතුළට වී දෙදෙනාගේ කතාව අසාගෙන සිටි මධූ ඇසුවේ සරසිගේ උරහිස මතින් අතක් තබාගෙනය.

"ශාලින්ද පුතාට හරි ආදරෙයි. එයා පුතාට අම්මා කෙනෙක් නැති අඩුව දැනෙන්න දෙන එකක් නෑ." සරසි ගෙතුළට ගියේ කඳුළක් පිස දමා ගනිමිනි. කෙසේ කීවද අම්මා කෙනෙකුට තමන්ගේ දරුවා එසේ අතහැර දමන්නට බැරිය.

සරසිද තම දරුවා වෙනුවෙන් බොහෝ දුක් වූවාය. නමුත් මේ මොහොතේ තමාව වඩාත්ම අවැසි අනුජ්ට බව ඇය දැන උන්නාය.

***************

මධූ කතාව නතර කරන විට අනුජ් උන්නේ දෙව්මිට වාරු වී ඉකිබිඳිමිනි. මිතුරන් සියලු දෙනා ඔහු දෙස බලා උන්නේ අනුකම්පාවෙනි.

"අඩන්න එපා දරුවෝ... සාරා හිතපු විදිහටම ඒ දේවල් සිද්ධ වුණා.ශාලින්ද සාරාව ඩිවෝස කළා විතරක්

sinhalaebooks.com

නෙමෙයි.. පුතාවත් එයා ළඟට ගත්තා. මට අද වගේ මතකයි සාරා එදා ඔයාවත් තුරුළු කරන් හොදටම ඇඬුවා..”

“පව් දෙයියනේ..” නිම්නා කීවේ හූල්ලමිනි.

“අනුජ් පුතේ, එදා ඉදලා සාරා ඔයාව බලා ගත්තේ තනියම... ඔයාට කිරි ටික දුන්නේ සාරා... ඔයාව බලංගොඩ තියාගෙන හැදුවොත් ප්‍රශ්න ඇති වෙයි කියලා එයා සේරම දාලා ඈතකට යන්න තීරණය කළේ.

ආකාශ් අයියා නිදහස් වෙලා එනකම්ම.. අවුරුදු දහයක්... සාරා ඔයාව තනියම හදා ගත්තා. ඔයාට වචනෙකින් වරදක් කලේ නෑ... අඩුපාඩුවක් වෙන්න දුන්නෙත් නෑ. එයාට කරන්න බැරි වුණ එකම දේ අවුරුදු දහයක් යනකම් තාත්තාව ඔයාට ගෙනත් දෙන්න බැරි වුණ එක.”

අනුජ් මේ සියල්ලම අසා උන්නේ නිහඬවය. මේ කියන දේවල් එකක්වත් බොරු නොවන බව ඔහු දනී.

“දැන් සේරම අහගත්තා නේ. පුතාලා නිදා ගන්න. රෑ වෙලා..”

පසුදා උදෑසන සියලු දෙනාම සූදානම් වූයේ ආපසු රත්නපුරය බලා යන්නටය. සමු ගන්නා මොහොතේ මධූ අනුජ්ව පසෙකට කතා කර ගත්තාය.

"පුතා දැන් සේරම දේවල් දන්නවා... ඔයාම තීරණය කරන් කවුද හරි... කවුද වැරදි කියලා.. මගේ යාළුවා නිසා මං ඔයාලාට බොරු කිව්වා කියලා හිතන්න එපා... මොකද මං අදටත් හිතන්නේ... එදා ඔයාව බාර නොගත්තා නම් අදටත් සාරා ශාලින්දයි එයාලාගේ දරුවොයි එක්ක හොඳින් ජීවත් වෙනවා... එයා හැම දෙයක්ම ඔයා වෙනුවෙන් කැප කළා..." ඇය එපමණක් කියා ඔහුට සමුදුන්නාය.

ආපසු යන ගමනේදී මිතුරන් විවිධ දේවල් ගැන කතා බහ කළද අනුජ් ඔවුන්ගේ කතාවලට සම්බන්ධ නොවූවේය. ඔහු උන්නේ වෙනම කල්පනාවකය. එයට මිතුරන් කිසිවෙක් බාධා කරන්නට නොගියෝය.

වාහනය පදවාගෙන ආ තනුක අනුජ්ලාගේ නිවස ඉදිරිපිට වාහනය නවතා පසුපස හැරී බලන විටත් අනුජ් උන්නේ කල්පනාවේය.

"අනුජ්... දැන් ඇති ඔය කල්පනා කලා. ඔන්න අපි ගෙදර ආවා.." ඔහු අසලම අසුන්ගෙන සිටි නිම්නා ඔහුගේ සුරත මත අත තබමින් කීවාය.

"ම්... මං එහෙනම් බහිනවා. මාත් එක්ක මේ ගමන යන්න ආවට ඔයාලාට ගොඩක් තැන්ක්ස්... මං එහෙනම් රෑ වෙලා කෝල් එකක් දෙන්නම්.."

කියූ අනුජ් වාහනයෙන් බැස සිය බෑගයද ගෙන ගේට්ටුවෙන් ඇතුළුවන තුරුම මිතුරන් ඔහු දෙස බලා සිටියෝය.

"ඒ කතාව ඇහුවට පස්සේ අනුජ් ෂොක් වෙලා වගේ ඉන්නේ.."

"ඔව් බං දර්ශී. මාත් ඌට ඔහේ ඉන්න දුන්නේ ඒකයි. අනුජ් ටික කාලයක් අරන් කල්පනා කරපුවාවේ.. මට වුණත් ඒ අහපු දේවල් හරි පුදුමයි.." තනුක වාහනය හරවා ගන්නා අතරේ කීවේය.

"ඔව් ඔව්... අනුජ් කල්පනා කරලා ඉවර වෙනකම් අපිත් ටිකක් රෙස්ට් එකේ ඉමු.."

නිම්නා සුසුමක් හෙලා අසුනේ සුවපහසු ලෙස හේත්තු වෙද්දී ඉදිරිපස අසුන්වල සිටි දෙදෙනාම ඇය දෙස බැලුවේ පුදුමයෙනි.

"රෙස්ට් එකේ?"

"ඔව් ඉතිං... ඊට පස්සේ අපිට ආයෙත් ට්‍රිප් එකක් යන්න පුළුවන්නේ..."

"තව ට්‍රිප් එකක්! ඔයා ඒ ගමන කොහෙද නිම්නා යන්න ලෑස්ති වෙන්නේ?"

"මගේ ගමනක් නෙමෙයි බං."

"එහෙනම්?"

"මං කිව්වේ අපිට සාරා ඇන්ටිව හොයන්නත් යන්න වෙනවා."

"සාරා ඇන්ටිව? ඔයා හිතන්නේ අනුජ්.." දර්ශි කියාගෙන ආ දෙය මඟින් නවතා තනුක දෙස බැලුවාය.

"ඔව් බං. මට ඒක හොඳටම විශ්වාසයි... තව වැඩි දවසක් යන්න කලින් අනුජ් සාරා ඇන්ටිව හොයන්න යනවා." නිම්නා කීවේ දැඩි විශ්වාසයෙනි.

"ඔව් ඉතිං.. නිම්නා කියනවා නම් ඒකත් වෙන්න පුළුවන් තමයි."

දර්ශි කියද්දී තනුකත් නිම්නා දෙස බලා සිනාසුණේය.

"ඔය ඉතිං.. උඹලාට දෙයක් කියන්න බෑ නේ..."

"හරි හරි බං... තරහා ගන්න එපා. උඹ ඒ තරමට අනුජ් ගැන හිතන බව අපි දන්නවා.

"මං අහන්නේ අපි ඒ ගැන මීට වඩා ටිකක් අනුජ්ට ඇහෙව්වොත් නරකද?"

"අනේ නිකම් ඉන්න තනුක... ඒ ළමයා මුලින්ම මේ ප්‍රශ්නේ විසඳගෙන හිටපුදෙන්."

"හා... හා... මං නිකම් කිව්වේ... අනික මේ අනුජ් ඔය තරම් දෙයක් තේරුම් ගන්න බැරි තරම් බබෙක් නෙමෙයිනේ..."

"ඒක තමයි තනුක මාත් කියන්නේ... අනුජ් දන්නවා නිම්නා එයාට කැමති බව. මේකාගේ තියෙන ආඩම්බරකමට දන්නේ නැති ගානට ඉන්නවා..." දර්ශි කීවාය.

"හරි හරි... සේරටම කලින් සාරා ඇන්ටිගේ ප්‍රශ්නේ විසඳලා ඉමුකෝ..."

"ආහ්... මෙයා මුලින්ම නැන්දම්මාව අල්ල ගන්න යන්නේ.."

"අනේ මේ දර්ශී... ඔය විකාර කියවිල්ල නවත්තලා මාව ගෙදර ගිහින් දාපං බං.."

"අපෝ උඹව අපි තියා ගන්නේ නෑ... හිටපං තව ටික දුරයි.." තනුක කීවේ ඇයට ඇද කරමිනි.

# 22.

බලංගොඩ ගොස් පැමිණි දෙව්මි ඉන්දු අසලට වී සියලු විස්තර ඇයට කීවේ දින කිහිපයක් ගතවූ පසුය. පහුගිය දින කීපයේම ඇය සිතුවේ මේ ගැන අම්මාට කියනවාද? නැද්ද? කියාය. කෙසේ වෙතත් ඉන්දු ඒ විස්තරය අසා උන්නේ සතුටිනි.

"කොල්ලා එහෙනම් මං කියපු දේ ඇහුවා..." ඇය කීවේ කඳුලක් පිසලමිනි.

"අම්මා මොනවද කිව්වේ?"

"පුංචි ගෙදරින් ගිහින් කියලා දැන ගත්ත දවසේ මං ඒ දරුවට කිව්වා... බලංගොඩට ගිහින් ඇත්ත දැනගන්න කියලා."

"ඇත්තමද අම්මා.."

"හ්ම්.. දැන් බලන් යද්දී මෙයත් මට බොරු කියලා මල්ලි පස්සෙන් බලංගොඩ ගිහින්නේ.."

"සොරී අම්මා... බාප්පිත් මේ ගැන දන්නේ නැති නිසා මං ඔයාලාට කිව්වේ නැත්තේ... මල්ලී හොරෙන් ගියපු ගමනනේ.." දෙව්මි කීවේ අම්මාව වැළඳ ගනිමිනි.

"දැන් කමක් නෑ. ආයේ එහෙම ඔය වගේ වැඩ කරලා මට අහුවෙන්න එපා හරිද?" දෙව්මි සිනාසී හිස වැණුවේ "හා" කියන්නටය.

"චූටී... බාප්පාට කෝල් එකක් දෙන්න මල්ලිත් එක්ක අද රෑ කෑමට මෙහේ එන්න කියලා.."

"හරි අම්මා.." දෙනෙත් ඇමතුම ලබා ගැනීමට ගියේ සතුටින් උඩ පනිමිනි.

විනෝද ගමන ගොස් පැමිණි පසුත් අනුජ් සමඟ වෙනදා මෙන් සතුටින් සිටීමට ආකාශ්ට හිත හදා ගැනීමට නොහැකි වූවේය. ඉන්දුගේ පණිවිඩය අසාගෙන අනුජ් වෙත ගිය ආකාශ් ඔහුට සූදානම් වන ලෙස පවසා යන්නට හැරුණේය.

යළිත් නිවසට පැමිණි දවසේ සිටම තම පියා සමග වචනයක් කතා කිරීමට අනුජ් මඟ බලා උන්නේය.

"තාත්තා.."

"ම්.."

"මගෙත් එක්ක ඔහොම තරහා වෙලා ඉන්න එපා තාත්තා...මට ඉන්නේ ඔයා විතරයි.."

"මගේ තරහක් නෑ අනුජ්... ඔයා මගේ දරුවා. ඉතිං මං කොහොමද ඔයත් එක්ක තරහා වෙන්නේ?"

"එහෙනම් ඇයි තාත්තා මේ අපි දෙන්නාට දෙන්නා නාඳුනන පිටස්තරයෝ ගානට මේ ගෙදර ජීවත් වෙන්නේ?"

"මගෙන් වරදක් වෙන බව මං දන්නවා... පුළුවන් නම් ඒකට මට සමාව දෙන්න පුතා... ඔයාව දකින වාරයක් ගානේ මට මතක් වෙන්නේ ඔයාව මේ තත්ත්වෙට ගෙනාපු කෙනාව...එයා ඔයාව මේ තත්ත්වෙට ගේන්න විඳපු දුක...මං

නිසා මුළු ජීවිතෙන්ම කරපු කැප කිරීම... මේ හැම දේකම වැරදිකාරයා මම..”

“තාත්තා...”

“මං දන්නවා පුතා... ඔයා වෛරෙන් ඉන්නේ එයත් එක්ක. ඒත් මට විශ්වාසයි ඔයා දවසක පසුතැවෙයි. මේ දේවල් මෙහෙම වුණ එක ගැන. සමහර විට ඒ වෙද්දී ඔයා පරක්කු වැඩි වෙයි.”

“අපි මේ කතාව නවත්තමු තාත්තා.”

“හ්ම්... එහෙනම් ලෑස්ති වෙන්න යන්න. වැඩිපුර ඇඳුමක් දා ගන්න. ලොකු අම්මා කිව්වා අද එහේ නවතින්න කියලා.” කියූ ආකාශ් පහළට ආවේ කල්පනාබරවය.

‘සමාවෙන්න සාරා, පුතාට වෙනසක් කරන්න ඔයා වගේම මම කැමතිත් නෑ. ඒත් මගෙන් පුතාට වෙස්කම් වෙනවා... මට එයාව දකිද්දී මතක් වෙන්නේ ඔයාව... ඔයා නැතුව මෙතන පවුලක් කියලා දෙයක් නෑ සාරා.. ඉන්න තැනකින් ආයේ ඇවිල්ලා අපේ පවුල ආයේ හදන්න සාරා.. ඔයාට විතරයි එහෙම කරන්න පුළුවන්...”

රෑ කෑමෙන් පසු ආකාශ් තම සොහොයුරාත් සමඟ මිදුලට වී කතා කරමින් සිටියේ සරසි ගැනය. සරසිව සොයා ගන්නා ක්‍රමයක් ගැනය.

මේ අතරේ ඉන්දු උඩුමහලේ බැල්කනියට වී කතා කරමින් සිටි දියණියන් දෙදෙනා සහ අනුජ් වෙත ගියාය.

"පුතාට මං එදා කියපු කතාව ඇත්ත කියලා දැන් පිළිගන්නවා නේද?"

"ඔව් ලොකු අම්මේ.. මං නොදැන හිටපු ගොඩක් දේවල් මට බලංගොඩ ගියාට පස්සේ දැන ගන්න ලැබුණා."

"මේ දේවල් දැනගනත්... තාමත් ඔයාට හිතෙන්නේ ඔයා ගත්ත තීරණේ හරි කියලද පුතේ?"

"මට මොකුත් හිතා ගන්න බෑ ලොකු අම්මා. එක එක වෙලාවට එක එක ඒවා හිතෙනවා..,"

"මොනවද මල්ලිට හිතෙන්නේ?" මෙතෙක් නිහඬව සිටි දෙව්මි ඇසුවාය.

"මට වෙලාවකට හිතෙනවා දෝණි අක්කා... මේ දෙන්නා එකතු වෙලා ප්ලෑන් කරලා මගේ අම්මව මරලා.. ඒ දෙන්නට එකතු වෙන්න මාව හේතුවක් කර ගත්තද කියලා.."

"ඔයා මේ කරන්නේ කොච්චර බරපතල චෝදනාවක්ද කියලා දන්නවද අනුජ්...?" ඉන්දු ඇසුවේ තරමක කේන්තියෙනි.

"ඒ දෙන්නට කොහොම හරි එකතු වෙන්න වුවමනාව තිබ්බානම් ඒකට කසාඳ බැඳගෙන ළමයි හද හදා ඉන්නේ නෑ... අනිත් දේ තමයි ඔයා නොහිටියා නම් සාරාට අදඅ නාතයෙක් වගේ ගෙදරින් එළියට බහින්න වෙන්නේ නෑ. ඔයා හිටියේ නැත්තම් සාරා අදටත් ශාලින්දයි දරුවයි එක්ක සතුටින් ජීවත් වෙනවා..."

"මට සමා වෙන්න ලොකු අම්මා.. මගේ හිතට ආපු දේ කිව්වේ... අනික එයාගේ දරුවාවත් දාලා දික්කසාද වෙලා මං වෙනුවෙන් ආවා... අම්මා කෙනෙක්ට එහෙම තමන්ගේ දරුවා දාලා පිට දරුවෙක් වෙනුවෙන් එන්න

පුළුවන්ද? මං හිතන විදිහට එදා ඒ ආවේ ශාලින්දගේ වයිෆ්, ඒ දරුවාගේ අම්මා නෙමෙයි... ආකාශ්ට ආදරේ කරපු සාරා.."

"මල්ලී හිතන විදිහටත් කෙනෙක්ට හිතන්න පුළුවන්... ඒත් ඒ වෙලාවේ පුංචිට සිද්ධ වුණා ඔයාලා දෙන්නාගෙන් කෙනෙක් තෝර ගන්න. ඒ වෙලාවේ ඔයාට වැඩිපුරම එයාව ඕන වුණේ... මේක පුංචි සැහෙන්න හිතලා ගත්ත තීරණයක් මල්ලී... ඔයා හිතන්නේ ඒ මුළු පවුලමයි... දරුවයි කසාදෙයි දාලා එයා හරි සතුටින් ආවා කියලද?

ගෑණු කෙනෙක් ජීවිතේ ගන්න හීනෙකින්වත් බලාපොරොත්තු නොවෙන තීරණයක් මල්ලී ඩිවෝස් ඒක කියන්නේ... ඊට වැඩිය එයාලාට ලේසියි තනිකඩව ඉන්න එක... කරන්නම දෙයක් නැතුව අසරණ වුණ තැනකදියි දරුවෙක් ඉන්න අම්මා කෙනෙක් ඩිවෝස් එකක් ගැන හිතන්නේ.."

අම්මාත් අක්කාත් කී සියල්ල අසා සිටි දෙනෙති කතා කළේ අවසානයේය.

"මල්ලී.. තමන්ගේ මහත්තයා දරුවා අත ඇරලා ඔයා වෙනුවෙන් ඇවිල්ලා, දුක් මහන්සි වෙලා අවුරුදු 10ක්ම බාප්පාත් නැතුව තනියම ඔයාව ලොකු මහත් කළා... ඉගැන්නුවා... මේ ළඟක් වෙනකම් ඔයා එක්කම හිටිය... ඔයාට

වචනෙකින්වත් අඩුවක් නොකරපු සාරා පුංචිව වැරදි කාරයෙක් කරන්න ඔයා ඔච්චරටම දඟලනවා... එයාට වෛර කරනවා..

ඔයා නිකමට හිතුවද ඔයා වෙනුවෙන් එදා අතඇරලා ආපු දරුවා මේ ඇත්ත දැනගත්ත දවසට එයාගේ අම්මා ගැන මොනවා හිතයිද කියලා... ඒ ළමයා ඔයාට වඩා සිය දහස් ගුණයක් අම්මට වෛර කරයි.

පුංචිගේ බඩේ හැදුනට එයාට අම්මා කියන්න... එයා වගේ හොඳ කෙනෙක් එක්ක හැදෙන්න ඒ ළමයට පිං මදි වෙන්න ඇති... ඒත් ඔයා වාසනාවන්ත වුණා එ වගේ කෙනෙක්ගේ ළඟ හැදෙන්න... මං දන්නේ එච්චරයි..''

''අක්කලා දෙන්නා කියන්නේ ඇත්ත... පුතා එන්නකෝ මාත් එක්ක යන්න...''

ඉන්දු එතැනින් නැඟිට අනුජ් සමඟ ඔහුට නිදා ගැනීමට සූදානම් කර තිබූ කාමරය වෙත ගියාය. අනතුරුව එහි වූ කබඩ් එක තුළින් පැරණි දින පොතක් අතට ගෙන අනුජ් දෙසට හැරුණාය.

''මේක මට හම්බුණේ තාරුකාගේ බඩුත් එක්ක තිබිලා. මේ කබඩ් එකේ තියන හැමදේම තාරුකාගේ... අඩුම තරමේ ඔයාගේ තාත්තාවත් සරසිවත් දන්නේ නෑ මං ළඟ මේ දේවල් තියනවා කියලා...'' කියූ ඇය අනුජ් අසලින්ම ඇඳේ අසුන් ගත්තාය.

"අනුජ්.. මේක කියවලා බලන්න. අනිත් දේවලුත් බලන්න. මේ දේවල් ඔයාගේ අම්මාගේ. ඔයා කැමති තරම් වෙලා ගන්න. මං හෙට උදේම තාත්තාව යවන්නම්. හැබැයි හරි තීරණයක් නොගෙන ඔයාට මෙහෙන් යන්න දෙන්නේ නෑ... දැන් මේවා බලනවා නම් බලන්න.. නැත්තම් නිදාගෙන උදේම නැගිටලා බලන්න.."

ඉන්දු එසේ කියා අනුජ්ගේ හිසත් අතගාගෙනම කාමරයෙන් පිටතට පැමිනියේ තාරුකාගේ මතකයන් අතර අනුජ්ව තනි කරමිනි.

මේ දේවල් ඉන්දු ළඟ තබා ගත් බව දැන උන්නේ ඇයත් සංජීවත් පමණි. මෙවන් දිනයක් උදාවේවි යැයි සිහිනෙකින්වත් නොසිතුවත් ඒ දේවල් විසි කරන්නට ඇයට හිත දුන්නේ නැත.

ඇය පිටවී ගොසින් ටික වෙලාවකට පසු අනුජ් නැඟිට කාමරයේ දොර වසා දැමුවේය. අනතුරුව ඔහු අසල වූ මේසයට වාඩි වී තාරුකාගේ දිනපොත කියවන්නට වූවේය.

දින පොතක් කීවාට එහි මුල් පිටු සියල්ල තිබුනේ හිස්ව ය. ඇත්තටම කියනවා නම් එහි සටහන් තබා

තිබුණේ එකම එක දිනයකදී පමණි. එනමුත් එය ඉතා දිගු විස්තරයක් විය.

*මගේ පුතාට,*

*මං ඔයාගේ අම්මා පුතේ. තාරුකා. මෙච්චර කාලෙකට මේ පොතේ කිසිම දෙයක් ලියන්න මට තිබුණේ නෑ. ඒත් අද මට මහ අමුත්තක් දැනෙනවා මගේ පුතේ. මගේ ජීවිතේ ගොඩක් දේවල් ගැන මං අද ලියන්නම් කවදා හරි මගේ පුතාට කියවන්න.*

*සමහරවිට පුතාට මේක කවදාවත්ම කියවන්න ලැබෙන එකක් නෑ. ඒත් කවදා හරි මගේ පුතාට මේ කියවන්න ලැබුණොත් ඒ වෙද්දී මං ජීවත් වෙලා ඉන්න එකක් නෑ.*

# 23.

*මගේ පුතාට,*

*මං ඔයාගේ අම්මා පුතේ. තාරුකා. මෙච්චර කාලෙකට මේ පොතේ කිසිම දෙයක් ලියන්න මට තිබුණේ නෑ. ඒත් අද මට මහ අමුත්තක් දැනෙනවා මගේ පුතේ. මගේ ජීවිතේ ගොඩක් දේවල් ගැන මං අද ලියන්නම් කවදා හරි මගේ පුතාට කියවන්න.*

*සමහරවිට පුතාට මේක කවදාවත්ම කියවන්න ලැබෙන එකක් නෑ. ඒත් කවදා හරි මගේ පුතාට මේ කියවන්න ලැබුණොත් ඒ වෙද්දී මං ජීවත් වෙලා ඉන්න එකක් නෑ.*

*ආකාශ්, ඒ කියන්නේ පුතාගේ තාත්තාව මං අඳුර ගත්තේ දැන් අවුරුදු දෙකකට කලින්. තාත්තාගේ හොඳ යාළුවෙක් හිටියා. නම ශාලින්ද. එයා තමයි අපි දෙන්නාව මූණ ගැස්සුවේ. පුතේ, මං කාත් කවුරුත් නැති අනාථයෙක් විදිහට අනාථ නිවාසෙක හැදුණ කෙනෙක්.*

*එහෙව් මට ගාමන්ට් ෆැක්ට්‍රි එකක අයිතිකාරයෙක් වුණ ආකාශ්ගෙන් ප්‍රපෝසල් එකක් එද්දී මං*

පුදුම වුණා. හැමෝම කිව්වේ ඒක මගේ වාසනාව කියලා. මාත් ඇත්තටම ඒ ගැන සතුටු වුණා.

ආකාශ් හරි ඉක්මනට වෙඩින් එක ලෑස්ති කළා. සංජීව අයියයි ඉන්දු අක්කායි.... ඒ කියන්නේ ඔයාගේ ලොකු තාත්තයි ලොකු අම්මයි දෙන්නාත් හරිම හොඳ අය. එයාලාගේ දෝණි දෙව්මි. ඔයාගේ ලොකු අක්කී. හරි ෂෝක් කෙල්ල...

ඒත් මට පුදුම හිතුණ එක තැනක් තිබුණා. යාළුවෝ නෑදෑයෝ මදි නොකියන්න හිටපු ආකාශ්ට ඉස්සෙල්ලම අපේ වෙඩින් එක ගැන කියන්න ඕන වුනේ සරසිලාට. ඒ දවස්වල මං ඒකට හේතුවක් දන්නේ නෑ. ඒත් ඒ ආකාශ්ගේ හොඳ යාළුවෙක් වෙන්න ඇති කියලා මාත් ඒකට කැමති වුණා.

කැම්පස් එකේ හිටපු සරසි ගෙදර ආවේ අපි දෙන්නා එහේ ඉන්න අතරේ. එයා අපි දිහා බලලා හරි ලස්සනට හිනාවුණා. මට අද වගේ මතකයි. එයා බෑග් එක ගේ ඇතුලෙන් තියලා ආවට පස්සේ ආකාශ් මාව එයාට අඳුන්වලා දුන්නා. වෙඩින් එකත් කිව්වා. ඒ වෙලාවේ සරසිගේ මූනේ තිබ්බ හැඟීම් මට කියවගන්න බැරි වුණා. එයා හරි අමාරුවෙන් මූණට හිනාවක් මවා ගත්තා කියලා තේරුණත්, මං හිතුවේ ඒ ගමන් මහන්සියට කියලා.

අපි දිගටම වෙඩින් එකට මහන්සි වුණා. මං අහලා තිබුණ විදිහට සරසියි ආකාශුයි හොඳ යාළුවෝ. ඒත් පුදුමෙකට වගේ අපේ වෙඩින් එකේ කිසිම දේකට සරසි ආවේ නෑ. කොටින්ම කියනවා නම් වෙඩින් එක කියන්න ගිය දවසට පස්සේ මං එයාව දැක්කේ අපේ වෙඩින් එකේදි. වෙඩින් එකට ආවත් එයා අපි ළඟට ආවේ නෑ. මට පුදුම හිතුණා.

සරසි කියන්නේ හරි ලස්සන ගෑණු ළමයෙක්. ඒ වගේම එයා ගොඩක් හොඳ කෙනෙක් කියලත් මං අහලා තිබුණා... ඒත් මට මතකයි අපේ වෙඩින් එක දවසේ එයාගේ ඒ ලස්සන මූණේ ලොකු වේදනාවක් තිබුණා.

මං ඒ දවස්වල හිතන් හිටියේ ශාලින්දයි සරසියි අතර සම්බන්ධයක් තියනවා කියලා. ශාලින්දත් සරසි වටේම කැරකුණ නිසා මං හිතුවා ඒ දෙන්නාගේ මොකක් හරි ප්‍රශ්නයක් කියලා.

වෙඩින් එකෙන් පස්සේ ආකාශ් වැඩි කාලයක් හිටියේ ඔෆිස් එකේ. මං හිතුවා ඒ බිස්නස් කරන අයගේ හැටි කියලා. මං තනියම ගොඩක් වෙලාවට හිටියේ. ඒ වෙද්දී සරසි ජොබ් එකට ගිහින් තිබ්බෙත් නැති නිසා මං ඉන්දූ අක්කලාගේ ගෙදරත් ගිහින් යනවා සරසි එක්ක ටිකක් කතා කර කර ඉන්න. සරසි මට හරි ආදරෙන් සැලකුවා. හරියට එයාගෙම අක්කට වගේ... පුංචි කාලේ ඉඳලා අනාථයෙක් වගේ ජීවත් වුණ මට සරසි ළඟම නෑයෙක් වුණා.

ටික කාලයක් යද්දී සරසිගෙයි ශාලින්දගෙයි කසාදෙත් තීන්දු වුණා. ඇයි කියන්න හේතුවක් දන්නේ නැති වුණත් එදා ආකාශ් හැසිරුනේ හරි අමුතු විදිහට. මම කවදාවත් දැකලා තිබුණේ නෑ ආකාශ් බීලා ඉන්නවා. ඒ නිසාමද කොහෙද මට හොඳට මතකයි. එයා එයා හිටියේ කෙලින් හිට ගන්න බැරි තරම් බීලා. එයා ආවේ ගයාන් අයියා එක්ක. ගයාන් අයියා මට කිව්වේ බිස්නස් එකේ ප්‍රශ්නයක් නිසා ආකාශ් අවුලෙන් ඉන්නේ ඒ නිසා මොකුත් අහන්න කියන්න යන්න එපා කියලා... මාත් ඒ ගැන ආයේ හොයන්න ගියේ නෑ ඉතිං...

සරසිගේ වෙඩින් එක දවසේ ආකාශ් ලොකු වැඩක් දාගෙන තිබුණා. එයා වෙඩින් එකට ආවේ නෑ. මට ඒක පුදුමයක් වුණේ නෑ. මොකද ආකාශ්ට ඒ දවස්වල බිස්නස් එකේ ප්‍රශ්න ගොඩක් තියනවා කියපු නිසා. ඒත් පුතේ මං දැන් දන්නවා. එයා ඒ දවස මඟඇරියේ බිස්නස් වැඩකට නෙමෙයි කියලා. එයා එහෙම කළේ ඒ දේ දකින්න එයාට හයියක් නැති නිසා.

ඒ දෙන්නා කසාඳ බැඳලා ආවේ අපේ අල්ලපු ගෙදරට. මේ ගෙවල් දෙක යාළුවෝ දෙන්නා එකටමයි හදලා තිබ්බේ. එදා ඉඳලා මගෙයි සරසිගෙයි හිතවත්කම තවත් වැඩි වුණා. ඒත් ආකාශ් සරසිට මූණ දුන්නේ නෑ වගේම ශාලින්ද

එක්කත් වැඩි හිතවත් කමක් තිබුනේ නෑ. මං දැනන් හිටියේ නෑ ඒ ඇයි කියලා...

දවසක් මං අසනීප වුණා. එදා ආකාශ් ගෙදර හිටියේ නෑ. බැරිම තැන මං ගියේ සරසිව හොයාගෙන. එයාට එතකොට බබා ලැබෙන්න හිටියේ. ටිකක් ඇඟට අමාරු නිසා නිවාඩුවක් ගත්තා කියලා උදේ සරසි මට කිව්වා. එහෙම ඉන්න කෙනාට කරදර කරන්න හොඳ නැති වුණත් මට වෙන කරන්න දෙයක් තිබුණේ නෑ. එයාගේ අසනීප අමාරුකම් පැත්තකට දාලා එයා මාව ඉස්පිරිතාලෙට අරන් ගියා.

පැයකට විතර පස්සේ එයා මගේ ළඟට ආවේ හරි ලස්සනට හිනාවීගෙන. ඔයා මගේ බඩට ඇවිල්ලා කියල එයා මට කිව්වේ හරි සතුටින්. ඒත් පුතේ... මට ඒ වෙලාවේ දැණුනේ ලොකු බයක්. මොකද මං දන්නවා ආකාශ් මාව කසාද බැන්දට එයාගේ හිතේ මං ගැන ආදරයක් තිබුණේ නෑ. මං ගැන බැලුවා. මට සැලකුවා. ඒත් මට ආදරේ කළේ නෑ. එයාගේ මුළු ලෝකෙම වුනේ බිස්නස්... ඒ නිසා මට ඔයා ගැන ලොකු බයක් දැණුනා.

මං හැංගුවට මේ දේවල් සරසිට තේරිලා තිබුණා. එයා දවසක් ඇවිත් ආකාශ්ට හොඳටම දොස් කියලා තිබුණා. මාත් ඒක දැන ගත්තේ ළඟදී. කොහොම හරි ආකාශ් මං ගාවට

ඇවිත් එයාගෙන් වුණ වැරදි වලට මගෙන් සමාව ඉල්ලුවා. ඒ වගේම ඔයාටවත් මටවත් කිසිම වෙනසක් කරන්නේ නෑ කියලා මට පොරොන්දු වුණා.

මගේ පුතා බඩට ඇවිත් මාස තුන හතරකින් සරසිට ලස්සන පුතෙක් ලැබුණා. ශාලින්ද හිටියේ එයාට රටක් රාජ්ජයක් ලැබුණා වගේ. මාත් ගොඩක් වෙලාවට ඒ බබා එක්කමයි හිටියේ. ඒත් ඒ දවස්වල ආකාශ් හරියට වෙනස් වුණා. හැමදාම බොන්න පටන් ගත්තා. පුංචි දේටත් මට කෑ ගැහුවා. ඒ වෙද්දී ශාලින්දයි ආකාශුයි හිටියේ වැඩි හිත හොඳකින් නෙමෙයි කියලා නම් මම දැනන් හිටියා.

ටික ටික ඔයා එන දවස ලං වෙනවා. තාත්තා මට කෑ ගැහුවට ඔයාට ඕන කරන හැමදේම ගෙනල්ලා ඔයාගේ කාමරේ ලෑස්ති කරනවා දැන්මම. එයා ඔයාට හරි ආදරෙයි. මං ඒක දන්නවා.

කොහොම වුණත් මට ඊයේ රෑ අහන්න ලැබුණේ මං හීනෙකින්වත් බලාපොරොත්තු වුණ දෙයක් නෙවෙයි... ඒක අහපු වෙලාවේ ඉදලා මං කරන්න ඕන මොකක්ද කියලා මට හිතා ගන්න බෑ පුතේ... ඊයෙත් තාත්තා ගෙදර ආවේ හොඳටම බීලා. ඒක ඉතිං මට අමුතු දෙයක් නෙමෙයි. ඒත් වෙනදා වගේ නෙමෙයි. එයා පොඩි එකෙක් වගේ ඉකි ගගහා ඇඩුවා.

අපි දෙන්නා බැඳලා අවුරුදු 2ක් වුණත් මීට කලින් ඔයාගේ තාත්තා එහෙම අඩනවා මං දැකලා නෑ.. එයා කිව්වේ එකම දෙයයි.. "උඹ අපි දෙන්නවම රැවැට්ටුවා.. ළඟින් ඉඳගෙන අපි හැමෝගෙම ජීවිත විනාස කළා... පච්කාරයා.." කියලා..

මට තේරුම් ගන්න බැරි වුණා මොනවා ගැනද මේ කියන්නේ කියලා. මට අහන්න කෙනෙක් නෑ... මං රෑ නිදි නැතුව කල්පනා කලේ මේ මොනවද වෙන්නේ කියලා..

උදේ තාත්තා වෙනදා වගේම ඔෆිස් ගියා. මං කාමරේ අස් කරද්දී දැක්කේ ඇඳ ළඟ යතුරක් වැටිලා තියනවා. ඒක ආකාශ්ගේ ඔෆිස් ෆයිල් දාලා තිබුණ කබඩ් එකේ යතුර. හේතුවක් දන්නේ නැති වුණත් එයා මට ඒ කබඩ් එක කවදාවත් බලන්න දුන්නේ නෑ. ඒ නිසාම මට හිතුණා අද ඒක බලන්න.

කබඩ් එකේ ගොඩක් තිබුණේ ගාමන්ට් එකේ ෆයිල්ස්. ඒත් එක්කම එයාගේ ඩයරි වගේකුයි ෆොටෝ ඇල්බම් එකකුයි තිබුණා. මට කරන්න වෙන වැඩකුත් නැති එකේ මං එයාගේ ඩයරි සේරම කියෙව්වා. ඒවල තිබ්බ දේවල් ඔයා පිළිගන්න එකකුත් නෑ පුතේ..

ඔයාගේ තාත්තා ආදරේ කරලා තියෙන්නේ වෙන කාටවත් නෙමෙයි සරසිට... සරසි ගොඩක් පුංචි කාලේ

ඉඳලා තාත්තාට සරසි ආදරේ කරලා... තාත්තා ඒක දැනන් ඉඳලා... පස්සේ කාලෙක ඒ දෙන්නා අතර සම්බන්ධයක් ඇති වෙලා තියෙනවා. එයාලා ගොඩක් ආදරෙන් ඉඳලා...

ඒත් ශාලින්ද... සරසිගේ දැන් හස්බන්ඩ්... ඔයාගේ තාත්තාට කියලා තියනවා සරසි ඉගෙනගන ආවම එයාට ගැලපෙන කෙනෙක් ගෙදරින් කතා කරයි කියලා. සරසි ඒකට බෑ කියලා ආකාශ් එක්ක ආවොත් සරසිගේ හැමදේම එයාට නැති වෙයි කියලා... ඒ වගේම ආකාශ් අසනීප වුණ වෙලාවක ශාලින්ද ගත්ත මෙඩිකල් රිපෝට් එකක තිබිලා තියෙනවා ආකාශ්ගේ මොකක්ද අසනීපයක් ගැනත්... මේ ඔක්කොම දේවල් නිසා ආකාශ් එක්ක ආවොත් සරසිගේ ජීවිතේ විනාස වෙයි කියලා ශාලින්ද කියලා තියනවා...

ඒක අහලා ඔයාගේ තාත්තා ගොඩක් දුක් වෙලා පුතේ. හිතලා හිතලා... අන්තිමට ඕන දෙයක් වුණාවේ කියලා එයා මාව බඳින්න තීරණය කරලා.

එදා අපි වෙඩින් එක කියන්න යනකම්ම සරසි මේ කිසිම දෙයක් දැනන් ඉඳලා නෑ... දෙයියනේ ඒ කෙල්ලට මොනවා හිතෙන්න ඇතිද? අදටත් මේ වුණ කිසිම දේක අගක් මුලක් සරසි දන්නේ නෑ. ඔයාගේ තාත්තා එයාව නැතුව මාව බැන්දේ ඇයි කියලා එයා අදටත් දන්නේ නෑ....

තාත්තාගේ ඩයරි එක්ක තිබුණ ඇල්බම් එකේ තනිකරම තිබ්බේ සරසිගේ පින්තූර... මට අදහා ගන්න

බැරි වුණා පුතේ. මං දන්නවා තාත්තා මට ආදරේ කළේ නෑ... ඒත් ඒකට හේතුව මං අදයි දැන ගත්තේ..

කොහොම හරි... ඒ දේවල් සේරම වෙලා දැන් අවුරුදු දෙකක්.. සරසි මැරි කරලා දැන් දරුවෙකුත් ඉන්නවා... එතකොට ඊයේ රෑ එකපාරටම මොකද වුණේ කියලා මට දැනගන්න ඕන වුණා.. මං ඒක නිසා ගයාන් අයියට කෝල් කරලා පොඩ්ඩකට එන්න කිව්වා. ගයාන් කියන්නේ තාත්තාගේ හොඳම යාළුවා.

එයා ආවට පස්සේ මං දැනගත්ත දේවල් සේරම එයාට කියලා මං ඇහුවා ඊයේ මොකද වුණේ කියලා... මට දැන් හංගලා වැඩක් නෑ කියලා එයාට තේරුම් යන්න ඇති. මට ඇත්තම විස්තරේ එයා කිව්වා.. මං ඒක එයාගේ වචන වලින්ම ඔයාට කියන්නම්..

"ඔයා දැන් ගොඩක් දේවල් දන්න නිසා මං සේරම කියන්නම් තාරු. සාරා ආකාශ්ට මහ ගොඩක් ආදරේ කළා. අපි තුන් දෙනාම දැනන් හිටියා එයා කිසිම හේතුවක් නිසා ආකාශ්ව අතඅරින්නේ නෑ කියලා. ඒ නිසා ශාලින්දම තමයි කිව්වේ ආකාශ් වෙන කෙනෙක් ළඟට ගියොත් සාරා නංගි අමාරුවෙන් හරි හිත හදා ගනියි කියලා.

ආකාශ් මුලින් ඒකට කැමති වුනේ නෑ... පස්සේ ආකාශ්ගේ මෙඩිකල් රිපෝට් එක දැක්කට පස්සේ එයාටම

හිතුණා සරසිගේ ජීවිතෙන් අයින් වෙන්න නම් ඒක තමයි කරන්න ඕන කියලා. ඒක නිසා තමයි ආකාශ් ඔයාව මැරි කරන්න තීරණය කළේ. ඒත් එයා දුක් වුණා එයා එක්ක ඇවිල්ලා ඔයාට දුක් වෙන්න වෙයි කියලා. එයාගේ හිත හැදුවේ ශාලින්ද... ඒත් අදටත් ආකාශ් ඔයා ගැන දුක් වෙනවා.. වෙඩින් එකට පස්සේ දවසෙම ආකාශ් එයාගේ හැම දෙයක්ම ඔයාගේ නමට ලිව්වා නංගි... ඒ එයා නැති දවසක ඔයාට කවදාවත් අඩුවක් නොවෙන්න කියලා..

ඒ දේවල් වෙද්දී අපි දැනන් හිටියේ නෑ ශාලින්ද සාරා ගැන බලාපොරොත්තුවෙන් ඉන්නවා කියලා. ඒ දෙන්නාගේ කසාදේ දැන ගත්තම අපි හිතුවේ ඒක එයාලාගේ ගෙවල් වලින් කතා කරපු දෙයක් කියලා. ශාලින්ද අපිට කිව්වේ එහෙම. අපි දන්නවා සාරා ඒකට කැමති වුණේ අම්මලාට බෑ කියන්න බැරි නිසා. කොහොම වුණත් දැන් දරුවෙකුත් එක්ක එයා සතුටින් ජීවත් වෙනවා.

ඊයේ අපිට අහන්න ලැබුණේ වෙනස්ම කතාවක්. අපිට මේ දේවල් කිව්වේ ශාලින්දගේ යාළුවෙක්. ඌ මුල ඉඳලා ප්ලෑන් එකකට වැඩ කරලා තියෙන්නේ. මුලින් ආකාශ්ට හිතවත් වෙලා ටික ටික සාරාට හිතවත් වුණා. ආකාශ් සාරාගෙන් වෙන් වෙන්න ඕන කියන අදහස ආකාශ්ගේ ඔලුව දැම්මේ ශාලින්ද... ඒ උන් දෙන්නට තියෙන ආදරේකට නෙමෙයි නංගි... ඌට සාරාව අයිතිකර ගන්න ඕන නිසා... ඌ ඔයාව මාව ආකාශ්ව අපි හැමෝවම පාවිච්චි කළා... ඌ

ආකාශ්ගේ කියලා ගෙනාපු මෙඩිකල් රිපෝට් එකත් බොරු එකක්... පච්කාරයා... ජීවිත කීයක් විනාස කළාද..

නංගි, ආකාශ් ඊයේ බිව්වේ දරාගන්න බැරිම තැන... දැන් ඒ දේවල් සේරම වෙලා ඉවරයි. උන් දෙන්නා සතුටින් ජීවත් වෙනවා... එහෙව් එකේ ඔයාලා දෙන්නා දැන් ප්‍රශ්න ඇති කර ගන්න එපා... මං ආකාශ්ටත් මේ ටික කිව්වා... දැන් ඒ දේවල් අයිති අතීතෙට.."

තවත් ගොඩක් දේවල් කියලා ගයාන් අයියා ගියේ දැන් ටිකකට කලින්... මාව නිකම් පිච්චෙනවා වගේ පුතේ... මේ ගින්දරට නොදැනුවත්ව හරි මමත් හවුල් වෙලා... එදා අපි දෙන්නාගේ කසාදේ නොවුණා නම් ගොඩක් දේවල් මීට වඩා වෙනස් වෙන්න තිබ්බා.. මට සාරා ගැන හරි දුකයි.

එදා අදටත් හිතනවා ඇති ඇයි ආකාශ් එයාට එහෙම කළේ කියලා... එයාව ඒ විදිහට අතරමං කළාට එයා ඔයාගේ තාත්තාට වෛර කරනවා ඇති පුතේ.. සමහර විට එහෙම නැතුවත් ඇති. මොක සරසි කියන්නේ හරි උතුම් ගැහැණියෙක් පුතේ. එයාට ඕනතරම් අවස්ථාව තිබුනා මට මේ දේවල් කියන්න... මට රිද්දන්න.. මගේ ජීවිතේ විනාස කරන්න. ඒත් එයා මට කවදාවත් දුකක් දැනෙන්න දුන්නේ නෑ... එයාගේ ආදරේ එයාගෙන් වෙන් කරපු මට එයා සැලකුවේ එයාගෙම අක්කට වගේ...

මට එක දෙයක් කියන්න පුළුවන්... ඇත්ත දැන ගත්ත දවසට සරසි ශාලින්දගේ මූණවත් බලන එකක් නෑ. දරුවා නිසා ඉවසගෙන හිටියොත් ඇරෙන්න ඇත්ත දැන ගත්තට පස්සේ සරසි කීයටවත් ශාලින්දගේ වහල යට ඉන්නේ නෑ.. සමහරවිට එයා කවදාවත් මේ ඇත්ත දැනගන්න එකක් නෑ.

මේ සේරම මං මගේ පුතාට කිව්වේ හේතුවක් ඇතුව... මට අද උදේ ඉඳලම හරි අමුත්තක් දැනෙනවා. මගේ පුතේ, වැරදිලා හරි අම්මට මොනවා හරි වුණොත් අම්මා ඔයාව භාර දෙන්නේ වෙන කාටවත් නෙමෙයි... සරසිට. මට විශ්වාසයි මටත් වඩා හොඳට සරසි ඔයාව බලා ගන්නවා.

මං ජීවත් වෙලා හිටියත්.. ඔයා ලොකු වෙද්දී මිනිස්සු ඔයාට ගොඩක් දේවල් කියයි... ඔයාගේ තාත්තායි සරසියි ගැන. ඒ දේවල් කවදාවත් පිළිගන්න එපා පුතේ. සේරම බොරු. එයාලා කවදාවත් ඔයාටවත් මටවත් වරදක් කලේ නෑ. ඔයාට බයක් සැකක් නැතුව මං නැති දවසක ඔයාගේ අම්මා කියන තැන සරසිට දෙන්න පුළුවන්.

කලින් කිව්වා වගේ මේ දේවල් මං කියන්නේ හිතේ බයට. ඔයාව දාලා යන්න හිතාගෙන නෙමෙයි. බැරි වෙලා හරි මට ඔයා ළඟින් ඉන්න බැරි වුණොත් සරසි ඔයාට හොඳ අනාගතයක් හදලා දෙන බව මට විශ්වාසයි.

මගේ පුතා මේ දේවල් දැනගන්න දවසට කවදාවත් තාත්තාට වෛර කරන්න එපා. එයා අපිට වරදක් කරන්නේ නෑ. මං ඒක දන්නවා. ඔයා ලොකු වෙනකම් මං හිටියොත් මේ සේරම ඔයාට තේරුම් කරන්නම්... ඒත් මට ඉන්න බැරි වුණොත්තින් පුතා තාත්තා එක්ක සතුටින් ජීවත් වෙන්න.

මීට,

ඔයාගේ අම්මා.

තාරුකා.

# 24.

එක හුස්මට තාරුකාගේ ලිපිය කියවාගෙන ගිය අනුජ් හිස එසවූයේ කඳුළු පිරි දෙනෙතිනි. වෙලාව අලුයම තුනටත් කිට්ටුය. දිනපොත මේසය මතින් තැබූ අනුජ් පසෙක වූ අල්මාරිය අසලට ගියේය.

එහි එක් පසෙක වූයේ කාන්තා ඇඳුම් කිහිපයකි. 'මගේ අම්මාගේ ඇඳුම්..' තමාටම මුමුණාගත් අනුජ් එහි ඉහළින්ම වූ ගවුමක් දෝතට ගෙන සිප ගත්තේය.

අල්මාරියේ අනෙක් පස ඇති බිළිඳු ඇඳුම් තමා වෙනුවෙන් සූදානම් කල ඒවා බවට සැකයක් නැත.අනුජ් එවාද පිටතට ගෙන බැලුවේ හඩමිනි.

ඇඳුම්වලට යටින් වූ ඇල්බමය ඔහු දුටුවේ අවසානයට ය. අනුජ් එය රැගෙන ඇඳ මතින් වාඩි වූවේය. එහි මුලින්ම වූයේ ආකාශ්ගේත් තාරුකාගේත් විවාහයේ ඡායාරූප රැසකි. එහෙත් ඉන්පසුව එහි වූ එක පින්තූරයකවත් ආකාශ් නොසිටියේය. එම පින්තූරවල තාරුකා සමඟ සිටි රුව අඳුනා ගන්නට අනුජ්ට අපහසු වූයේ නැත.

වෙන කෙනෙකු නොව ඒ සරසිය. අම්මාටත් වඩා ආදරයෙන් තමාව බලාගන්නට අම්මා තමාව බාර දුන්

සරසිය. මිනීමරුවකු යැයි චෝදනා කර තමා නිවසින් පවා එලවා දැමූ ඇයය.

"මට සමාවෙන්න අම්මේ..." අනුජ් සරසිගේ පින්තූරය දෙස බලා මිමිණුවේය.

නින්දට ගියද අනුජ්ගේ නෙතට නම් නින්දක් නොවීය. හැමෝම කියනා ලෙසට කිසිම අඩුපාඩුවක් නොකර සියල්ලම අතහැර තමා වෙනුවෙන් ආ ඇයට එදා බැණ වැදුන අයුරු දෙනෙත් පියා ගනිද්දී ඔහුට මැවි මැවී පෙනෙන්නට විය.

තාත්තා කීවාක් මෙන් සිදු වූ කිසිවක් හරි හැටි නොදැන තමා එදා හැසිරුණ ආකාරය ගැන ඔහු රැය පහන් වන පැය කිහිපයට දහස්වාරයක් පසුතැවුණේය.

ආකාශ් උදෑසනින්ම පිටවී ගියද ඉන්දු අනුජ්ට කතා කරන්නට නොගියාය. ඔහු පෙරදා රැය පහන්වන තුරුම තාරුකාගේ දිනපොත කියවූ බවට සැකයක් නැත. දෙව්මි කුස්සියට ආවේ ඉන්දු අනුජ් ගැන කල්පනා කරමින් සිටිද්දීය.

"දෝණී... මල්ලි නැගිටලාද?"

"පාන්දර වෙනකම් ලයිට් දාලා තිබ්බා අම්මා.. එළිවෙන්න ළං වෙලා නිදා ගන්න ඇත්තේ."

"හ්ම්.." සදා නිමකල තේ කෝප්පය දෙව්මි අතට දුන් ඉන්දු දෙනෙතිගේත් අනුජ්ගේත් තේ කෝප්ප දෙක ගෙන උඩුමහලට ගියාය.

ඇය යද්දී අනුජ් අවදි වී උන්නේය. ඉන්දු ගොසින් ඔහු අසලම ඇදෙන් වාඩිවෙද්දී අනුජ් ඇයගේ උකුලෙන් හිස තබා ගත්තේය.

"ලොකු අම්මේ..." හැඬුම්බර හඬකින් ඔහු කතා කරද්දී ඉන්දුට ඔහු ගැන දැනුනේ දුකකි.

"පුතේ.."

"මට අම්මාගෙන් සමාව ගන්න ඕන ලොකු අම්මේ... අනේ මට අම්මව හොයලා දෙන්න.."

දවසක අනුජ් මෙසේ කියන බව ඉන්දු මුල සිටම දැන උන්නාය. ඇය අනුජ්ගේ හිස අතගෑවේ ආදරයෙනි.

"දැන් පුතාගේ හිතේ තිබුණ ප්‍රශ්න සේරම විසඳුණාද?"

"අම්මා පව් ලොකු අම්මේ. මං එයාට සලකපු විදිහ හරි නෑ... අනේ මගේ අම්මා අම්මට හරිම ආදරෙයි... මාව අම්මට බාර දෙනවා කියලා කලින්ම හිතන් ඉදලා..."

"ඔව් පුතා.. තාරු මැරෙන්න කලින් ඒක සාරාට කිව්වා. එයාගේ පුතාව හොඳට බලා ගන්න කිව්වා.."

"අනේ ලොකු අම්මේ... අපි අම්මව හොයමු.."

"හරි... අපි හොයමු. මේ තේ එක බොන්න ඉස්සෙල්ලම..."

"අමුතුවෙන් හොයන්න දෙයක් නෑ අම්මා. මං හිතන්නේ මධූ නැන්දි දන්නවා පුංචි ඉන්නේ කොහෙද කියලා..." දෙව්මි කීවේ කාමරයට එන අතරේය.

අනුජ් ඇය දෙස බැලුවේ පුදුමයෙනි. මධූ නැන්දා එවැන්නක් ඔවුන්ට නොකී බව විශ්වාසය.

"දෝණී?"

"ඔව් අම්මා... මධූ නැන්දි දන්නවා.."

"පුංචි ඉන්න තැන?"

"මට කිව්වේ නම් නෑ අම්මා ඒ ගැන. ඒත් මල්ලිලා එහේ යන්න කලින් දවසේ පුංචි ඉඳලා තියෙන්නේ මධූ නැන්දිගේ ගෙදර... මෙහේ වුණ දේවල් සේරම පුංචි මධූ නැන්දිට කියලා තියනවා... මල්ලිලා එහෙට යන්න පැය දෙක තුනකට කලින් තමයි පුංචි ගිහින් තියෙන්නේ.."

"මොකක්?" අනුජ් පුදුමයෙන් ඇදේ වාඩි වෙමින් කීවේය. ඔහු සිතා උන්නේ ඔවුන් කියන තුරුම මධූ මේ දේවල් නොදැන සිටි බවය.

"ලොකු අම්මේ... මං අදම බලංගොඩ යනවා.."

"පුතා... කලබල වෙන්න එපා. අපි මේක තාත්තාටත් කියලා එයත් එක්කම යමු."

"නැහැ ලොකු අම්මේ.. තාත්තාට දැන්ම මේවා කියන්න එපා.

"ඒත් මල්ලී.."

"අම්මා ගෙදරින් ගියේ මගේ කීමට දෝණී අක්කා. මට අම්මව හොයන්න තාත්තාගෙන් උදව් ඉල්ලන්න බෑ. මං එහෙම උදව් ඉල්ලන්නෙත් නෑ. මං කොහෙන්හරි අම්මාව හොයාගෙන ගෙදර එක්කන් එනවා. අන්න එදායින් පස්සේ ඒ දෙන්නාට කවදාවත් දුක් විඳින්න මං ඉඩ තියන්නේ නෑ. ඒ දෙන්නා දුක් වින්දා දැන් ඇති."

අනුජ් කීවේ ඇදෙන් නැගිටිමිනි. ඔහු එසේ කියද්දී දැණුන සතුට නිසාම දෙව්මි ඔහුව වැළඳ ගත්තේ ආදරයෙනි.

*************************

ඉන්දුත් දෙව්මිත් එක්ව මධූට දුරකතන ඇමතුමක් ලබා ගත්තේ අනුජ් යළිත් නිවසට ගිය පසුය.

"මධූ..."

"අනේ... ඉන්දු අක්කා.." ඇය කතා කළේ සතුටිනි.

"පුදුමයි අපිව මතක තිබ්බා."

"අනේ එහෙම නෑ අක්කේ.. මං කවදාවත් ඔයාලාව අමතක කරන්නේ නෑ. බොරුනම් දෝණිගෙන් අහන්න... මට එයාව අමතක වෙලා තිබ්බද කියලා.."

"දෝණි ඉතිං මටත් හොරෙන්නේ මලයාව හොයන්න බලංගොඩ ගියේ..."

"දෝණි අනුජ්ට හරිම ආදරෙයි. අනේ අක්කලාව බලන්නත් ආසයි මට."

"අපිත් වෙලාවක එන්නම්කෝ මධූ... ඒත් ඊට කලින් අපට ඔයාගෙන් ලොකු උදව්වක් ඕන.."

"ඒ මොකක්ද අක්කේ?"

"අපේ සාරා ඉන්න තැනක් දන්නවා නම් කියන්න නංගි..."

"අනේ අක්කේ මං..."

"මං දන්නවා. ඒකි ඔයාව පොරොන්දුකරවා ගන්න ඇති කාටවත් කියන්නේ නෑ කියලා. ඒත් නංගි හිතලා බලන්න.. අපි ඒ පවුල ආයෙත් එකතු කරන එක නේද කරන්න ඕන? අනුජ් දැන් ඇත්ත තේරුම් අරන් ඉන්නේ. වෙච්ච දේට එයා හරියට පසුතැවෙනවා... අනික සාරාට ඔහොම තනිවෙලා ජීවත් වෙන්න අරින්න මට හිත දෙන්නේ නෑ... අපිට පුළුවන් නේද ඒ පවුල ආයේ එකතු කරන්න?"

"මට තේරෙනවා අක්කා කියන දේ... පුතා සාරාව පිළිගන්න කැමති නම් දැන් ප්‍රශ්නයක් නෑ තමයි. ඒත් අක්කේ ඇත්තටම සාරා දැන් ඉන්න තැනක් මංවත් දන්නේ නැති එකයි ප්‍රශ්නේ.."

"ඒත් මධූ මේ සිද්ධියෙන් පස්සේ සාරා ඔයා ළඟට ආවා නේද?"

"ආවා... අනිත් සේරම දේවල් කිව්වා. ඒත් ඉන්න තැන ගැන වචනයක් කිව්වේ නෑ. සමහරවිට ඔයාලා මගෙන් දැනගනී කියලා වෙන්නත් ඇති."

"ඒකත් එහෙමද.."

ඉන්දු බරැති සුසුමක් හෙළුවේ දෙව්මි දෙසත් බලමිනි. මුල සිටම මේ කතාව අසා සිටි දෙව්මි ඒ මොහොතේ දුරකතනය අතට ගත්තාය.

"මධූ නැන්දි... මං දන්නවා පුංචි ආයෙත් දවසක ඔයාව බලන්න එයි..."

"ඔව් පුතේ... එයා එනවා කියලා තමයි ගියේ.."

"අනේ එහෙම වුනොත් තොරතුරක් දැනගෙන අපට කියනවා නේද?"

"ඔව් දෝණී අනිවාරෙන්ම මං කියන්නම්."

තවත් සුළු වෙලාවක් මධූ සමඟ කතා කරමින් සිටි දෙව්මි දුරකතනය තබා අම්මා දෙස බැලුවාය.

"මධූ අපට ඒ ගැන කියන එකක් නෑ දුව.. අපටම තමයි පුංචි ඉන්න තැනක් හොයාගන්න වෙන්නේ..."

"මටත් හිතෙනවා අම්මා... පුංචි ඉන්න තැන එයා නොදැන ඉන්න විදිහක් නෑ."

"ඒක තමයි."

"කමක් නෑ අම්මා. මං මේ ගැන මල්ලි එක්ක කතා කරලා බලන්නම්. එයාගේ යාළුවෝ ටිකත් ඉන්නවානේ. අපට හොයාගන්න බැරිවෙන එකක් නෑ.."

# 25.

අවන්හලට ඇතුළු වූ ගයාන් එහි කොනේම වූ මේසයක අසුන් ගත්තේය. මේ ඒ දිනවල ආකාශුත් සරසිත් නිතර ආ ගිය අවන්හලය. අද ගයාන් මෙහි ආවේ පෙරදා සරසි ලබා දුන් දුරකතන ඇමතුමක් නිසාය. ඇය කීවේ ඇයට ගයාන්ගෙන් උදව්වක් අවශ්‍ය බවය. ඔහුට ඒ කුමකුදැයි කියා සිතන්නට ඉඩක් ලැබුණේ නැත. සරසි පැමිණ ඔහු ඉදිරියෙන් අසුන් ගත්තාය.

"කොහොමද අයියේ?"

"සාරා..."

"මං දන්නවා... අයියා ආකාශ් එක්ක වගේම මාත් එක්කත් කතා කරන්න කැමති නැතුව ඇති. ඒත් මට මේ උදව්ව ඉල්ලන්න වෙන කෙනෙක් නෑ අයියේ.."

"මගේ හිතේ එහෙම දෙයක් නෑ නංගි. කරන්න පුළුවන් උදව්වක් නම් මං කරන්නම්."

"අයියේ... මං මගේ දරුවාව දාලා අනුජ් පුතා වෙනුවෙන් ආවා තමයි. ඒත් මගේ දරුවට මගෙන් වෙන්න ඕන යුතුකම් මං අමතක කලේ නෑ. අයියා හිතන්න එපා ඒ දරුවට වුණ අඩුපාඩුව මං සල්ලි වලින් මනින්න හදනවා කියලා. මං එයාට කරපු වැරැද්දට එයාට කවදාවත් මට සමාව දෙන්න බැරි වෙයි." සරසි කීවේ දෑසට නැඟුණු කඳුළක් පිසලමිනි.

"නංගි දැන් මොකක්ද කරන්න හිතන් ඉන්නේ?"

ගයාන් එසේ අසද්දී සරසි තම අත්බෑගයේ දමාගෙන සිටි බැංකු පොතක් ගෙන මේසය මතින් තැබුවාය.

"මේ පොත මං ඕපන් කළේ පුතා ඉපදිලා දවස් තුනකට පස්සේ.. මං එහෙන් එද්දි ආවේ මේකත් අරගෙන. පුතා ඉපදුන දවසේ ඉඳලා හැමදාම මං මගේ පඩියෙන් කොටසක් මේ පොතට දැම්මා... අනුජ්ට මගේ ආදරේ ලැබෙද්දී මට මගේ පුතා වෙනුවෙන් කරන්න පුළුවන් වුණේ එයාගේ අනාගතේට දෙයක් ඉතුරු කරන එක විතරයි. මේ පොතේ දැන් ලොකු ගානක් තියෙවා අයියේ.. මං මැරෙනකම්ම මගේ වියදම් ඇරුණම ඉතුරු සේරම මේ පොතට වැටෙන්න මං සේරම හදලා තියෙන්නේ..."

"එතකොට අනුජ්?" ගයාන් ඇසුවේ පුදුමයෙනි.

"මං අනුජ් වෙනුවෙන් ඉතිරි කළේ.. වියදම් කලේ ආකාශ්ගේ බිස්නස් වලින් ආපු සල්ලි... මං දන්නවා ආකාශ් කවදාවත් ඒ ගැන මට දොසක් තියන එකක් නෑ."

"දැන් නංගිට මගෙන් වෙන්න ඕන මොකක්ද?"

"දැන් පුතාට අවුරුදු විස්සක් වෙනවා අයියේ. මේ පොත එයාගේ නමට හරවලා එයා අතට දෙන්න ඕන අයියේ... මං අද එන ගමන් පුතාගේ නමට එකවුන්ට් එක හරවන්න අවශ්‍ය කරන සේරම බැංකුවට ගිහින් ලෑස්ති කරලා ආවේ. මං අත්සන් කරන්න තියෙන ලියවිලි සේරම අත්සන් කරලා බැංකුවේ මගේ යාළුවෙක් ළඟ තියලා තියෙනවා... අයියට පුළුවන් නේද මං වෙනුවෙන් පුතාව එක්කන් ගිහින් ඉතිරි වැඩ ටික කරලා දෙන්න..?"

සරසි ඇසුවේ ආයාචනාත්මකවය.

"මට කරන්න පුළුවන් නංගි. ඒත් ඇයි මේක නංගිම නොකරන්නේ?"

"පුතා මාව පිළිගනිද අයියේ? අඩු තරමේ එයා දන්නේවත් නෑ මං එයාගේ අම්මා කියලා. එහෙව් එකේ මං ගිහින් ලොකු ප්‍රශ්නයක් ඇති වෙයි. අනික ශාලින්ද මං ගැන දැන ගන්නවට මං කැමති නෑ අයියේ."

"මට තේරෙනවා සාරා... ශාලින්දව අපිට මුලින්ම තේරුම් ගන්න පුළුවන් වුනා නම් අද මේ දේවල් සේරම වෙනස් වෙන්න තිබුනා... එයා එයා වෙනුවෙන් ගත්ත තීරණ නිසා අද ජීවිත කීයක් නම් අවුල් වෙලා ගිහින්ද?"

"ඒවා සේරම අයිති අතීතෙට අයියේ.."

"ඒත් නංගි. මං මේක දුන්නම පුතා අහයි මේක දුන්නේ කවුද කියලා.."

"අනිවාරෙන්ම එයා අහයි. බැංකුවේ වැඩ ටික ඉවර වුනාට පස්සේ මේ ලියුම පුතාට දෙන්න. වැඩ ටික සේරම ඉවර වෙනකම් මේක එයා අතට දෙන්න එපා අයියේ.." බෑගයෙහි වූ ලියුම ගෙන ගයාන් අතේ තබා ඇය කීවාය.

"නංගි.. ඔයා දැන් මොකක්ද කරන්න හිතන් ඉන්නේ? මං දන්න විදිහට ආකාශ් ඔයාව හැමතැනම හොයනවා..."

"ඔව් අයියේ. මං ඒක දන්නවා... මට මේ පවුල් දෙකෙන් එකකටවත් අයිතියක් කියන්න බෑ. එක පවුලකට

මගෙන් ලොකු වැරැද්දක් වුනා... අනිත් පවුල මං මට පුළුවන් තරමින් ගොඩට අරන් දුන්නා... දැන් මට එයාලාගෙන් බලාපොරොත්තු වෙන්න කිසිම දෙයක් නෑ. ආකාශ් අයියා මාව හොයන්නේ මට තියෙන ආදරේ නිසා. ඒත් එයාව දැන් මට වඩා ඕන වෙන්නේ අනුජ්ට... මං දැන් මගේ ජීවිතේ ගැන තීරණයක් අරන් ඉන්නේ.."

"ඒ මොකක්ද?"

"අන්තිම වතාවට මගේ දරුවෝ දෙන්නාගේ මූණු බලා ගන්න මං මේ ඉන්නේ.. ඊට පස්සේ මං මේ රට දාලා යනවා. අවශ්‍ය දේවල් දැනටමත් මං ලෑස්ති කරලා තියෙන්නේ අයියේ..."

"ප්‍රශ්න වුණා තමයි. ඒත් ඇයි නංගි රට දාලා යන්න තීරණය කළේ? මං නම් කියන්න ඒක කරන්න එපා."

"මගේ දෙමව්පියෝ.. සහෝදරයෝ... නෑදෑයෝ ඉන්නවා. දරුවෝ දෙන්නෙක් ඉන්නවා. ඒත් ඒ කිසිම කෙනෙක් මට මගේ කියලා ළඟට ගන්න බෑ. මේ අවුරුදු හතළිස් ගානටම වුණේ එක් කෙනෙක් ළං වෙද්දී තව කෙනෙක් ඈත් වුණ එක. දැන් සේරමලා මගෙන් ඈත් වෙලා. මං ආයේ එයාලාට ලං වෙන්න උත්සහ කරන්නේ නෑ. මං ඈතකට යනවා

අයියේ. ඒක මගේ හිතට සැනසීමයි. ජීවිතේ අන්තිම කාලේ නිස්කලංකේ ගෙවලා දාන්න මට පුළුවන්.”

මෙසේ කියා සරසි ගයාන්ගෙන් සමුගෙන අවන්හලෙන් පිටවී ගියාය. ඇය යන දෙස ගයාන් බලා උන්නේ වේදනාවෙනි.

“අන්තිමේදි හැම කෙනාගෙම පව් ගියේ උඹේ පිටින් නංගියේ..” ඔහු තමාට පමණක් ඇසෙන ලෙස කියා ගත්තේය.

*****************

ගයාන්ව හමුවූ සරසි පසුව මධූගේ නිවසට ගියේ මේ දින කීපය ඇයත් සමඟ ගත කරන්නටය. තවමත් තමා විදේශගතවන බවක් මධූට නොකී සරසි බලා උන්නේ රෑ කෑමෙන් පසු ඇයට ඒ ගැන කියන්නටය.

මධූ කල්පනා කරමින් සිටියේ වෙන දෙයකි. අනුජ් සහ මිතුරන් මෙහි ආ බවක් ඇය සරසිට තවමත් නොකීවාය.

“මධූ...”

"ම්..."

"මොනවද ඔච්චර කල්පනා කරන්නේ?"

"මං මේ කල්පනා කලේ සාරා ඔයා තව කොච්චර කාලයක් මේ විදිහට තනියම ඉන්නද හිතං ඉන්නේ?"

" ඒ ගැන තීරණයක් අරන් තමයි මධූ මං අද ආවේ.."

"තීරණයක්! ඒ මොකක්ද?" මධූ ඇසුවේ මදක් විමතියෙනි. කීයටවත් සරසි නැවතත් ආකාශ්ගේ නිවසට යාවි යැයි සිතන්නට අපහසුය.

"මං රට යනවා මධූ."

"මොකක්?"

"ඔව් මධූ.. තව සතියකින් මං යනවා. සේරම දේවල් දැනටමත් ලෑස්ති කරලා තියෙන්නේ."

"සාරා... පිස්සු හැදීගෙන එනවද? මේ වැඩේ නම් කරන්න හිතන්නවත් එපා."

"සොරි මධූ.. මට මේ තීරණේ වෙනස් කරන්න බෑ. මං මේ දවස් ටික ඔයත් එක්ක මෙහේ ඉදලා යන්න හිතලා ආවේ... මට යන්න කලින් එකපාරක් මගේ දරුවෝ දෙන්නව බලලා යන්න ඕන."

"අනේ සාරා..." මධූට හැඬුම් වාවා ගැනීමට නොහැකි විය. ඇය සරසිව වැළඳගෙන හඬන්නට වූවාය. ඇයව සැනසීමට සරසිට බොහෝ දේවල් කියන්නට සිදුවිය.

අවසානයේ මධූ කඳුළු පිසදාගෙන සරසි දෙස එක එල්ලේම බැලුවාය.

"ඒකද අන්තිම තීරණේ?"

"ඔව් මධූ.. මට මේ දේවල් වලින් ඈත් වෙන්න ඕන දැන්."

"ඔය තීරණේ ගැන ඔයාට කවදා හරි පසුතැවෙන්න වුණොත්..?"

"එහෙම වෙන එකක් නෑ මධූ... හැමෝම වෙනුවෙන් මට කරන්න පුළුවන් තරම් දේවල් කරලා ඉවරයි දැන්..."

"හ්ම්... ඔයාගේ අන්තිම තීරණේ ඒක නම් මං ආයෙත් මොකුත් අහන්නේ නෑ. අපි යමු නිදා ගන්න." මධූ ගෙතුළට යන්නට නැඟිටිමින් කීවාය.

මධූ සිටින්නේ සිත් වේදනාවෙන් බව සරසි දනියි. මේ දින කිහිපයේ හැකි තරමින් ඇයගේ සිත හදන්නට සරසි සිතා ගත්තාය.

නින්දට ගියද මධූට නින්දක් වූයේ නැත. සරසි ගෙන ඇත්තේ දැඩි තීරණයකි. දැන් ඇයව වෙනස් කරන්නට නොහැකි බව මධූ හොඳින්ම දනියි. නමුත් ඇයට මෙලෙස යන්නට ඉඩ දිය නොහැකිය.

මේ ගැන ඉන්දු අක්කාට කියනවාද නැත්දැයි කියා මධූ උන්නේ දෙගිඩියාවෙනි.

# 26.

මේ වන විටත් සරසි නිවසින් පිටවී ගොස් මාස තුනක හතරකට වැඩිය. අනුජ් කල්පනා කරමින් සිටියේ ඇයව සොයා ගන්නා ක්‍රමයක් ගැනය. මධූ ගෙන්ද උදව්වක් ලැබේ යැයි සිතන්නට අපහසුය.

"මල්ලී.."

එක්වරම කාමරයට එබුණු දෙව්මිගේ හඬින් ඔහු තිගැස්සුණේය.

"දෝණි අක්කා... එනවා ඇහුණෙත් නෑ..."

"ඇහෙන්නේ කොහෙද ඉතිං... බර කල්පනාවකනේ... මං ඇවිල්ලා සේන අංකල්ගෙන් තේ එකකුත් බීලා මේ ඔයාව හොයන්න ආවේ.."

"අනේ මන්දා අක්කා... කොච්චර කල්පනා කළත් මට තාම උත්තරයක් ලැබුණේ නෑ."

"ඔයා දුක් වෙන්න එපා. අපිට ඉක්මනට හොඳ ආරංචියක් ලැබෙයි මල්ලී... කෝ බාප්පී?"

"ෆැක්ට්‍රි එකට ගියා මං හිතන්නේ... තාත්තා පව් අක්කා... මං මේ මොනවද කළේ..."

"ඔයාටම වරද පටව ගන්න එපා මල්ලී. දැන් ඒ දේවල් වෙලා ඉවරයි... අපිට වුණ දේවල් වෙනස් කරන්න බෑ.. අපි කොහොමහරි ඒ වැරැද්ද හදන්න උත්සහ කරමු.."

"හ්ම්..."

"මේ... මල්ලී..."

"අක්කා?"

"ඔයාගේ යාළුවෝ ටික ආවේ නැද්ද?"

"එයාලාටත් වැඩ අක්කා. තනුකයා හැමදාම හවසට කෝල් එකක් දෙනවා විස්තර අහලා... නිම්නා නම් ඊයෙත් ඇවිල්ලා ගියා."

නිම්නා ගැන කියද්දී දෙව්මිට නැඟුණේ අපූරු සිනහවකි. කොහොමත් නිම්නා අනුජ් කෙරෙහි විශේෂයක් දක්වන බව ඇය පසුගිය දින කීපයේම දුටුවාය.

“එයා කොහොමත් ස්පෙෂල් නේ?”

“මොනවද අක්කී කියන්නේ... එහෙම දෙයක් නෑ..”

“අනේ නිකං පලයං කොල්ලෝ යන්න.. ඔයාට නැතත් නිම්නාට නම් ඔයා ස්පෙෂල් වගේ..”

“මොන ස්පෙෂල්ද අක්කා... හැමදාම ඇවිල්ලා මට බැනලා බැනලා යනවා... පුදුම තරහක් තියෙන්නේ මා එක්ක...”

“ඒ මොකද?”

“අම්මාව ගෙදරින් යැව්වා කියලා මුල් දවස්වල දකින දකින තැන බැන්නා... දැන් බනිනවා අම්මාව හොයන්න මං උනන්දු වෙනවා මදි කියලා...”

"ඒ ඔයාගේ හොඳටනේ මල්ලී... නිම්නා හරි හොඳ ළමයෙක්... මං දන්නවා එයා මුල ඉඳලම මේක ඔයාට තේරුම් කරන්න උත්සහ කළා... ඔයා තේරුම් ගත්තේ නෑ... දැන් බනින එක හරි..."

"ආ... ඔයත් එයාගේ පැත්තේ නේද?"

"නැතුව. ඒ කෙල්ල මට කොච්චර උදව් කරනවද තමුසෙගේ මෝඩ වැඩ වලින් තමුසෙව බේර ගන්න."

"ඒ මොනවද?" අනුජ් ඇසුවේ පුදුමයෙනි. නමින් දැන උන්නද අක්කාත් නිම්නාත් අතර සමීප මිතුරුකමක් ඇති බව අනුජ් දැන උන්නේ නැත.

"ඔක්කොම දැන් කියන්න බෑ. හැබැයි එකක් කියන්නම්.. එදා ඔයාලා බලංගොඩ ගිහින් ඉන්නේ කොහෙද කියලා මං අහගත්තේ එයාගෙන්..."

"මේකි යකෝ... මොනවා වුණත් අක්කී... බැරි වෙලාවත් මං ඔය කෙල්ලව මැරි කළොත් මට වෙන්නේ

මැරෙනකම් බැනුම් අහ අහා ඉන්න...බොහෝ දුරට ගුටි කන්නත් වෙයි... එතකොට වරෙන් මාව බේර ගන්න.''

අනුජ්ගේ කතාවට දෙව්මිට සිනහව නවතාගත නොහැකි විය. ඒ කියන කතාවේද ඇත්තක් නැත්තේම නැත.

''මෝඩයා...''

දෙනෙති කාමරයට එබුණේ ඒ මොහොතේය. මෙතෙක් අනුජ් සිතා උන්නේ දෙව්මි තනිවම පැමිණෙන්නට ඇතැයි කියාය.

''චූටි අක්කී.. ඔයත් ඇවිල්ලානේ..''

''ඇවිල්ලා තමයි. කොහොමත් දෝණි අක්කි එක්ක හොර ගේම් ගහද්දී චූටි අක්කිව මතක නෑනේ..''

''ඔය බලන්නකෝ ඉතිං..''

''හරි හරි... අන්න අම්මා දෙන්නටම කතා කරනවා.. කෑම ලෑස්තියි කියලා.''

"මෙයාලා පවුල පිටින් ඇවිල්ලා... මං දන්නෙත් නෑ..." අනුජ් ඇදෙන් බසිමින් කීවේය.

"දකින්නේ කොහොමද කල්පනා ලොව මල් වනේ නේ..."

"අනේ මේ..."

"ආව් ආව්... මූණට ආපු හිනාව. මේකා මෙච්චර වෙලා කල්පනා කර කර ඉදලා තියෙන්නේ අර කෙල්ල ගැනද කොහෙද..."

"අක්කී..." අනුජ් ඇයව අල්ලා ගන්නට එද්දී දෙව්මි කෑ ගසාගෙන පහළට දිව්වාය. දෙනෙතිද ඔවුන් දෙදෙනා පසුපසින් ගියේ සිනාසෙමිනි.

ඉන්දු පහලට වී උන්නේ සියල්ල අසාගෙනය. දරුවන් මෙලෙස සිනා සෙන්නේ දින ගණනකට පසුවය.

'ඉන්න තැනකින් ආයේ එන්න නංගි... දරුවා අතින් වුණ වැරැද්ද හදා ගන්න එයා ලෑස්තියි... ඔයා මේ ගෙදරට ආවොත් දරුවන්ගේ සතුට හැමදාම තියේවි. එහෙම නොවුණොත් අනුජ් මුළු ජීවිත කාලෙම පසුතැවේවි.'

මිදුලේ බංකුවට වී කුමක් හෝ කියා සිනාසෙන දරුවන් තිදෙනා දෙස ඉන්දු බලා උන්නේය. අනුජ්ගේ මේ සිනහව දුටුවේ කාලයකට පසුය. ඔවුන් දෙසම බලා සිටි ඉන්දුගේ අවදානය ඉන් මිදුණේ දුරකතනය නාද වන හඬටය. තවත් මොහොතක් දරුවන් දෙස බලා සිටි ඇය දුරකතනය වෙත ගියාය.

“හෙලෝ....”

***********************

සරසි පිටත්ව යන්නට ඇත්තේ තවත් දින දෙකක් පමණි. ඇයත් මධූ උදේ ආහාරයෙන් පසු මිදුලේ වාඩි වී කතා කරමිනි සිටියෝය. මධූ තවත් සිතන්නේ සරසිව නවතා ගන්නටය.

“සාරා... බැරි වෙලාවත් ඔයා යන්න කලින් ආකාශ් අයියා ඔයාව හොයාගෙන ආවොත්... එතකොටත් මේ තීරණේ වෙනසක් නැති වෙයිද?”

"මධූ... අපි දැන් පොඩි ළමයි නෙමෙයි. මට අවුරුදු හතළිස් හයක්... ලොකු දරුවෝ දෙන්නෙක් ඉන්නවා මට. තරුණ කාලෙදි වගේ ආදරේ පස්සේ දුවන්න දැන් මට බෑ. එච්චර හයියක් මට දැන් නෑ..."

"මට තේරෙන්නේ නෑ සාරා ඔයා මේ කියන දේවල්... ඒත් මං කියනවට... තව එක පාරක් මේ ගත්ත තීරණේ ගැන හිතලා බලන්න."

"මධූ..."

"මං දන්නවා ගොඩක් දේවල් සිද්ධ වුනා තමයි. ඒත් මේ ගත්ත තීරණේ දරුණු වැඩි නැද්ද? ඔයා මේ දඬුවම් දෙන්න යන්නේ ඔයාටමයි. ඔය තරම් දුරකට ගිහින් තනි වෙන්න හදන්න එපා... දුරකට යන්න ඕන නම් මේ රටේම කොහෙට හරි යන්න. මට ඇවිත් බලලාවත් යන්න පුළුවන් එතකොට..."

"මේ අහන්න මධූ... මං දැන් මේ..."

සරසිට කියන්නට ගිය දේ කියා ගන්නට ඉඩක් ලැබුණේ නැත.

මිදුලේ ඔවුන්ට ඉදිරියෙන් වාහනයක් නතර විය. එය හඳුනා ගන්නට මධූටවත් සරසිටවත් අපහසු වූයේ නැත.

"දෝණී..." රියැදුරු අසුනේ සිට බසින දෙව්මි දෙස බලාගෙන සරසි මිමිණුවාය.

"පුංචි..."

දෙව්මි දුවගෙන පැමිණ සරසිව වැළඳ ගත්තාය. ඒත් සමඟම වාහනයෙන් බැසගත් දෙනෙතිද ඇය වෙත දුවගෙන ගියාය.

වාහනයෙන් බැසගත් ඉන්දු එතැනම සිට මේ දියණියන් දෙදෙනාගේත් පුංචිගේත් ආදරය දෙස බලා උන්නාය. මධූත් ඔවුන් දෙස බලා උන්නේ සිනාසෙමිනි.

සරසි දියණියන් දෙදෙනාව අත නොහැරම ඉන්දු දෙස බැලුවාය.

"අක්කේ.."

"අපි ඇතුළට ගිහින් කතා කරමු සාරා... එන්න අක්කේ.." මධූ ඔවුන්ව ගෙතුළට රැගෙන ගියාය.

අම්මාටත් පුංචිටත් කතා කරගන්නට ඉඩ දුන් දෙව්මි සහ දෙනෙති මධූ සමඟ ගෙතුළට යද්දී ඉන්දු සාලයේ නතර වූවාය.

"නංගි.."

"අක්කේ..."

"දැන් ඇති නංගි... අපි ආපහු ගෙදර යමු.."

"අනේ අක්කේ... මට ඒක නම් කරන්න බෑ.."

"සාරා... ඔයා හිතන්නේ ඔයා එහෙන් ආවට පස්සේ සේරම දේවල් හරි ගියා කියලද? නෑ... එහෙම වුණේ නෑ. ඒ ගෙදර දැන් පාළුවට ගිය සොහොන් පිටියක් වගේ. තාත්තයි පුතයි ගෙදර ඉන්නේ අඳුරන්නේ නැති ගානට... ආකාශ්ට පුතා ළඟට යන්න ඕන වුණත් යන්න බෑ. පුතාව දකින වාරයක් ගානේ එයාට මතක් වෙන්නේ ඔයා පුතාව බලා ගත්ත විදිහ... ඔයා නැතුව මේ කිසිම දෙයක් හරි තත්ත්වෙට ගන්න බෑ..."

“ඒත් මට ආපහු ගෙදර එන්න බෑ අක්කේ... පුතා මාව පිළි ගන්නේ නෑ. ඔය දේවල් හැමදාම ඔය විදිහට තියෙන එකක් නෑ අක්කේ. කාලයත් එක්ක සේරම හරියයි... ඒ දෙන්නට මං නැතුව සතුටින් ඉන්න පුළුවන් වෙයි.”

“දැන් සේරම වෙනස් වෙලා නංගි. පුතා දැන් ඇත්ත කතාව දන්නවා. ඒ දේවල් දැනගත්ත දවසේ ඉඳලා දරුවා පසුතැවෙනවා... ඔයාව හොයන්න මහන්සි වෙනවා..”

“මොනවා?” සරසිට දැනුනේ විමතියකි. ඇය සිතා උන්නේ ඇත්ත දැන ගත්තද අනුජ් තමාට සමාවක් නොදෙනු ඇතැයි කියාය.

“ඔව් සාරා. අද මේ ගමන එන්න හැදුවේ පුතා. ඒත් නංගිට මේ දේවල් කියන්න ඕන නිසයි මං කෙල්ලෝ දෙන්නා එක්ක ආවේ...”

“මං හිතුවේ නෑ පුතා මේවා තේරුම් ගනියි කියලා..”

ඒත් සමඟම මිදුලේ වාහනයක් නවත්වනු ඇසී දෙදෙනාම හැරී බැලුවෝය.

# 27.

"අම්මා..."

වාහනයෙන් බැස වේගයෙන් ගෙතුළට එන රුව දුටු සරසි හිඳ සිටි පුටුවෙන් නැඟිට්ටුනේ ඉබේටමය.

"අම්මා..."

අනුජ් සරසිව වැළඳගෙන හඬන්නට වූවේය. ඔහුට පසුපසින් ගෙට ඇතුළු වූ නිම්නාව සරසි දුටුවේ කඳුළු අතරිනි.

"අනේ මට සමාවෙන්න අම්මා...මට සමාව දෙන්න අම්මා..."

සරසි නිහඬවම අනුජ්ගේ හිස අතගෑවාය. දෙව්මි, දෙනෙති, නිම්නා, මධූ මෙන්ම ඉන්දුද ඔවුන් දෙස බලා සිටියේ කඳුළු පිරි ඇස් වලිනි.

"අම්මා මාත් එක්ක තරහා වෙලාද?"

"නෑ පුතා... මං කොහොමද මගේ පුතා එක්ක තරහා වෙන්නේ..." සරසි කීවේ අනුජ්ගේ කඳුළු පිරි මුහුණ අතගාමිනි.

"ඒකත් හරි එහෙනම්. අපි යමු බොන්න දෙයක් හදන්න..." මධූ සමඟ ඉන්දු කුස්සියට ගියාය.

සරසි ආපසු වාඩිවෙද්දී අනුජ් පොඩි දරුවෙකු මෙන් ඇය අසලටම වී වාඩි වූවේය. දෙව්මි ඇයට අනෙක් පසින් පැමිණ වාඩි වූවාය.

"අපි ගෙදර යමු අම්මා.."

"පුංචි එන එකක් නෑ මල්ලී..." දෙව්මි කීවාය.

"ඔව් මල්ලී... පුංචි අනිද්දාට රට යන්න ලෑස්ති වෙලාලු ඉන්නේ..."

"මොනවා..! ඇත්තද අම්මා?" අනුජ් සරසිව තමා වෙත හරවා ගනිමින් ඇසුවේය. ඇය හිස වැනුවේ 'ඔව්' කියන්නටය.

"නෑහෑ. අම්මා කොහේවත් යන්නේ නෑ. මං අම්මට එහෙම යන්න දෙන්නේ නෑ. අම්මා යනවා. හැබැයි වෙන කොහේවත් නෙමෙයි ගෙදර.." අනුජ් කීවේ දැඩි හඬිනි.

සරසි කිසිවක් නොකියා අනුජ් දෙසම බලා උන්නාය. සියල්ලන් විරුද්ධ වෙද්දී පුංචි අනුජ්ව තම දෝතට ගෙන නිවසින් පිටවී අයුරු සරසිට සිහි විය. තමාගේ පුතුත් අනුජුත් එක ළඟ ඇඳේ නිදිකරවා තැබූ අයුරු ඇයට මැවී පෙනුණි.

වැදුවේ එක් දරුවෙක්ය. හැදුවේ වෙනත් දරුවෙක්වය. නමුත් දෙදෙනාටම සිතේ ඇති ආදරයේ කිසිදා වෙනසක් නොකෙරූ බව සරසිට විශ්වාසය.

"අම්මා.." අනුජ් දෙස බලාගෙන තනිවම කල්පනා කල සරසි හැරී බැලුවේ නිම්නාගේ හඬටය.

"දුව.."

"අනුජ් හරිම වාසනාවන්තයි අම්මා... ඔයා වගේ අම්මා කෙනෙක් එයාට ලැබුණානේ... මට හැමදාම හිතෙනවා... මටත් ඒ වගේ අම්මා කෙනෙක් හිටියා නම් කියලා.." නිම්නා කීවේ දෑසට කඳුළු උනද්දීය.

නිම්නාගේ මව නිම්නාවත් පියාවත් තනිකර වෙනත් කසාදයක් කර ගත්තේ ඇය පුංචි දවස්වලමය. මේ බව සරසිද දැන උන්නාය.

නිම්නා අසලට ගිය සරසි ඇයගේ හිස අතගෑවේ ආදරයෙනි. දන්නා කාලයේ සිටම සරසිට අනුජ්ගේ මිතුරනුත් තමන්ගේම දරුවන් වගේය.

“මං ඔයාලාගෙත් අම්මා තමයි පුතේ... ඔයාලා හැමෝම මට වෙනසක් නෑ..”

****************

ආකාශ් නිවසට ආවේ රෑ දහයත් පසුවීය. විඩාබර මුහුණින් ගෙට යන්නට ආ ඔහු දොරකඩ සිටි රුව දැක එහෙම්ම ම නතර වූවේය.

“සාරා..!”

සරසි ඔහු වෙත ඇවිද ආවේ කඳුළු අතරින් සිනහවක් පාමිනි. ආකාශ් ඇයව දැඩිව වැළඳගත්තේ ඇය නැවතත් කොහේ හෝ යාවි යැයි බියෙන් වාගේය.

“ඔයා එහෙනම් ආයෙත් ආවා... මං ඔයාව කොයි තරම් හෙව්වද සාරා...”

"හරි නම් එන්නෙම නැතුව ඉන්න වටින්නේ... මොනවද මේ කරලා තියෙන්නේ... ආා? මං කියලා ගියේ මොනවද? පුතා එක්ක හොදින් ඉන්න කිව්වා නේද... ඒකද මේ කරන්නේ? එක ගෙදරක ඉන්න බොඩිම් කාරයෝ වගේ... පුතා තාම පොඩියි. ඔයා තේරුම් ගන්න ඕන නේද ඒ ළමයත් එක්ක කතාබහ කරලා ඉන්න... අනේ ඇත්තටම මේ තාත්තායි පුතයි හොඳයි එකට ඇඳලා කුඹුරක් හාන්න.."

සරසි කියාගෙන ගියේ ආකාශ්ට කිසිවක් කියන්නට ඉඩ නොතබමිනි.

"මල්ලී මේ... බලං ගියාම පුංචිත් නිම්නාට දෙවෙනි නෑ..." ගෙතුළට වී මේ කතාව අසා සිටි දෙව්මි කියද්දී අනුජ් මෙන්ම දෙනෙතිද සිනාසෙන්නට වූහ.

සරසිගේ කියවිල්ල අසාගෙන සිටි ආකාශ්ටද සිනහවක් නැඟුණේ ඉබේටමය.

"ඇයි දැන් මං හිනාවෙන්න දෙයක් කිව්වද?"

"මේ කට නම් ඉස්සර තිබ්බ කෝච්චියම තමයි... මට මතක් වුනේ අර දවසක් මං බනුරිට බනින්න ගියපු දවසේ මට බැන්න හැටි."

"ඒක නම් ඇත්ත. මෙයා වයසට ගියාට කට නම් ඒ විදිහමම තමයි."

මෙතෙක් ගෙතුළට වී සිටි මධූ පිටතට එමින් කීවාය.

"අප්පා... මෙන්න කට්ටියම මෙහෙට වෙලා... මොකද ගෙවල් තෙමෙනවද?"

ආකාශ් සිනාසෙමින් කීවේ ගෙතුළ සිටි පිරිස දැකය.

ආකාශ්ගේත් සරසිගේත් ඉදිරියට පැමිනි අනුජ් ඔවුන් දෙනොගේම අත් අල්ලාගෙන ඒ දෑත් එකතු කරමින් ඔවුන් දෙස බැලුවේය.

"අම්මේ.. තාත්තේ, මගෙන් වුණ වැරදි වලට මට සමාවෙන්න. ඒ වගේම මගේ අම්මා වෙනුවෙනුත් මට සමාවෙන්න... අදින් පස්සේ කිසිම හේතුවකට ඔය දෙන්නට වෙන් වෙලා ඉන්න මං ඉඩ තියන්නේ නෑ. ඔය දෙන්නා හැමදාම සතුටින් ඉන්න ඕන... මාවත් බලාගෙන."

අනුජ් කියා නිම වන විට සරසිත් ආකාශුත් එක්ව ඔහුව වැළඳ ගත්තෝය.

"එතකොට අපි දෙන්නා..." කියමින් එතැනට ආ දෙව්මිත් දෙනෙතිත් ඔවුන්ට එක් වූවේය..

***************

සරසි යළිත් පැමිණි පසු පාළුවට ගොස් තිබූ නිවස යළිත් පිරී ගියේය. පහුගිය දිනවල තිබූ නිහඩ බවද බිඳී ගියේය... මාස තුනහතරක් තිස්සේ කිසිම සැලකිල්ලක් නොකර අතහැර තිබූ නිවසත් ගෙවත්තත් නැවත යතා තත්ත්වයට ගන්නට සරසි වෙහෙස වූයේ තාත්තාතටත් පුතාටත් එකලෙස දොස් කියමිනි.

"දවසක් මං නැති වුණොත් ගෙදර අපායක් කරනවා දෙන්නාත් එක්ක..." ඇය බැන වදිද්දී පියාත් පුතාත් නිහඬවම ඇයව මඟ හැර යන්නේ සිනහව සඟවාගෙනය.

අනුජ් වෙනදාටත් වඩා ආදරයෙන් සරසිට සලකද්දී ආකාශ්ට දැනුනේ සැනසීමකි.

අද අම්මාත් පුතාත් කුස්සියට වී මොකක්දෝ කෑමක් හදන්නට සූදානම්ය. ආකාශ් ආලින්දයේ පුටුවකට බරවී පුවත්පතක් බලමින් උන්නේ හිතේ සැනසීමෙනි.

"එක්ස්කියුස් මී අංකල්.."

පුවත්පතින් දෑස් ඉවතට ගත් ආකාශ් දුටුවේ අනුජ්ගේම වයසේ යැයි කිව හැකි තරුණයෙකි. ඔහු අනුජ්ගේ මිතුරෙකු වන්නට ඇතැයි සිතූ ආකාශ් සිනහවක් පා පුටුවෙන් නැඟිට්ටේ පුවත්පත පසෙකින් තබමිනි.

"මෙහේ සරසි කියලා කෙනෙක් ඉන්නවද?"

ඔහුගේ පැනයෙන් ආකාශ් පුදුම වූවේය. ඔහු සොයන්නේ අනුජ්ව නොවේ. සරසිවය.

"සරසි!"

"ඔව්... සරසි නිම්නාදි බස්නායක. එයා මෙහේ නේද ඉන්නේ?"

"ඔව්. එයා මෙහේ තමයි ඉන්නේ.."

"මට ඔයාට ටිකක් කතා කරන්න පුළුවන්ද?"

"ඔහොම පොඩ්ඩක් වාඩි වෙලා ඉන්න පුතා."

එම තරුණයාට වාඩි වීමට අසුනක් පෙන්වූ ආකාශ් ගෙතුළට ගියේ සරසිව සොයාගෙනය.

sinhalaebooks.com

"සාරා.."

"ඇයි?"

"අන්න ඔයාව හොයාගෙන කවුද ළමයෙක් ඇවිල්ලා..."

"මාව හොයාගෙන? කවුද අනේ මාව හොයන් එන්නේ?"

"අනේ මන්දා. මාත් මීට කලින් දැකලා නෑ. ටිකක් ගිහින් බලමුකෝ.." කියූ ආකාශ් සරසිට ඉස්සර වන්නට ඉඩහැර ඇය පසුපසින්ම ආලින්දයට ගියේය.

# 28.

ආලින්දට පැමිණි සරසි එහි සිටි තරුණයා දැක පුදුම වූවාය. මීට පෙර අවසන් වරට ඔහුව දුටුවේ අනූජ්ගේ පාසලේ උත්සවයකදී ය. පුදුමයකි! අද ඔහු තමාව සොයාගෙන මෙහි පැමිණ තිබේ.

වාඩි වී සිටි තරුණයා සරසිව දැක එක්වරම නැඟී සිටියේය. වචනයක්වත් නොකී ඔහු ඇය දෙස බලා උන්නේ තෙත් වූ දෑසිනි. කුස්සියේ සිටි අනූජ්ද පිටතට ආවේ පැමිණියේ කවුදැයි බලන්නටය.

"අම්මා..." පැමිණ සිටි තරුණයා සරසිව ඇමතුවේය. සරසිගේ දෙනෙතින් කඳුළක් ගලා ගියේය. වසර විස්සකට පෙර අනූජ් වෙනුවෙන් ඇයට අතහරින්නට සිදු වූ දරුවා අද ඇයව සොයාගෙන ඇවිදින්ය.

"මගේ දරුවා..." සරසි තමාටම මුමුණා ගනිද්දී ඔහු පැමිණ සරසිව වැළඳ ගත්තේය. නිහඬවම ඔවුන් දෙස බලා සිටි ආකාශ්ට මේ තරුණයා කවුදැයි හඳුනාගැනීමට අපහසු වූයේ නැත.

"යොමාල් අයියා...?" පිටතට එද්දීම තම මව වැළඳගෙන හඬන යොමාල්ව දැක අනුජ් ඔහු දෙස බලා උන්නේ පුදුමයෙනි.

සරසිගෙන් ඈත් වූ යොමාල්ව සරසි අසල පුටුවක වාඩි කරවූවාය.

"අනේ ඇයි අම්මේ මාව දාලා ආවේ? ඔයාට මාවත් අරන් එන්න තිබ්බානේ.."

සරසි සුසුමක් හෙලා ඔහු අසලම අසුන් ගත්තාය.

"ඔයාව අරන් එන්න මටත් ඕන වුණා පුතේ. ඒත් ඔයාව නීතියෙන් අයිති වුණේ තාත්තාට... අනිත් එක එදා මං ඔයාව ගෙනාවා නම් ඔයා මට දොස් කියයි පුතේ... ඔයාගේ මුළු පවුලම මං ඔයාට නැති කළා කියලා... අනිත් එක මං දැනන් හිටියා තාත්තා ඔයාට මං නැති අඩුව දැනෙන්න දෙන්නේ නෑ කියලා...

මං තාත්තාගෙන් ඩිවෝස් වෙන්නත් කලින් ඉදලා දැන් ඔයාව බලා ගන්න අම්මා එක්ක තාත්තාගේ සම්බන්ධයක් තිබුණා. මං දැනන් හිටියා තාත්තා මගෙන් අයින් වුණාම ආයෙත් මැරි කරන බව."

සරසි කියද්දී එවැන්නක් නොදැන සිටි අනුජ් මෙන්ම ආකාශ්ද පුදුම වූවේය. එමෙන්ම තමා වෙනුවෙන්

අම්මාට අතහරින්නට සිදු වූ දරුවා යොමාල් බව අනුජ් මේ කතාවෙන් දැන ගත්තේය. ඔහු නිහඬවම ආකාශ් අසලට වී අම්මාත් යොමාලුත් දෙස බලා උන්නේය.

"මගේ ජීවිතේ ඔයා නැති අඩුව කවදාවත් පිරුණේ නෑ අම්මේ... ඔව්. මං දන්න කාලේ ඉඳලා මට අම්මා කෙනෙක් හිටියා. ඒත් එයාට බැරි වුණා මට අම්මා කෙනෙක් වෙන්න. අදටත් එයා කරන්නේ තාත්තාගේ සල්ලි වලින් විනෝද වෙන එක විතරයි.

පුංචි කාලේ ඉඳලා මට ලොකු අඩුවක් දැණුනා. මගේ අම්මා කවදාවත් ඉස්කෝලෙට ආවේ නෑ... මට කෑම එක හදා දුන්නේ නෑ... අඩුතරමේ මාත් එක්ක කතා කලේවත් නෑ. මගේ හැම දෙයක්ම කරලා මාත් එක්ක හිටියේ ගෙදර වැඩට හිටපු කෙනා... මට අම්මා කෙනෙක් හිටියේ නමට විතරයි. එයාට කවදාවත් මං ගැන ආදරයක් තිබ්බේ නෑ. එයාට බැරි වුණා අම්මේ ඔයා නැති අඩුව පුරවන්න.

මං ටිකක් ලොකු වුණාට පස්සේ දවසක් එයාගේ කටින්ම දැනගත්තා මං එයාගේ ළමයෙක් නෙමෙයි කියලා. මං දවසක් ලෙඩ වෙලා ඉද්දී එයා කිව්වා... "උඹේ අම්මා යන දිහාක උඹවත් අරන් ගියානම් මට මේ කිසි කරදරයක් නෑ" කියලා.

එදා ඉඳලා මං හෙව්වා මගේ අම්මා කවුද කියලා... එයාට මොකද වුණේ කියලා.. ගෙදර වැඩට හිටපු විමලා නැන්දා තමයි මට කිව්වේ මගේ අම්මා කවුද කියලා...

සිද්ධ වුණ හැමදෙයක්ම මං එයාගෙන් දැන ගත්තා. ඒ දේවල් දැනගත්තම මටත් හිතුණා අම්මා යන දිහාවක මාවත් එක්කන් ගියා නම් කියලා.."

සරසි දුක්බරව ඔහුගේ හිස අතගෑවාය. මේ කිසිවක් ඇය දැන උන්නේ නැත. ඇය සිතා උන්නේ දරුවා ශාලින්දත් ඇයත් සමඟ සතුටින් ජීවත් වනවා ඇතැයි කියාය.

"මට හරි ආස හිතුණා අම්මාව බලන්න. ඒත් මං දැනන් හිටියේ නෑ අම්මා කොහෙද ඉන්නේ කියලා. එහේ ඉස්කොලෙට ගියපු මාව පස්සේ මෙහේ ඉස්කෝලෙකට දාන්න ඕන වුණේ ඇයි කියලා මට තේරුණේ පස්සේ... තාත්තාට ඕන වුණේ මගෙයි අනුජ්ගෙයි අතර තරඟයක් ඇති කරන්න... අනුජ්ට වඩා හොඳ තැනකට මාව ගෙනිහින් අම්මට ඒක පෙන්නන්න."

ඔහු එය කීවේ පසෙකට වී සියල්ල අසා සිටින අනුජ් දෙසද බලාය.

"ඉස්කෝලෙදි මං දැනගත්තා අනුජ්ගේ අම්මා කියන්නේ මගේ අම්මා කියලා. මං ඒක දැනගත්තේ අම්මාගේ නමින්... එදා ඉඳලා මං අම්මා දිහා බලන් හිටියා. අම්මා අනුජ්ට කොයිතරම් ආදරෙන් සැලකුවද... අනුජ්ට තියා මටවත් අදහා ගන්න බැරුව ගියා මේ අනුජ්ගේ ඇත්තම අම්මා නෙමෙයි

කියලා. ඒ සේරම බලාගෙන මං දුක් වුණා මට අම්මාගේ ඒ ආදරේ නැතිවුණ එක ගැන...

ඇත්තමට මට අනුජ් ගැන ගොඩක් ඊරිසියා හිතුණා. මං අම්මා නැතුව දුක් විඳිද්දී අනුජ් මගේ අම්මාගේ ආදරේ ඕනවටත් වඩා ලබනවා මට බලන් ඉන්න බැරි වුණා. ඒ නිසයි මම අනුජ්ට එයාගේ අම්මා ගැන කිව්වේ.."

හේතුවක් දැන උන්නේ නැතුවට එදා ඒ කතාව අනුජ්ට කීවේ යොමාල් බව සරසි දැන උන්නාය. අවසානයේ ඇස සිතා ගත්තේ එය ශාලින්දගේ වුවමනාවට කළ දෙයක් වන්නට ඇතැයි කියාය.

"මං ඒක කිව්වට පස්සේ අනුජ් අම්මාගෙන් ඈත් වුණා. මං දන්නේ නැහැ අම්මේ ඇයි කියලා...ඒත් අම්මා මේ ගෙදරින් ගිය බව දැන ගත්තම මට මහ කුරිරු සතුටක් දැනුණේ... මට වුණ අසාධාරණේට වාඩුව මං ගත්තා කියලා හිතුවා.."

"පුතා..." සරසි කතා කළේ බිඳුණ හඬකිනි.

"මට සමාවෙන්න අම්මේ... මේ ළඟදි ගයාන් අංකල් ඇවිල්ලා මට ගමනක් යන්න කතා කළා. අම්මා ඒ ගැන දන්නවානේ... එදා අම්මාගේ ලියුම කියවද්දී මං තේරුම් ගත්තා

අම්මා අනුජ්ට විතරක් නෙමෙයි අදටත් මට ආදරෙයි කියලා... මාව තනි කරලා යන්න වුණ එක ගැන දුක් වෙනවා කියලා. ඒකයි අද මං මේ ගමන එන්න තීරණය කළේ... අම්මේ මං දැන් ලොකු ළමයෙක්... සල්ලි මට හම්බකරගන්න පුළුවන් වෙයි. ඒත් මට ඕන සල්ලි නෙමෙයි අම්මාගේ ආදරේ... මං අද ආවේ අම්මාගෙන් දෙයක් ඉල්ලන්න.."

"මොකක්ද පුතේ?"

"මට අවුරුදු විස්සක් තිස්සේ ඔයාව මඟ ඇරුණා අම්මේ... මට මගේ ජීවිතේ ඉතුරු කාලේ අම්මා ළඟින් ඉන්න දෙන්න අම්මේ..."

කියූ යොමාල් පසෙක හිඳ මේ සියල්ල අසා සිටි ආකාශ් සහ අනුජ් වෙත ගියේය.

"මං දන්නවා මගෙන් ඔයාලාට ලොකු වැරැද්දක් වුණේ. ඒකට මට සමාවෙන්න. මං ඔයාලාගෙන් ඉල්ලන්නේ... අද ඉඳන් මටත් මේ පවුලේ කෙනෙක් වෙන්න පුළුවන්ද? මල්ලී... අම්මාගේ ආදරේ අපි දෙන්නටම බෙදා ගන්න පුළුවන් නේද?"

යොමාල් එසේ අසද්දී ඉදිරියට ආ අනුජ් ඔහුව තදින් වැළඳගත්තේය.

"මට සමාවෙන්න අයියේ... මං නිසා අවුරුදු ගානක් ඔයාට ඔයාගේ අම්මාව නැති වුණා. ආයේ කවදාවත් එහෙම වෙන්නේ නෑ... අම්මා විතරක් නෙමෙයි අද ඉඳලා ඔයාට මේ මල්ලිත් ඉන්නවා.."

සරසි ආකාශ්ට ළංව දරුවන් දෙදෙනා දෙස බලා උන්නේ උතුරා යන සතුටිනි. අවසානයේ අද ඇයගේ පැතුම ඉටු වී තිබේ. අද ඇයගේ පුතුන් දෙනොම ඇය සමඟිනි.

**************

කාලය ගෙවී ගියේ ඔවුන්ගේ කැදැල්ල සතුටින් පුරවාලමිනි. වසර විස්සකට පසු අළුතින්ම ජීවිතය පටන්ගත් බව සරසිටත් ආකාශ්ටත් දැනුණි.

සරසි ළඟ නතරවූ යොමාල් ඉදහිට ශාලින්ද බැලීමටද ගියේය. ආකාශ් කිසිම වෙනසක් නැතිව තම වැඩිමහල් පුතාගේ තැන යොමාල්ට දුන්නේය.

"හැමදේම හිතුවටත් වඩා හොඳට විසඳුනා." සංජීව කීවේ ආලින්දයේ පුටුවකට බර වෙමිනි. ඉන්දුට ඔහු කී දේ පිළිගනිමින් හිස වැනුවාය.

"දැන් හරිනේ අක්කාටයි නංගිටයි... එක මල්ලිව බෙදාගන්න බැරුව රණ්ඩු වුණේ... දැන් දෙන්නාට මල්ලිලා දෙන්නෙක් ඉන්නවානේ."

ආකාශ් කීවේ දෙව්මි සහ දෙනෙති දෙස බලමිනි.

"ඔන්න එහෙනම් ලොකු මල්ලි මට... අනුජ්ව චූටි තියා ගන්න." දෙව්මි සිනාසී යොමාල් අසල වාඩි වී කියද්දී ඔහු අනුජ්ට ඇද කලේය.

"අයියට ලේසි වෙන්නේ නෑ ඔය නපුරු දෝණි එක්ක... මගේ චූටි අක්කි නම් හරි අහිංසකයි." අනුජ් කීවේ දෙව්මිව කේන්ති කරවන්නට සිතාගෙනමය.

"කවුද මෝඩයෝ නපුරු දෝණි.." දෙව්මි අනුජ්ට ගහන්නට යද්දී ඔහු මිදුලට දිව්වේ සියල්ලන් සිනා ගස්වමිනි.

නමුත් ගේට්ටුවේ ඇතුළට එන රුව දුටු අනුජ් දිවීම පසෙක තබා නතර වී ඇය දෙස බලා උන්නේ සිනාවකින් මුව සරසාගෙනය. දෙව්මි ඇයව දුටුවේ පසුවය.

"පුංචි මෙන්න ඔයාගේ පොඩි ලේලි එනවෝ..."

දෙව්මි කෑගසද්දී නිම්නා ලැජ්ජාවෙන් රතුවී ගියාය. ඇය ඉක්මනින්ම අනුජ්ට මුවා වූවේ සියලු දෙනාම එකවර තමා දෙස බලද්දීය.

සරසි, ආකාශ්, සංජීව සහ ඉන්දු දරුවන් දෙස බලා උන්නේ සැනසීමෙනි.මෙහෙම දවසක් එනතුරු ඔවුන් මෙතෙක් කාලයක් බලා සිටියෝය. අවසානයේ ඒ දිනය උදා විය. වසර ගණනාවක් තිස්සේ මේ ජීවිත වසාගෙන සිටි දුක්බර වැහි වලාකුළු ඉවතට පාවී ගොස් අළුතින් හිරු උදාවී ඔවුන්ගේ ජීවිත වලට ආලෝකය ලබා දී තිබේ.

නිමි.